SRI LANKA

# ආර්ථික විද්‍යාව
# Economics

3) නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හා විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන්

4) ජාතික ගිණුම්කරණය සහ රජයේ කාර්යභාරය

5) මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම්

6) අන්තර්ජාතික වෙළෙඳාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ

7) ආර්ථික වර්ධනය, සංවර්ධන හා ආර්ථිකයේ නව ප්‍රවණතා

# 03. නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හා විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන්

## නිෂ්පාදන ක්‍රියාවලිය
Production Process

නිෂ්පාදනය යනු ,කිසියම් වූ තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කරමින් නිෂ්පාදන සම්පත් නිමැවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය යි. භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කරන ඕනෑම දෙයක් නිෂ්පාදන සම්පත් ලෙස හඳුන්වන අතර, පරිවර්තන ක්‍රියාවලියේ බිහිවන භාණ්ඩ හා සේවා, නිෂ්පාදිතය ලෙස හැඳින් වේ.

## නිෂ්පාදන ශ්‍රිතය
**Production Function**

නිෂ්පාදන ක්‍රියාවලියක පවතින යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව නිෂ්පාදන ශ්‍රිතය නම් වේ

නිෂ්පාදන ශ්‍රිතය පහත පරිදි නිරූපණය කළ හැකි ය.

**නිමැවුම් මට්ටම** = $f$ **(යෙදවුම්)**

$$Q = f(K, L)$$

........................................................

........................................................

........................................................

........................................................

නිෂ්පාදන ශ්‍රිතය කාලයත් සමඟ වෙනස් හැසිරීම් රටාවක් ඉදිරිපත් කරන අතර, ඒ සඳහා බලපාන තාක්ෂණික හේතු කාලයෙන් කාලයට වෙනස් වේ.

# නිෂ්පාදන කාලය

.................................................................................................................................

.................................................................................................................................

නිෂ්පාදන කාලය යන්න නිශ්චිත ලිත් වර්ෂයකට හෝ ගිණුම් වර්ෂයකට හෝ දින දර්ශනයකට අනුව තීරණය වන්නක් නොවන අතර විවිධ නිෂ්පාදන ක්ෂේත්‍ර තුළ භාවිතකරන, යෙදවුම් හා තාක්‍ෂණය මත තීරණය වන්න කි.

තාක්ෂණය නො වෙනස්ව තිබිය දී මෙලෙස යෙදවුම් වෙනස් කිරීමට ආයතනයට ගත වන කාලය මත, නිෂ්පාදන කාලය ප්‍රධාන වශයෙන් අදියර දෙකකින් සමන්විත වේ.

1. දිගු කාලය
2. කෙටි කාලය

# කෙටි කාලය

**(Short Run)**

.................................................................................................................................

.................................................................................................................................

නැතහොත්,

අවම වශයෙන් එක් සාධකයක්වත් නො වෙනස් ව පවතින කාලපරිච්ඡේදය යි.

1. ස්ථාවර යෙදවුම්

   නිමැවුම් මට්ටම සමඟ ඍජුවම වෙනස් කළ නොහැකි යෙදවුම් ය. මේවා දැකිය හැක්කේ කෙටි කාලයේ දී පමණි.

   උදා : ගොඩනැඟිලි, යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා නිෂ්පාදන තාක්ෂණය.

   මේවා කෙටි කාලයේ දී පමණක් දක්නට ලැබේ.

2. විචල්‍ය යෙදවුම්

   නිමැවුම් මට්ටම සමඟ ඍජුවම වෙනස්වන යෙදවුම් ය.

   උදා : දෛනික ශ්‍රමය, අමුද්‍රව්‍ය, බලය

මේවා කෙටි කාලයේ දී මෙන් ම දිගු කාලයේ දී දක්නට ලැබේ.

## දිගු කාලය (Long Run)

කෙටි කාලයේ දී ස්ථාවරව පැවති සාධක ද වෙනස් කිරීමට ප්‍රමාණවත් වන කාලය දිගු කාලය යි. මෙහිදී තාක්ෂණය ස්ථාවරව පවතී.

නැතහොත්

තාක්ෂණය හැර සියලු ම සාධක වෙනස් කිරීමට ගතවන කාලය දිගු කාලය වේ.

## කෙටි කාලීන නිශ්පාදන ශ්‍රිතය හා දිගු කාලීන නිශ්පාදන ශ්‍රිතය

කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය යනු, කර්මාන්ත ශාලාවේ ධාරිතාව හා නිෂ්පාදන තාක්ෂණය නොවෙනස්ව තිබිය දී, විචල්‍ය යෙදවුම් පමණක් වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට, යෙදවුම් හා නිමවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව යි.

එය පහත පරිදි නිරූපණය කළ හැක.

……………………………………………………………………………………………………………

දිගු කාලයේ දී සියලු ම යෙදවුම් විචල්‍ය යෙදවුම් බවට පත්වන බැවින් නිමැවුම් මට්ටම හා විචල්‍ය යෙදවුම් අතර පවතින්නා වූ තාක්ෂණික සම්බන්ධතාව, දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය නම් වේ.

$$Q = f\ (V1, V2..... Vn)$$

$$Q = f\ (L, K)$$


## කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක හැසිරීම

.........................................................................................................................................

නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමඟ මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ ආන්තික හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යාම හීනවන ඵල නීතිය නම් වේ

කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ සංරෝදක පැවතීම එනම් ස්ථාවර යෙදවුම් පැවතීම මීට හේතුවයි.

## විශේෂ සටහන්



**මුළු ඵලදා වක්‍රය** (TP)

කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් නොවෙනස්ව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් පමණක් වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට එක්තරා මට්ටමක් දක්වා මුළු ඵලදාව වැඩිවන වේගයකින් ඉහළ යන අතර පසුව අඩුවන වේගයකින් ඉහළ ගොස් උපරිමයකට ළඟා වේ. තවදුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කිරීමට තීරණය කළහොත් මුළු ඵලදාව පහළ යනු දැකිය හැක.

**ආන්තික ඵලදාව වක්‍රය** (MP)

විචල්‍ය යෙදවුම් වැඩි කරන විට ආරම්භයේදී ආන්තික ඵලදාව වේගයෙන් ඉහළ ගොස් පසුව වේගයෙන් පහළ බැස ශුන්‍යට ලඟාවේ තවදුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කළහොත් ආන්තික ඵලදාව සෘණ වනු ඇත

**සාමාන්‍ය ඵලදාව වක්‍රය** (AP)

විචල්‍ය යෙදවුම් වැඩි කරන විට සාමාන්‍ය ඵලදාව ක්‍රමයෙන් ඉහළ ගොස් උපරිමයකට ළඟා වී තවදුරටත් විචල්‍ය යෙදවුම් වැඩි කිරීමේදී එය ක්‍රමයෙන් පහළ බසී. නමුත් කිසිවිටෙකත් සාමාන්‍ය ඵලදාව ශුන්‍ය හෝ සෘණ අගයක් නොගනී.

**මුළු ඵලදාව හා ආන්තික ඵලදාව අතර සම්බන්ධය** (TP & MP)

මුළු ඵලදා වක්‍රය වැඩිවන වේගයකින් ඉහළ යනුයේ ආන්තික ඵලදා වක්‍රය ඉහළ යන අවධියේදීය. ආන්තික ඵලදා වක්‍රය පහළ බසින විට දී පවා මුළු ඵලදා වක්‍රය අඩුවන වේගයකින් ඉහළ යයි. ආන්තික ඵලදාව ශුන්‍ය වන විට දී මුළු ඵලදා වක්‍රය උපරිම වන අතර ආන්තික ඵලදාව සෘණ අගයක් ගන්නා විට දී මුළු ඵලදාව පහළ බසී

**ආන්තික හා සාමාන්‍ය ඵලදාව අතර සම්බන්ධය** (MP & AP)

විචල්‍ය යෙදවුම් වැඩි කරන විට මුලදී , සාමාන්‍ය ඵලදාව වැඩිවන වේගයට වඩා වැඩි වේගයකින් ආන්තික ඵලදාව ඉහළ යන අතර සාමාන්‍ය ඵලදාව උපරිම අගයකට ළඟාවීමට පෙර ආන්තික ඵලදාව උපරිම වේ. ආන්තික ඵලදාව අඩු වන විට දී පවා සාමාන්‍ය ඵලදාව තවදුරටත් ඉහළ යන අතර සාමාන්‍ය ඵලදා වක්‍රයේ උපරිම ලක්ෂය හරහා ආන්තික ඵලදා වක්‍රය වේගයෙන් පහළ බසී.

**ඇයි මෙහෙම වෙන්නේ.....**

කෙටිකාලීන ඵලදා වක්‍ර වල මෙම හැසිරීමට හේතුව කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ පවතින සංරෝධකයි. එනම් ස්ථාවර යෙදවුම් පැවතීමයි.

**ඒ අනුව මෙලෙස**

කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් නොවෙනස්ව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් පමණක් වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට එක්තරා අවස්ථාවක ට පසුව විචල්‍ය යෙදවුමේ සාමාන්‍ය හා ආන්තික ඵලදාව පහළ බැසීම **හීනවන ඵල නීතිය** නම් වේ.

## දිගු නිෂ්පාදන ක්‍රියාවලියක හැසිරීම

දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක හැසිරීම පරිමාණානුකූල ඵල නීතිය මගින් විග්‍රහ කෙරේ.

ඒ අනුව දිගු කාලයේදී සියලු යෙදවුම් විචල්‍ය යෙදවුම් බවට පත් වන බැවින් , ආරම්භයේදී යෙදවුම් වැඩි කරන වේගයට වඩා වැඩි වේගයකින් ද පසුව යෙදවුම් වැඩි කරන වේගයට සමාන වේගයකින් ද ඉන් අනතුරුව යෙදවුම් වැඩි කරන වේගයට වඩා අඩු වේගයකින් ද නිමවුම වැඩිවන බව මෙමගින් විග්‍රහ කෙරේ.

ඒ අනුව දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දැකගත හැකි පරිමාණානුකූල ඵල ස්වරූප තුනකි.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

1 වැඩෙන පරිමාණානුකූල ඵල

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

2 ස්ථාවර පරිමාණානුකූල ඵල

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

3 අඩුවන පරිමාණානුකූල ඵල

දිගු කාලයේ දී සියලු යෙදවුම් වැඩි කළ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් නිමැවුම වර්ධනය වේ නම් එය අඩුවන පරිමාණානුකූල ඵල වේ.

| යෙදවුම් | | මුළු නිමවුම් | | අවස්ථාව |
|---|---|---|---|---|
| 10 | | 80 | | |
| | 100% | | 150% | වැඩෙන පරිමාණානුකූල ඵල |
| 20 | | 200 | | |
| | 50% | | 80% | |
| 30 | | 360 | | |
| | 33.33% | | 33.33% | ස්ථාවර පරිමාණානුකූල ඵල |
| 40 | | 480 | | |
| | 25% | | 25% | |
| 50 | | 600 | | |
| | 20% | | 15% | හීනවන පරිමාණානුකූල ඵල |
| 60 | | 690 | | |
| | 16.67% | | 10.14% | |
| 70 | | 760 | | |


## දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය

දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී සියලුම යෙදවුම් විචල්‍යය යෙදවුම් වේ. නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා බලපානු ලබන කිසිදු සාධකයක් දිගු කාලයේදී දක්නට නොලැබේ. ඒ අනුව දිගු කාලයේ දී සියලුම නිෂ්පාදන ආයතන වඩා නම්‍යශිලි තත්වයකට පත් වේ. එමෙන්ම තම නිෂ්පාදන ප්‍රමාණය කැමති පරිදි වෙනස් කර ගැනීමට ආයතන වලට හැකියාව ඇත.

දිගු කාලයේ දී නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණානුකූල නොපිරිමැසුම් බිහි වේ. පරිමාණානුකූල පිරිමැසුම් සහ නොපිරිමැසුම් යන දෙකම නොපවතින විට ස්ථාවර පරිමාණානුකූල ඵල හට ගනියි.

පිරිමැසුම් පවතින විට දී වැඩෙන පරිමාණානුකූල ඵලත් නොපිරිමැසුම් පවතින විට දී අඩුවන පරිමාණානුකූල ඵලත් හට ගනියි.

පරිමාණානුකූල පිරිමැසුම් වලට හා නොපිරිමැසුම් වලට මුහුණ දෙන නිෂ්පාදන ආයතනයක දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය ඉංග්‍රීසි යූ (U) අකුරක හැඩය ගනී.




පරිමාණානුකූල පිරිමැසුම් යනු දිගු කාලයේ දී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරීමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය පහළ බැසීමයි. ඒ අනුව ආයතනයේ ධාරිතාව පුළුල් කිරීමත් සමගම නිෂ්පාදන සාධක වල කාර්යක්ෂමතාව ඉහළ යෑමත්, නිෂ්පාදන යෙදවුම් වල මිල පහළ වැටීමත් නිසා අත්පත් කර ගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හැඳින්විය හැකිය.

පරිමාණානුකූල නොපිරිමැසුම් යනු දිගු කාලයේ දී ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරීමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය හෙවත් ඒකක පිරිවැය ඉහළ යාමයි. එනම් ආයතනයක ධාරිතාව පුළුල් කිරීමත් සමගම නිෂ්පාදන සාධකවල කාර්යක්ෂමතාව පහළ යෑම නිසා මූල්‍යමය වශයෙන් සිදු වන අලාභය යි.

පරිමාණානුකූල පිරිමැසුම් හෝ නොපිරිමැසුම් නොපවතින විටක ආයතනයේ දිගු කාලීන සාමාන්‍ය පිරිවැය ස්ථාවරව පවතින අතර එහිදී ස්ථාවර පරිමාණානුකූල ඵල හට ගනී.

# නිෂ්පාදන පිරිවැය

## Cost of Production


යම් කාර්යයක පිරිවැය එම කාර්යය වෙනුවෙන් මුදලින් ගෙවූ හෝ ගෙවීමට එකඟ වූ වටිනාකම මත හඳුනාගැනීමට හෝ ගණනය කිරීමට අප පුරුදුව සිටී. එහෙත් ආර්ථික විද්‍යාවේ දී නිෂ්පාදන පිරිවැය, යන්න මුදලින් ගෙවූ ප්‍රමාණයට පමණක් සීමා නොවේ. එබැවින් ආර්ථික විද්‍යාවේ දී පිරිවැය පහත පරිදි වඩාත් පුළුල් ලෙස නිර්වචනය කළ හැකි ය.

නිෂ්පාදන පිරිවැය යන්නෙන් අදහස් කරනුයේ, නිෂ්පාදන ක්‍රියාවලියේ දී කැපකරනු ලබන සියලු ම ආර්ථික සම්පත්වල ආවස්ථික පිරිවැය යි. මෙය ආර්ථික පිරිවැය / ආවස්ථික පිරිවැය යන නම්වලින් ද හැඳින් වේ.

නිෂ්පාදන පිරිවැය ප්‍රධාන පදනම් දෙකක් ඔස්සේ වර්ග කළ හැකි ය.

.............................................................................................................................

.............................................................................................................................



**නිමැවුම් මට්ටම සමඟ හැසිරීම අනුව නිෂ්පාදන පිරිවැය**

**මුළු ස්ථාවර පිරිවැය (TFC)**

මුළු ස්ථාවර පිරිවැය යනු නිමැවුම් මට්ටම සමඟ වෙනස් නොවන පිරිවැය යි. නැතහොත් ස්ථාවර යෙදවුම් සඳහා දරනු ලබන පිරිවැය යි.

**සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)**

සාමාන්‍ය ස්ථාවර පිරිවැය යනු, මුළු ස්ථාවර පිරිවැයෙන් එක් ඒකකයකට අදාළ වන ප්‍රමාණය යි. නැතහොත් නිමැවුම් ඒකකයක ස්ථාවර පිරිවැය වේ.

**මුළු විචල්‍ය පිරිවැය (TVC)**

මුළු විචල්‍ය පිරිවැය යනු නිමැවුම් මට්ටම සමඟ වෙනස් වන පිරිවැය යි.

නැතහොත්

සියලු ම විචල්‍ය යෙදවුම් සඳහා දරනු ලබන පිරිවැය යි.

**සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC**

සාමාන්‍ය විචල්‍ය පිරිවැය යනු, මුළු විචල්‍ය පිරිවැයෙන් නිමැවුම් ඒකකයක් සඳහා අදාළ වන ප්‍රමාණය යි. නැතහොත් නිමැවුම් ඒකකයක විචල්‍ය පිරිවැය යි

**මුළු පිරිවැය (TC)**

මුළු පිරිවැය යනු කිසියම් තාක්ෂණ මට්ටමක් හා සාධක මිල පද්ධතියක් යටතේ කිසියම් නිමැවුමක් නිපදවීමට යන මුළු වියදම වේ.


**සාමාන්‍ය මුළු පිරිවැය (ATC**

සාමාන්‍ය මුළු පිරිවැය යනු, මුළු පිරිවැයෙන් එක් ඒකකයකට අදාළ වන ප්‍රමාණය යි

### ආන්තික පිරිවැය (MC)

ආන්තික පිරිවැය යනු නිමැවුම එක් ඒකකයකින් වෙනස් කරන විට මුළු පිරිවැයේ සිදුවන වෙනස් වීම යි. නැතහොත් අමතර ඒකකයක් නිපදවීමට දරන පිරිවැය යි.

### ආයතනයක කෙටි කාලීන ආන්තික හා සාමාන්‍ය පිරිවැය වක්‍රවල හැසිරීම



**සම්පත්වල හිමිකාරිත්වය අනුව නිෂ්පාදන පිරිවැය**

සම්පත් හෙවත් යෙදවුම් ලබා ගන්නේ ආයතනය ඇතුළතින් ද? නැතිනම් බැහැරින් ද? යන්න මත නිෂ්පාදන පිරිවැය කොටස් දෙකකට බෙදේ.

.......................................................................................................................................

.......................................................................................................................................

## ඍජු පිරිවැය / මූල්‍ය පිරිවැය

*Direct Cost*

.......................................................................................................................................

.......................................................................................................................................

එනම්, ආයතනයක් පිටතින් මිල දී ගන්නා ලද සම්පත්වල ආවස්ථික පිරිවැය යි.

උදා : 
- සේවක වැටුප්
- අමුද්‍රව්‍ය මිලට ගැනීම්
- විදුලිය
- ජලය වැනි දෑ සඳහා කරනු ලබන ගෙවීම්
- ණය පොලී

## වක්‍ර පිරිවැය / ගම්‍ය පිරිවැය / ආරෝපිත පිරිවැය

Indirect Cost

.......................................................................................................................................

.......................................................................................................................................

උදා : 
- අභිමිවන පොලී ආදායම
- අභිමිවන වැටුප් ආදායම
- අභිමිවන බදු කුලී ආදායම
- ප්‍රාමාණික ලාභය
- ආර්ථික ක්ෂය වීම

# Practice Question

01 අසේල, පාසල් අභ්‍යාස පොත් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. එම ව්‍යාපාරයේ 2020 වර්ෂයට අදාළ ව පහත විස්තර සපයා ඇත.

| | |
|---|---|
| මුළු ප්‍රාග්ධනය (ණය ප්‍රාග්ධන 200,000) | රු. 600,000 |
| නිෂ්පාදනය කළ පොත් ගණන | ඒකක 10,000 |
| සේවක ගෙවීම් | රු. 150,000 |
| පොලී වියදම | රු. 30,000 |
| කඩදාසි සහ අනෙකුත් යෙදවුම් සඳහා | රු. 120,000 |
| බදු කුලිය හා රක්ෂණ ගෙවීම් | රු. 25,000 |

අතිරේක විස්තර :

1. අසේල තම ව්‍යවසායකත්ව සම්පත, විකල්ප ව්‍යාපාර ආයතනයකට යෙදවූයේ නම් රු. 125,000 ක ලාභයක් උපයා ගත හැකිව තිබුණි.
2. අසේල වසරකට අභ්‍යාස පොත් නිෂ්පාදනය සඳහා ප්‍රවේශ වීමට පෙර මුද්‍රණ කළමනාකරුවෙකු ලෙස මසකට රු. 15,000ක පමණ වැටුපක් ඉපැයී ය.
3. අභ්‍යාස පොතක වෙළෙඳ පොළ මිල රු. 75 ක් වේ.
4. බැංකු පොලී අනුපාතිකය 15% ක් වේ.

**ඉහත විස්තර අනුව පහත දෑ ගණනය කරන්න.**

අ. මූල්‍ය පිරිවැය හා ආරෝපිත පිරිවැය.

ආ. ආර්ථික පිරිවැය

ඇ. ගිණුම්කරණ ලාභය හා ආර්ථික ලාභය

# වෙළෙඳපොළ ව්‍යුහ

වෙළෙඳ පොළ ආර්ථිකයක් විවිධ වෙළෙඳ පොළ ව්‍යුහයන්ගෙන් සමන්විත වේ. වෙළෙඳපොළ ලක්ෂණිකයන්ගේ වෙනස්කම් මත ආර්ථික විද්‍යාඥයින් විසින් ප්‍රධාන වෙළෙඳ පොළ ව්‍යුහ හතරක් හඳුනා ගෙන ඇත. ඒවා නම්

………………………………………………………………………………………………………………

………………………………………………………………………………………………………………

………………………………………………………………………………………………………………

………………………………………………………………………………………………………………

## පූර්ණ තරඟය

පූර්ණ තරඟය යනු, සමජාතීය භාණ්ඩ අලෙවිකරනල භාණ්ඩයේ මිලට තනිව බලපෑමක් කළ නොහැකි ආයතන රාශියකින් සමන්විත අබාධ ප්‍රවේශයක් හා පිටවීමක් සහිත වෙළෙඳ පොළ ව්‍යුහය යි.

### පූර්ණ තරඟයට නිදසුන්

- ……………………………………………………………………
- ……………………………………………………………………
- ……………………………………………………………………
- ……………………………………………………………………

## පූර්ණ තරඟයේ ලක්ෂණ

………………………………………………………………………………………………………………

නිෂ්පාදිතය සමජාතීය වීම යන්නෙන් අදහස් කරනුයේ, වෙළෙඳ පොළක් තුළ සිටින සියලු ම ආයතන නිෂ්පාදනය කරනුයේ සෑම ලක්‍ෂණයකින් ම සමානවූත්, එකිනෙකට පූර්ණ ආදේශකවූත් භාණ්ඩ වීම යි.

………………………………………………………………………………………………………………

පූර්ණ තරඟකාරී වෙළෙඳ පොළක් ගැනුම්කරුවන් හා විකුනුම්කරුවන් විශාල සංඛ්‍යාවකින් සමන්විත වේ. මේ නිසා එක් අයෙක් වෙළෙඳ පොළේ සුළු කොටසක් නියෝජනය කරන බැවින් එක් ගැනුම්කරුවකුට හෝ විකුණුම්කරුවකුට මිල කෙරෙහි බලපෑමක් කළ නො හැක.

………………………………………………………………………………………………………………

කර්මාන්තයේ සිටින ආයතන වලට නිෂ්පාදන කටයුතු වලට පිවිසීමට හෝ ඉන් ඉවත් වීමට කිසිදු බාධාවක් නොමැති බව මින් අදහස් වේ.

**පූර්ණ දැනුම**
වෙළෙඳ පොළ තුළ කටයුතු කරන සෑම අයෙකුට ම වෙළෙඳ පොළේ සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇත.

**පූර්ණ සාධක සංචලතාවය**
පූර්ණ තරඟකාරී වෙළෙඳ පොළක් තුළ සම්පත් බාධාවකින් තොරව හුවමාරු කරගත හැකි වේ.

**පූර්ණතරඟකාරී ආයතනයක් මිල ගනුවෙකු** වේ.
මිල ගනුවෙකු යන්නෙන් අදහස් කරනුයේ, වෙළෙඳ පොළ කෙරෙහි කිසිඳු බලපෑමක් කළ නොහැකි, පවතින මිලට තමන් කැමති ප්‍රමාණයක් අලෙවි කරගත හැකි නිෂ්පාදන ආයතනය කි. මෙහි දී නිෂ්පාදකයෙකුට තනිව භාණ්ඩයේ මිල වෙනස්කළ නොහැකි අතර, වෙළෙඳ පොළ මිලට අනුව නිෂ්පාදකයාට හැඩ ගැසීමට සිදු වේ. මෙවැනි සැපයුම්කරුවෙකු **පැවරුණු මිලක් යටතේ කටයුතු කරන්නෙකු ලෙස ද හැඳින් වේ. මේ නිසා පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය තිරස් අක්ෂයට සමාන්තර සරල රේඛාවකි**

**දිගු කාලයේ දී සියලුම ආයතන ප්‍රාමාණික ලාභ පමණක් උපයයි.**

## ඒකාධිකාරය
සමස්ත වෙළෙඳ පොළටම එක් ආයතනයක් විසින් භාණ්ඩ අලෙවි කරනු ලබනල සමීප ආදේශක නොමැති සුවිශේෂී භාණ්ඩයක් සපයනු ලබන, ප්‍රවේශයට බාධා පවතින වෙළෙඳ පොළක් ඒකාධිකාරී වෙළෙඳ පොළක් ලෙස හැඳින්විය හැකි ය. ඒකාධිකාරී වෙළෙඳපොළම තනි ආයතනයක් විසින් පාලනය කරනු ලබයි.

**ඒකාධිකාරී වෙළෙඳ පොළවල් සඳහා නිදසුන්**

- ........................................................................
- ........................................................................
- ........................................................................
- ........................................................................

## ඒකාධිකාරී වෙළෙඳපොළක ලක්ෂණ

.........................................................................................................................

වෙළෙඳ පොළ තුළ සිටින්නේ එක් නිෂ්පාදන ආයතනයක් බැවින් කර්මාන්තය හා ආයතනය යන දෙක ම එකක් බවට පත් වේ. මේ නිසා තරගයක් දක්නට නො ලැබෙන අතර ඒකාධිකාරි බලයක් ක්‍රියාත්මක වේ

.........................................................................................................................

අදාල නිෂ්පාදිතය ලබාගත හැකි වන්නේ එක්ම නිෂ්පාදකයකු ගෙන් පමණක් වන අතර මෙමගින් වෙළඳපොල තුළ නිෂ්පාදකයාට ඒකාධිකාරී බලයක් හිමි වේ.

……………………………………………………………………………………………………………

ඒකාධිකාරය තුළ නව ආයතන වෙළෙඳ පොළට ප්‍රවේශ වීම වළක්වාලනු ලබන කෘතිම හෝ ස්වභාවික බාධා කිරීම් ප්‍රබලව ක්‍රියාත්මක වේ.

**වෙළෙඳ පොළ තොරතුරු අපූර්ණ වීම හා පිරිවැයකින් තොරව පහසුවෙන් ලබාගත නො හැක.**

## ඒකාධිකාරී තරඟය

ඒකාධිකාරී තරඟය යනු, සැපයුම්කරුවන් රාශියකින් සමන්විත වන, ප්‍රභේදිත භාණ්ඩ අලෙවි කරන, අබාධ පිවිසුමක් සහ පිටවුමක් පවතින වෙළෙඳ පොළ ව්‍යුහය යි

**ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳ පොළවල් සඳහා නිදසුන්**

- ………………………………………………………………
- ………………………………………………………………
- ………………………………………………………………
- ………………………………………………………………

## ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළක ලක්ෂණ

……………………………………………………………………………………………………………

ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳ පොළක් තුළ, පූර්ණ තරඟකාරී වෙළෙඳ පොළක තරම් නොවුන ද, සැලකිය යුතු තරම් විශාල ආයතන සංඛ්‍යාවක් සිටී.

……………………………………………………………………………………………………………

නිෂ්පාදිතය ප්‍රභේදිත වීම යනු, සෑම ආයතනයක් ම තමන් සපයන භාණ්ඩය අවශේෂ සැපයුම්කරුවන්ගෙන් වෙන්කොට, වෙනස් වූ භාණ්ඩයක් වශයෙන් වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම යි. මේ නිසා එක් එක් ආයතන නිපදවන භාණ්ඩ කිට්ටු ආදේශකයන් වන නමුත් ඒවා පූර්ණ ආදේශක නොවේ.

……………………………………………………………………………………………………………

ඒකාධිකාරී තරඟ කර්මාන්තයට ඇතුළු වීම හා ඉන් ඉවත්වීම පහසු වේ

**තොරතුරු අපූර්ණ වීම**

ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳ පොළක තොරතුරු පිරිවැයකින් තොරව පහසුවෙන් ලබාගත නොහැක.

**දිගු කාලයේ දී සියලුම ආයතන ප්‍රාමාණික ලාභ පමණක් උපයයි.**

## කතිපයාධිකාරය

කතිපයාධිකාරය යනු, මුළු වෙළෙඳ පොළ ම නිෂ්පාදකයන් අතළොස්සක් විසින් මෙහෙයවනු ලබන, ප්‍රභේදනය වූ හෝ ප්‍රභේදනය නොවූ භාණ්ඩ අලෙවි වන වෙළෙඳ පොළ ව්‍යුහය යි.

**කතිපයාධිකාරී වෙළෙඳ පොළවල් සඳහා නිදසුන්**

- ..................................................................
- ..................................................................
- ..................................................................
- ..................................................................

## කතිපයාධිකාරී වෙළෙඳ පොළක ලක්ෂණ

- ..........................................................................................................
- ..........................................................................................................
- ..........................................................................................................
- ආයතන අතර දැඩි අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතීම
- සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩයක් වීම
- මිල දැඩියාව
- තියුණු ප්‍රචාරණයක් පැවතීම
- ආයතන අතර සහයෝගීතාවය

## ආන්තික පිරිවැය, ආන්තික අයභාරය හා ලාභය උපරිම කිරීම
(Marginal Cost, Marginal Revenue and Profit Maximization)

### ආන්තික පිරිවැය

නිමවුම එක් ඒකකයකින් වැඩි කරන විට දී මුළු පිරිවැයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික පිරිවැය ලෙස හැඳින්වේ. මුළු පිරිවැයේ වෙනස නිමවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික පිරිවැය ලැබේ.

$$\text{ආන්තික පිරිවැය} = \frac{\text{මුළු පිරිවයේ වෙනස}}{\text{නිමවුමේ වෙනස}}$$

$$MC = \Delta TC / \Delta Q$$

## ආන්තික අයභාරය

නිමවුම එක් ඒකකයකින් වැඩි කරන විට දී මුළු අයභාරයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික අයභාරය ලෙස හැඳින්වේ. මුළු අයභාරයේ වෙනස නිමවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික අයභාරය ලැබේ.


| | | |
|---|---|---|
| ආන්තික අයභාරය | = | මුළු අයභාරයේ වෙනස / නිමවුමේ වෙනස |
| MR | = | ΔTR / ΔQ |

## ප්‍රශස්ත නිමවුම

යම් අවස්ථාවක ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන අවස්ථාව ප්‍රශස්ත නිමවුම ලෙස හැඳින්වේ.

| | | |
|---|---|---|
| ආන්තික පිරිවැය | = | ආන්තික අයභාරය |
| MR | = | MC |

ලාභ උපරිම කරන ප්‍රශස්ත නිමවුම් මට්ටම පහත ප්‍රස්තාරය මගින් පෙන්නුම් කළ හැකිය.




**පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් කෙටි කාලීන හැසිරීම තුළ මුහුණ දිය හැකි විකල්ප අවස්ථා කිහිපයකි.**

- ..............................................................................................................................................
..............................................................................................................................................
- ..............................................................................................................................................
- ..............................................................................................................................................
- ..............................................................................................................................................


## ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටීම (නිෂ්ප්‍රමාණික ලාභ/අතිප්‍රමාණික ලාභ)

පහත රූප සටහනට අනුව පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටින අවස්ථාවේදී මිල සාමාන්‍ය පිරිවැය ඉක්මවා යන අතර මුළු අයභාරය මුළු පිරිවැය ඉක්මවා යනු ඇත.





**ආර්ථික ලාභ ශුන්‍ය මට්ටමේ නිෂ්පාදනයේ යෙදීම (ප්‍රාමාණික ලාභ)**

පූර්ණ තරගකරී නිෂ්පාදන ආයතනයක් ප්‍රාමාණික ලාභ ලබන අවස්ථාවක දී මිල සාමාන්‍ය පිරිවැයට සමාන වන අතර මුළු අයභාරය ද මුළු පිරිවැයට සමාන වේ.




## අවප්‍රමාණික ලාභ

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනය භාණ්ඩ ඒකකයක සාමාන්‍ය පිරිවැය භාණ්ඩ ඒකකයක මිල ඉක්මවා යන අවස්ථාවේදී පාඩු ලැබීම සිදු වේ. මෙහිදී මුළු අයභාරයට වඩා මුළු පිරිවැය වැඩිවන හෙයින් අවප්‍රාමාණික ලාභ හිමි වේ.




**පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක දිගුකාලීන සමතුලිතය**

පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක දිගු කාලීන සමතුලිතය තීරණය කරන ප්‍රධාන සාධකය වනුයේ, වෙළෙඳපොලට පිවිසීමටත් ඉන් පිටවයාමටත් ඇති හැකියාවයි. කෙටි කාලීන සමතුලිතයේදී, ආයතන වල විවිධ ආර්ථික ලාභ මට්ටම් පැවතිය හැකිය. එවැනි ආර්ථික ලාභ සහ අලාභ වෙළෙඳපොලට පිවිසෙන්නන්ට සහ පිටව යන්නන්ට සංඥා සපයයි.

කෙටි කාලීන සමතුලිතයේදී ආයතනයක් ආර්ථික ලාභ ලබයි නම්, එය අලුතින් ආයතන වෙළෙඳපොලට පිවිසීමට පෙළඹවීමක් කරනු ඇත. එහි ප්‍රතිඵලය වෙළෙඳපොල සැපයුම ඉහළ යෑම වන අතර සමතුලිත මිල පහළ යැවීමට තුඩු දේ. ඒ නිසා, ආර්ථික ලාභ පහළ වැටෙන අතර, ආර්ථික ලාභ ශූන්‍ය වනතුරු අලුත් ආයතන වෙළෙඳපොලට එක් වේ.

අනෙක් අතට, කෙටි කාලීනව ආයතනය ආර්ථික අලාභ ලබයි නම්, ඇතැම් ආයතනවලට අලාභ ලැබීමට බියවීම නිසා වෙළෙඳපොල හැරයාමට බල කෙරෙනු ඇත. වෙළඳපොල සැපයුම පහත යාමට මෙය හේතුවන අතර මිල ඉහළ යාමට තුඩු දෙනු ඇත. ආර්ථික අලාභ ශූන්‍ය වන තුරු ආයතන වෙළෙඳපොල හැරයාම සිදුවනු ඇත.

එමනිසා, දිගුකාලීන සමතුලිතයේ දී පූර්ණ තරගකාරී වෙළෙඳපොලෙහි ආයතන, ආර්ථික ලාභ ලැබීමක් හෝ ආර්ථික අලාභ විඳීමක් හෝ නොකරයි. එයින් අදහස් වන්නේ දිගු කාලීන සමතුලිතයේදී සියලුම ආයතන ප්‍රාමාණික ලාභ පමණක් ලබන බවයි.




**පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක දිගුකාලීන සමතුලිතය**

## 2020 ජූලි

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරගයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) සමජාතීය භාණ්ඩ නිපදවීම.

(2) අබාධ පිවිසුම (free entry) හා පිටවීම.

(3) භාණ්ඩයේ මිල විකුණුම්කරු විසින් පමණක් තීරණය කරයි.

(4) වෙළෙඳපොලේ ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.

**1.6** ආයතනයක් සඳහා මාසයක පිරිවැය තොරතුරු පහතින් ඔබට ලබා දී ඇත:

| | රු. |
|---|---|
| සෘජු පිරිවැය | 180,000 |
| වක්‍ර පිරිවැය | 45,000 |

ආයතනය මාසය තුළ ඒකක 2,500 ක් නිපදවා විකුණා ඇති අතර, විකුණුම් මිල ඒකකයක් රු.100/- බැගින් විය.

ඉහත තොරතුරු මත පදනම්ව, මාසය සඳහා ආර්ථික ලාභය වන්නේ:

(1) රු.70,000/-. (2) රු.25,000/-. (3) රු.205,000/-. (4) රු.225,000/-.

**1.11** දී ඇති කාලපරිච්ඡේදය තුළ නිමැවුමෙහි ඒකකයක පිරිවැය, …………………… *(සාමාන්‍ය පිරිවැය / ආන්තික පිරිවැය)* ලෙස හඳුන්වනු ලැබේ.

**1.12** නිමැවුමේ සමානුපාතිකව වැඩිවීම, යෙදවුමේ සමානුපාතික වැඩිවීමට වඩා …………………… *(වැඩි / අඩු)* වූ විට, වැඩිවන පරිමාණානුකූල ඵල (returns to scale) ඇති වේ.

**1.17** හීනවන ආන්තික ඵලදා න්‍යාය (law of diminishing marginal returns) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** ඒකාධිකාරයේ ලක්ෂණ (characteristics) දෙකක්(02) සඳහන් කරන්න.

05.

(a) පූර්ණ තරගකාරී ආයතන, කෙටිකාලයේදී ලාභ උපරිම කරගන්නේ කෙසේදැයි ප්‍රස්තාර කොළයක් භාවිත කර **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

## 2021 ජනවාරි

**1.11** ආයතනයක ආන්තික අයභාරය එහි ……………… *(ආන්තික පිරිවැයට / සාමාන්‍ය පිරිවැයට)* සමාන වන අවස්ථාවේදී එහි ලාභය උපරිම වේ.

**1.14** ආර්ථික ක්ෂය, වක්‍ර පිරිවැය සඳහා උදාහරණයකි.

**1.18** වැඩිවන පරිමාණානුකූල ඵල (increasing returns to scale) ඇති වීම කෙරෙහි බලපාන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** ආන්තික ආදායම [Marginal Revenue (MR)], යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

## 2020 ජනවාරි

**1.15** සාමාන්‍ය පිරිවැය [Average Cost (AC)] වක්‍රයේ අවම ලක්ෂ්‍යයේදී, සාමාන්‍ය පිරිවැය [Marginal cost (MC)] වක්‍රය, ආන්තික පිරිවැය වක්‍රය ඡේදනය කරයි.

**1.16** සියලුම යෙදවුම්වල වැඩිකිරීමට වඩා අඩු සමානුපාතයකින් නිමැවුම වැඩිවන්නේ නම් …………………… *(වැඩෙන / හීනවන)* පරිමාණුකූල ඵල ඇතිවේ.

**1.18** ඒකාධිකාරී තරඟයේදී, ආයතන …………………… *(දිගු කාලයේදී / කෙටි කාලයේදී)* ප්‍රාමාණික ලාභ (normal profits) පමණක් උපයනු ලැබේ.

**1.19** …………………… *(ආන්තික පිරිවැය / සාමාන්‍ය පිරිවැය)* යනු එක් අතිරේක නිමැවුම් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරණු ලබන අමතර පිරිවැයයි.

03.
(b) පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ලාභ උපරිම කරනු ලබන්නේ කෙසේදැයි ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 2019 ජූලි

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, කතිපයාධිකාරී (oligopoly) වෙළෙඳපොළක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) සීමිත අලෙවිකරුවන් ගණනක් පමණක් සිටීම.
(2) වෙළෙඳපොළට පිවිසීමට බාධා නොමැති වීම.
(3) නිෂ්පාදිත භාණ්ඩ, සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩ වීම.
(4) මිල දැඩියාවක් (rigidity) පැවතීම.

**1.4** නිමැවුමෙහි අතිරේක ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන අමතර පිරිවැය:

(1) ආන්තික පිරිවැය වේ. (2) මුළු පිරිවැය වේ.
(3) සාමාන්‍ය පිරිවැය වේ. (4) විචල්‍ය පිරිවැය වේ.

**1.5** ආයතනයක කෙටිකාලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) නිෂ්පාදන සාධක, ස්ථාවර සාධක සහ විචල්‍ය සාධක ලෙස බෙදනු ලබයි.
(2) ස්ථාවර සාධක නොමැත.
(3) පරිමාණානුකූල පිරිමැසුම් මඟින් සාමාන්‍ය පිරිවැය වක්‍රය තීර්ණය කරනු ලැබේ.
(4) ආයතනයකට එහි සියලුම යෙදවුම් වෙනස් කිරීමට හැකිය.

**1.14** ආයතනයකට එහි සාමාන්‍ය මුළු පිරිවැය පමණක් ආවරණය කරගත හැකි මිල, වසා දැමීමේ මිල (shut down price) ලෙස හඳුන්වනු ලැබේ.

**1.15** ඒකාධිකාරී තරඟයේදී නිෂ්පාදිත, ප්‍රභේදනය සහිත වේ.

**1.17** සාමාන්‍ය නිෂ්පාදිත [Average Product (AP)] වක්‍රයේ …………………… *(අවම / උපරිම)* ලක්ෂ්‍යයේදී ආන්තික නිෂ්පාදිත [Marginal Product (MP)] වක්‍රය, සාමාන්‍ය නිෂ්පාදිත (AP) වක්‍රය ඡේදනය කරයි.

## 2018 ජූලි

1.3 තනි විකුණුම්කරුවෙකු පමණක් සිටින වෙළෙඳපොළ ව්‍යුහය හඳුන්වනු ලබන්නේ:

(1) ඒකාධිකාරී තරඟය ලෙසයි. (2) පූර්ණ තරඟය ලෙසයි.

(3) ඒකාධිකාරය ලෙසයි. (4) කතිපයාධිකාරය ලෙසයි.

1.4 යෙදවුමේ සමානුපාතික වැඩිවීම නිමැවුමේ සමානුපාතික වැඩිවීමට සමාන වූ විට එය හඳුන්වන්නේ:

(1) ස්ථාවර පරිමාණුකූල ඵල ලෙසයි. (2) වැඩෙන පරිමාණුකූල ඵල ලෙසයි.

(3) හීනවන පරිමාණුකූල ඵල ලෙසයි. (4) ආන්තික පරිමාණුකූල ඵල ලෙසයි.

1.13 කෙටි කාලයේදී ආයතනයක නිෂ්පාදන සාධක, ස්ථාවර සාධක සහ විචල්‍ය සාධක වශයෙන් බෙදා වෙන්කළ හැකිය.

03.

(a) මුළු නිෂ්පාදනය [Total Production (TP)], සාමාන්‍ය නිෂ්පාදනය [Average Production (AP)] සහ ආන්තික නිෂ්පාදනය [Marginal Production (MP)] අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) ඒකාධිකාරය (Monopoly) සහ ඒකාධිකාරී තරඟය (Monopolistic Competition) අතර වෙනස්කම් හතරක් (04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

## 2019 ජනවාරි

1.3 පූර්ණ තරඟයේ ලක්ෂණ සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශන ඔබ වෙත දී ඇත:

**(a)** එහි ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් තිබේ.

**(b)** එහි සමජාතීය නිෂ්පාදිත විකුණනු ලබයි.

**(c)** එහි දිගුකාලීනව (long run) ප්‍රමාණික ලාභ පමණක් උපයයි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරඟයේ ලක්ෂණ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(c)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.4 ආයතනයක එහි ලාභය උපරිම වන්නේ:

(1) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා මිල අඩුවන විටය.

(2) මුළු පිරිවැය, ආන්තික පිරිවැයට සමානවන විටය.

(3) මුළු පිරිවැය, මුළු ආදායමට සමාන වන විටය.

(4) ආන්තික පිරිවැය, ආන්තික ආදායමට සමාන වන විටය.

1.8 සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේදී:

(1) සාමාන්‍ය මුළු පිරිවැය, ආන්තික පිරිවැයට සමාන වේ.

(2) සාමාන්‍ය ස්ථාවර පිරිවැය, ආන්තික පිරිවැයට සමාන වේ.

(3) මුළු පිරිවැය, සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ.

(4) මුළු පිරිවැය, ආන්තික ආදායමට සමාන වේ.

1.17 …………………… *(පූර්ණ තරඟය / ඒකාධිකාරී තරඟය)* මගින් ප්‍රභේදනයක් සහිත (Differentiated) භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබයි.

# 04. ජාතික ගිණුම්කරණය සහ රජයේ කාර්යභාරය

## සාර්ව ආර්ථික විද්‍යාව

සමස්ථ ආර්ථිකයේම ව්‍යුහය හා කාර්යසාධණය හා හැසිරීම විග්‍රහ කිරීම සාර්ව ආර්ථික විද්‍යාව තුළින් සිදුවේ.

### සාර්ව ආර්ථික අරමුණු

ඕනෑම සමාජයක් සාර්ව ආර්ථික කළමනාකරණය හරහා ළඟා කර ගැනීම්ට අපේක්ෂා කරනු ලබන ආර්ථික අභිමතාර්ථයන් සාර්ව ආර්ථික අරමුණු ලෙස හැඳින්වේ. ඒවා නම්

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. මිල ස්ථායිතාවය
4. බාහිර ආර්ථික ස්ථායිතාවය
5. ආර්ථික නිදහස
6. සාධාරණ ආදායම් ව්‍යාප්තිය
7. පාරිසරික ගුණාත්මකභාවය

### සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

කිසියම් ආර්ථිකයක අපේක්ෂිත අභිමතාර්ථ හෙවත් සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීම සඳහා ආර්ථිකය මෙහෙය වීමට යොදා ගනු ලබන උපායමාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ. ඕනෑම ආර්ථිකයක් තුළ හා හඳුනාගත් හැකි ප්‍රධානතම ආර්ථික ප්‍රතිපත්ති පහත් වේ

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය
4. ආදායම් ප්‍රතිපත්තිය
5. විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය
6. ඍජු පාලන ප්‍රතිපත්තිය

### ආර්ථික කාරකයින්

ඕනෑම ආර්ථික පද්ධතියක් තුළ දැකගත හැකි ප්‍රධාන ආර්ථික කාරක 4කි

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................

ඉහත කී ආර්ථික කාරක අතර ඇති අන්තර් සම්බන්ධතාවය සාර්ව ආර්ථිකයේ චක්‍රීය ප්‍රවාහ සටහන් මගින් විග්‍රහ කළ හැක.


අධ්‍යනයේ පහසුව සඳහා එවැනි චක්‍රීය ප්‍රවාහ ආකෘති 3ක් ගොඩ නගා ගනී.

1. කුටුම්භ හා ව්‍යාපාර අතර සම්බන්ධය විග්‍රහ කරනු ලබන චක්‍රීය ප්‍රවාහ සටහන - ....................................................................................

2. කුටුම්භ වල ව්‍යාපාර හා රජය අතර සම්බන්ධය විග්‍රහ කරනු ලබන චක්‍රීය ප්‍රවාහ සටහන - ................................................................................

3. කුටුම්භ වල ව්‍යාපාර රජය හා විදේශ අංශය අතර සම්බන්ධය විග්‍රහ කරනු ලබන චක්‍රීය ප්‍රවාහ සටහන - ................................................................................

කුටුම්බ හා නිෂ්පාදන ආයතන පමණක් සිටින සරල ආර්ථිකයක් උපකල්පනය කරමින් අඳින ලද චක්‍රීය ආදායම් ප්‍රවාහ සටහනක් පහතින් දැක් වේ.



## ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රවාහ

ඉහත චක්‍රීය ප්‍රවාහ සටහන හරහා අපට හඳුනාගත හැකි ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රවාහ 3 කි.

1. සමස්ත නිෂ්පාදිතයේ වටිනාකම - .................................................................................
2. සමස්ත නිෂ්පාදිතය බිහි කිරීමේ දී එයට සමගාමීව හටගනු ලබන ආදායම් ප්‍රවාහය - .............................................................................
3. සමස්ත නිෂ්පාදිතය මිලට ගැනීම සඳහා කරනු ලබන මුළු වියදම - .................................. ................................................

## ජාතික ගිණුම්කරණය

ජාතික ගිණුම් යනුවෙන් අදහස් කෙරෙන්නේ රටක සමස්ත නිෂ්පාදිතයේ අගය ගණනය කර ඉදිරිපත් කිරීම යි. ආර්ථිකයක සිදුවන දහස් සංඛ්‍යාත ගනුදෙනුවල වටිනාකම් සහ එම ගනුදෙනුවලින් අවසානයේ සමස්තයක් ලෙස ආර්ථිකයට සිදුවූයේ කුමක් දැයි ඇස්තමේන්තු කළ යුතු නිසා ජාතික ගිණුම් සැකසීමේ අවශ්‍යතාවය පැන නගී. එසේ සකසනු ලබන ජාතික ගිණුම් රටක සාර්ව ආර්ථිකය ක්‍රමවත් ව කළමනාකරණය කිරීමට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කර ගැනීමට මාර්ගෝපදේශකයෙකු ලෙස ඉතා ප්‍රයෝජනවතමෙහෙවරක් ඉටු කරයි. ඒ අනුව රටක සමස්ථ නිෂ්පාදිතයේ අගය පහත විකල්ප ප්‍රවේශ ඔස්සේ ගණනය කළ හැක. ඒවා නම්

....................................................................................

....................................................................................

....................................................................................

නිමැවුම්, ආදායම් හා වියදම් ප්‍රවේශ ලබාදෙනුයේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව එක ම වටිනාකමක් බව.

**සමස්ත නිෂ්පාදිතය** ≡ **සමස්ත නිෂ්පාදිතය** ≡ **සමස්ත නිෂ්පාදිතය**

නිෂ්පාදනයේ වටිනාකම අවශ්‍යයෙන් ම නිෂ්පාදනය බිහි කිරීම සඳහා යොදාගත් නිෂ්පාදන සම්පත්වල වටිනාකමට සමාන විය යුතු බැවින්, ආදායමේ වටිනාකමත් නිෂ්පාදිතයේ වටිනාකමත් අනන්‍ය වේ. එසේ ම නිමැවුමේ වටිනාකම නිමැවුම මිල දී ගැනීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණයට අවශ්‍යයෙන් ම සමාන විය යුතු බැවින්, නිමැවුමේ වටිනාකම සහ වියදමේ වටිනාකම ද එකිනෙකට සමාන විය යුතු ය. නිමැවුම හරහා ආදායමක් ජනනය කරන අතර, එම ආදායම හරහා වියදමක් ජනනය කරයි. ඒ අනුව, නිෂ්පාදන, ආදායම් හා වියදම් ප්‍රවේශ පිළිබිඹු කරනුයේ එක ම ක්‍රියාවලියක විවිධ පැතිකඩ තුන කි.

# දළ දේශීය නිෂ්පාදිතය

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

ආර්ථිකයක් තුල සිදුවන සෑම ක්‍රියාකාරකමක්ම ජාතික ගිණුම් සම්පාදනයේදී ඇතුළත් නොකරන අතර එම සියලු ක්‍රියාකාරකම් අතුරින් නිෂ්පාදන ආර්ථික ක්‍රියාකාරකම් පමණක් ජාතික ගිණුම් සැකසීමේදී යොදා ගනී.

ආර්ථිකයක් තුල සිදුවන ඵලදායි නොවන ආර්ථික ක්‍රියාකාරකම් ජාතික ගිණුම් සම්පාදනයේදී බැහැර කරයි.

උදා : - මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු
පාවිච්චි කළ භාණ්ඩ නැවත විකිණීම ආශ්‍රිත ගනුදෙනු
සංක්‍රාම

එමෙන්ම ඇතැම් ඵලදායි ආර්ථික ක්‍රියාකාරකම් ද විවධ හේතූන් මත ජාතික ගිණුම් සම්පාදනයේදී බැහැර කෙරේ.

උදා : - නොගෙවූ ගෘහ සේවය (ස්ව - පරිභෝජන සේවා)
මිනිස් දායකත්වයකින් තොරව වර්ධනය වන ස්වභාවික සම්පත්
ඉගෙනීම හා විවේකය

# විකල්ප ප්‍රවේශ ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන ආකාරය.

## 1. නිමැවුම් ප්‍රවේශයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන ආකාරය

නිමැවුම් ප්‍රවේශයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී සිදුවන්නේ, යම් කාලපරිච්ඡේදයක් තුළ ආර්ථික ප්‍රදේශයේ නිපදවන ලද සියලු ම භාණ්ඩ හා සේවාවල වටිනාකම ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම යි.

| | | |
|---|---|---|
| **කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය** | = | xxx |
| **කාර්මික කටයුතුවල එකතු කළ අගය** | = | xxx |
| **සේවා කටයුතුවල එකතු කළ අගය** | = | xxx |
| **සමස්ත එකතු කළ අගය මූලික මිල මත** | = | xxx |
| **(+) භාණ්ඩ හා සේවා මත අයකරන බදු - සහනාධාර** | = | xxx |
| **වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | = | xxx |

| SLSIC කේතය | | ආර්ථික කටයුතු | |
|---|---|---|---|
| අනු අංකය | SLSIC | | |
| 1 | A | කෘෂි කර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය | කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාකාරකම් |
| 2 | B, C, D, E | පතල් කැනීම, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය හා ජලය නිෂ්පාදන කටයුතු | කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් |
| 2.1 | C | උප අංශය : නිෂ්පාදන කර්මාන්ත | |
| 3 | F | ඉදිකිරීම් | |
| 4 | G, H, I | තොග සහ සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහනය හා ගබඩා කිරීම, නවාතැන් සහ ආහාර පාන සැපයීමේ සේවා | සේවා සැපයීමේ ආර්ථික ක්‍රියාකාරකම් |
| 5 | J | තොරතුරු හා සන්නිවේදන කටයුතු පිළිබඳ සේවා | |
| 6 | K | මූල්‍ය හා රක්ෂණ සේවාවන් | |
| 7 | L | නිවාස අයිතිය සහ දේපොළ වෙළෙඳාම | |
| 8 | M, N | වෘත්තීය, විද්‍යාත්මක, පරිපාලන සහ සහාය සේවාවන් | |
| 9 | O, P, Q | රාජ්‍ය පරිපාලනය, ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | |
| 10 | R, S, T, U | වෙනත් සේවාවන් | |
| සමස්ත එකතු කළ අගය මූලික මිල ගණන් අනුව | | | |
| + භාණ්ඩ මත අය කෙරෙන බදු - භාණ්ඩ මත ලබා දුන් සහනාධාර | | | |
| දළ දේශීය නිෂ්පාදිතය (වෙළෙඳ පොළ මිල) | | | |

## 2. ආදායම් ප්‍රවේශය යටතේ, වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය පහත පරිදි ගණනය කළ හැකි ය.

ආදායම් ප්‍රවේශයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී සිදුවන්නේ, යම් කාලපරිච්ඡේදයක් තුළ නිෂ්පාදන ක්‍රියාවලියට සාධක සපයා ජනනය කරන ලද ආදායම්වල එකතුව ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම යි.

| | | | |
|---|---|---|---|
| **සේවක ගෙවීම්** | | | XXX |
| **දළ මෙහෙයුම් අතිරික්තය** | | | |
| - | **ශුද්ධ මෙහෙයුම් අතිරික්තය** | XXX | |
| - | **ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය** | XXX | |
| **මිශ්‍ර ආදායම්** | | XXX | XXX |
| | | | XXX |
| **නිෂ්පාදනය මත අනෙකුත් ශුද්ධ බදු** | | | XXX |
| **මූලික මිල මත සමස්ත එකතු කළ අගය** | | | XXX |
| **භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු** | | | XXX |
| **වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | | | XXX |

## 3. වියදම් ප්‍රවේශය යටතේ, වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය පහත පරිදි ගණනය කළ හැකිය.

වියදම් ප්‍රවේශයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී සිදුවන්නේ යම් කාලපරිච්ඡේදයක් තුළ ආර්ථිකයක් තුළ නිපදවන ලද අවසාන භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට දරන වියදම් ඔස්සේ සමස්ත නිෂ්පාදිතය ගණනය කිරීම වේ.

| | |
|---|---|
| **පෞද්ගලික අවසන් පරිභෝජනය** | XXX |
| **රාජ්‍ය අවසන් පරිභෝජනය** | XXX |
| **දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය** | XXX |
| **වෙළෙඳ මිලට දළ දේශීය වියදම** | XXX |
| **(+) ශුද්ධ අපනයන** | XXX |
| **වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | XXX |

**දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය** (I)

දළ ප්‍රාග්ධන සම්පාදනය ප්‍රධාන කොටස් තුනකට වර්ග කෙරේ.

1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය
2. තොග / පරිලේඛන වෙනස්වීම
3. වටිනාකම්හි වෙනස්වීම්

## වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය, වෙළෙඳ මිලට දළ ජාතික ආදායම, ශුද්ධ ජාතික ආදායම

| | |
|---|---|
| **වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | XXX |
| (+) **ශු. වි. ප්‍රාථමික ආදායම** | XXX |
| **වෙළෙඳ මිලට දළ ජාතික ආදායම** | XXX |
| **(-) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය** | (XX) |
| **ශුද්ධ ජාතික ආදායම** | XXX |

# ජාතික ගිණුම් සම්පාදනයේ වැදගත්කම් හා සීමා

## ජාතික ගිණුම් සම්පාදනයේ වැදගත්කම්

- ........................................................................................................................................
- ........................................................................................................................................
- ජාත්‍යන්තර වශයෙන් සංසන්දනය කිරීමට
- ජනතාවගේ ජීවන තත්ත්වය සහ සුභසාධනය තක්සේරු කිරීමට
- සමාහාර මිල මට්ටමේ ප්‍රවණතා හඳුනා ගැනීමට
- ආර්ථිකයේ ව්‍යුහය විශ්ලේෂණය කිරීමට
- ආදායමේ කාර්යාත්මක ව්‍යාප්තියේ වෙනස්කම්වල ස්වභාවය හඳුනා ගැනීමට
- සාර්ව ආර්ථිකයේ ක්‍රියාකාරී සම්බන්ධතා හඳුනා ගැනීමට
- ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමට උපකාරී වීම.

## ජාතික ගිණුම් සම්පාදනයේ සීමා

- ........................................................................................................................................
- ........................................................................................................................................
- සමාජයේ ඇතැම් පිරිස් ස්වේච්ඡාවෙන් ඉටුකරනු ලබන ක්‍රියා ජාතික ගිණුම් වල ඇතුළත් නො වේ.
- විවේකය ජාතික නිෂ්පාදිතය තුළට ඇතුළත් නො වීම.
- නිෂ්පාදන ක්‍රියාවලියේ දී පාරිසරික සම්පත්වලට සිදුවන හානිය සැලකිල්ලට නො ගැනීම.
- රාජ්‍ය ණය සඳහා ගෙවනු ලබන පොලිය ආදායමක් වශයෙන් නො සැලකීම.
- රාජ්‍ය අංශයේ සේවකයින් කාර්යක්ෂමතාවේ සිදුවන වෙනස්කම් නො සැලකීම.
- ආරක්ෂක කටයුතු හෝ යුධමය කටයුතු හෝ සඳහා කෙරෙන වියදම් කොතෙක් දුරට ජාතික නිෂ්පාදිතයට ඇතුළත් කළ යුතුදැයි ගැටලු පවතී.

# පසුගිය විභාග ගැටලු

## 2020 ජූලි

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, රජය විසින් දරණ ලද ප්‍රාග්ධන වියදමකට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ණය සඳහා පොලී ගෙවීම්.
(2) පුනරාවර්තන මාරුකිරීම්.
(3) මූර්ත වත්කම් මිලදී ගැනීම.
(4) සහනාධාර සැපයීම.

**1.19** ජාතික ආදායම් ගිණුම්වල සීමා (limitations) දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** සාර්ව ආර්ථික අරමුණු (macroeconomic objectives) දෙකක්(02) සඳහන් කරන්න.

04. (a) (i) මුදලේ ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න**.

(ii) විද්‍යුත් මුදල් (electronic money) භාවිතයට හේතු දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**.

06.

(B) ජාතික ආදායම් ගිණුම් පිළියෙල කිරීමේ වැදගත්කම සඳහා දැක්විය හැකි හේතු තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(C) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත (hypothetical data) ඔබට ලබා දෙනු ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 2,000 |
| රජයේ පරිභෝජන වියදම් | 1,500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,200 |
| අපනයන | 1,800 |
| ආනයන | 1,250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම (විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | - 800 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 04)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

## 2020 ජනවාරි

**1.11** ආනයන, ආදායම් වෘත්තාකාර ප්‍රවාහයේ විදීමක් (එකතුවීමක්) සඳහා උදාහරණයකි.

**1.13** සේවා නියුක්තිය (Employment), සාර්ව ආර්ථික (macro-economic) විචල්‍යයකි (variable).

04.

(b) ශ්‍රී ලංකාව වැනි රටක රජයේ අයවැයෙහි අයවැය හිඟයක් තිබීමේ ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

06.

(B) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත ඔබට දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර කර්මාන්තය | 10,000 |
| පතල් හා කැණීම්, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය හා ජල නිෂ්පාදන කටයුතු සහ වෙනත් කර්මාන්ත | 7,500 |
| ඉදිකිරීම් | 20,000 |
| තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, ගබඩා කිරීම, නවාතැන් සැපයීම් හා ආහාර සැපයීම් සේවා | 2,500 |
| තොරතුරු සහ සන්නිවේදන සේවා | 23,000 |
| මූල්‍ය සහ රක්ෂණ සේවා | 2,500 |
| නිවාස අයිතිය ඇතුළුව දේපළ වෙළඳාම | 4,550 |
| වෘත්තීය සේවා, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන සහ උපකාරක සේවා ක්‍රියාකාරකම් | 3,575 |
| රාජ්‍ය පරිපාලනය, ආරක්ෂක, අධ්‍යාපනය, මානව සෞඛ්‍යය සහ සමාජ සේවා කටයුතු | 15,000 |
| වෙනත් සේවා | 5,600 |
| නිෂ්පාදිත මත බදු | 5,600 |
| නිෂ්පාදිත මත සහනාධාර | 3,250 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිලට දළ (සමස්ත) එකතුකළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 06)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 04)

## 2019 ජූලි

**1.9** ජාතික ආදායම් ප්‍රවාහයේ කාන්දුවීමක් (ගිලිහීමක්) සඳහා උදාහරණයක් වන්නේ:

(1) ආයෝජන. (2) රජයේ වියදම්. (3) අපනයන. (4) ආනයන.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, සාර්ව ආර්ථික විචල්‍යයක් **නොවන්නේ** කුමක් ද?

(1) සමස්ත නිෂ්පාදනය. (2) ගෙවුම් ශේෂය.

(3) සාමාන්‍ය මිල මට්ටම. (4) වෙළෙඳපොළ සමතුලිතතාවය.

**1.19** රජය මගින් කරනු ලබන …………………… *(වර්තන / ප්‍රාග්ධන)* වියදම් සඳහා උදාහරණයක් වන්නේ මූර්ත වත්කම් අත්පත් කර ගැනීමයි.

06.

(A) (a) 2019 අප්‍රේල් 21 දින සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් (පාස්කු ඉරිදා ප්‍රහාරය) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇතිවූ ප්‍රතිවිපාක **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) වක්‍ර බදුවල අරමුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(B) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත ඔබට දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර කර්මාන්තය | 3,000 |
| නිෂ්පාදන කර්මාන්ත, පතල් හා කැණීම් සහ වෙනත් කර්මාන්ත | 2,600 |
| ඉදිකිරීම් | 2,000 |
| තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, ගබඩා කිරීම, නවාතැන් සැපයීම් හා ආහාර සැපයීම් සේවා | 4,500 |
| තොරතුරු සහ සන්නිවේදනය | 2,000 |
| මූල්‍ය සහ රක්ෂණ කටයුතු | 2,500 |
| නිවාස අයිතිය ඇතුළුව දේපළ වෙළඳාම | 1,200 |
| වෘත්තිය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා ක්‍රියාකාරකම් | 2,000 |
| රාජ්‍ය පරිපාලනය, ආරක්ෂක, අධ්‍යාපන, මානව සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 10,500 |
| නිෂ්පාදිත මත බදු | 1,500 |
| නිෂ්පාදිත මත සහනාධාර | 1,000 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිලට දළ (සමස්ත) එකතුකළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 06)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(C) ජාතික ගිණුම් පිළියෙල කිරීමේ වැදගත්කම සඳහා හේතු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

## 2018 ජූලි

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, ජාතික ආදායම් ප්‍රවාහයට කරනු ලබන විදීමක් (an injection) තෝරන්න:

(1) ඉතිරිකිරීම්. (2) බදුකරණය. (3) ආනයන. (4) අපනයන.

06.

(B) එක් අවුරුද්දක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත ඔබට දී ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 1,500 |
| රජයේ පරිභෝජන වියදම් | 1,500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3,000 |
| ශුද්ධ අපනයන | 2,500 |
| විදේශවලින් ලද ශුද්ධ සාධක ආදායම (ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම) | 750 |
| ප්‍රාග්ධන ක්ෂයවීම් | 1,000 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) දළ දේශීය වියදම (Gross Domestic Expenditure). (ලකුණු 04)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය [Gross National Product (GNP)]. (ලකුණු 02)

(d) වෙළෙඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය [Net National Product (NNP)]. (ලකුණු 02)

(C) රජයක සාර්ව ආර්ථික අරමුණු (Macro Economic Objectives) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

## 2019 ජනවාරි

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, රජයේ සාර්ව ආර්ථික අරමුණක් වන්නේ කුමක් ද?

(1) සමාහාර පරිභෝජනය. (2) විනිමය අනුපාතිකය.

(3) ගෙවුම් ශේෂ සමතුලිතතාවය. (4) සේවා වියුක්තිය.

06.

(A) (a) රාජ්‍ය ව්‍යවසායයන්හි අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) රාජ්‍ය අයවැයේ ප්‍රධාන අරමුණු හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(B) වර්ෂයක කාලච්ඡේදයක් සඳහා කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් තොරතුරු ඔබ වෙත දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| සේවක ආදායම (compensation for employees) | 2,000 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1,000 |
| මිශ්‍ර ආදායම | 1,100 |
| නිෂ්පාදන සහ ආනයන මත ශුද්ධ බදු | 750 |
| විදේශීය ශුද්ධ වර්තන (ජංගම) සංක්‍රාම (transfers) | 550 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | 1,200 |
| ශුද්ධ වක්‍ර බදු | 150 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිල අනුව දළ (සමස්ත) එකතුකළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 04)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(d) වැයකළ හැකි දළ ජාතික ආදායම [Gross National Disposable Income (GNDI)]. (ලකුණු 02)

## 2021 ජනවාරි

**1.20** වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාර දෙකක්(02) සඳහන් කරන්න.

06.

(A) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත සපයා ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 600 |
| රජයේ පරිභෝජන වියදම් | 500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 400 |
| තොග වෙනස්වීම් | 200 |
| අපනයන | 400 |
| ආනයන | 250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම<br>(විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | -100 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(B) (a) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිය (Fiscal Policy) සහ මූල්‍ය ප්‍රතිපත්තිය (Monetary Policy) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) අයවැය හිඟය (budget deficit) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(C) (a) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවයන් වැළැක්වීම (inefficiencies of resource allocation) සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග (measures) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) රජයේ අසමත්වීම (failure of the government) කෙරෙහි බලපාන හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

# විශේෂ සටහන්

## 01. ආර්ථික ප්‍රදේශය / කලාපය

තනි ආණ්ඩුවක සඵල ආර්ථික පාලනයකට නතු වූ, පුද්ගලයන්ට, භාණ්ඩවලට සහ ප්‍රාග්ධනයට නිදහසේ සංචල විය හැකි, භූගෝලීය ප්‍රදේශය යි. සරලව දැක්වුවහොත් ආණ්ඩුවක් විසින් ඍජුව පාලනය කරනු ලබන ප්‍රදේශය ආර්ථික කලාපය කි.

## 02. නේවාසික භාවය

ආර්ථික ප්‍රදේශය තුළ වර්ෂයකට නොඅඩු කාලයක් ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වී සිටින හෝ එසේ කිරීමේ ආර්ථික අභිලාශයක් ඇති හෝ ඒකක, නේවාසික ඒකක ලෙස සැලකේ.

## 03. ආයතනික ඒකක / ආයතනික අංශය

ආයතනික ඒකකයක් යන්නෙන් අදහස් කරනුයේ, වත්කම් හිමිකර ගැනීමට, වගකීම් දැරීමට, ආර්ථික තීරණ ගනිමින් ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වීමට හා වෙනත් ඒකක සමඟ ගනුදෙනුවලට සම්බන්ධ වීමට හැකියාව ඇති ඒකකය කි. ආයතනික ඒකක ප්‍රධාන වශයෙන් කොටස් දෙක කි.

1. **නේවාසික ආර්ථික ඒකක**

   ආර්ථික ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සියලු ම ආර්ථික ඒකක මින් අදහස් වේ. නේවාසික ආර්ථික ඒකක පස් වැදෑරුම් වේ.

   (i) මූල්‍ය නොවන සංස්ථා (NFC)
   වෙළෙඳ පොළ අරමුණු කරගත් නිෂ්පාදන කටයුතුවල නිරතවන කර්මාන්තශාලා, නිෂ්පාදන ආයතන හා සේවා සැපයුම්කරුවන් මීට අයත් වේ.

   (ii) මූල්‍ය සංස්ථා (FC)
   මූල්‍ය අතරමැදිකරණ කටයුතු සහ අනෙකුත් මූල්‍ය සේවා සපයන බැංකු රක්ෂණ සමාගම්, මූල්‍ය සමාගම්, මූල්‍ය සේවා සපයන ආයතන මීට අයත් වේ.

   (iii) රජය (GG)
   කුටුම්බ සුබසාධනය හා පොදු සමාජ සුබසාධනය උදෙසා කටයුතු කරන මධ්‍යම රජය, පළාත් ආණ්ඩු හා පළාත් පාලන ආයතන යන ආයතනික ව්‍යුහය මේ යටතට ඇතුළත් වේ.

(iv) ගෘහ ඒකක (HH)

ඥාතීන් හෝ ඥාතීන් නොවන පුද්ගලයන් හෝ කිහිප දෙනෙකු පොදු අරමුණක් උදෙසා එක්ව ආහාර පිසිමින් එක ම වහළක් යට ජීවත් වන විට ගෘහ ඒකකයක් ලෙස සැලකේ. ශ්‍රී ලංකාව තුළ ''පවුල'' යන සංකල්පයෙන් බොහෝ විට හඳුන්වන්නේ එය යි.

(v) ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක වලට සේවා සපයන ආයතන (NPISH)

වෙළෙඳ පොළ සඳහා නොවන භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට තම කාලය හා ශ්‍රමය ස්වේච්ඡාවෙන් යොදා, පොදු ජනතාවට සේවා සපයන පුද්ගලයන් හෝ ආයතනවලින් මෙම අංශය සමන්විත වේ.

උදා : පන්සල්, පල්ලි, කෝවිල් වැනි ආගමික සිද්ධස්ථාන.

2. අවශේෂ ලෝකය

නේවාසික නොවන කුටුම්බ හා සමාගමික අංශය අවශේෂ ලෝකයට අයත් වේ.

## 04. යෙදවුම්

නිෂ්පාදන ක්‍රියාවලියට භාවිතා කෙරෙන දෑ යෙදවුම් ලෙස හැඳින්වෙන අතර ජාතික ගිණුම්කරණයේ දී මේවා පුළුල් වශයෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ.

1. ප්‍රාථමික යෙදවුම්

   නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනෙන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය ව්‍යවසායකත්වය යනාදී නිෂ්පාදන සාධක ප්‍රාථමික යෙදවුම් වේ. මේවා එකතු කළ අගයන් ජනනය කෙරෙන යෙදවුම් ලෙස ද හැඳින් වේ.

2. අතරමැදි යෙදවුම්

   නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිල දී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් ලෙස හැඳින් වේ. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මෙම යෙදවුම් යොදා ගැනීම, අතරමැදි පරිභෝජනය ලෙස හැඳින් වේ.

## 05. දළ නිමැවුම් වටිනාකම

නිෂ්පාදන ක්‍රියාවලිය මඟින් බිහි වන භාණ්ඩ හා සේවාවල මූල්‍යමය වටිනාකම නිමැවුමේ දළ වටිනාකම ලෙස හඳුන්වනු ලැබේ.

## 06. දළ එකතු කළ අගය (වටිනාකම)

කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක දළ එකතු කළ අගය යන්නෙන් අදහස් වන්නේ, නිමැවුමේ දළ වටිනාකමෙන් අතරමැදි යෙදවුම්වල වටිනාකම හෙවත් අතරමැදි පරිභෝජනය අඩුකළ විට, ශේෂ වන අගය යි.

| |
|---|
| දළ එකතු කළ අගය = නිමැවුමේ දළ වටිනාකම - අතරමැදි පරිභෝජනය |

## 07. වෙළෙඳ පොළ මිල

වෙළෙඳ පොළ මිල යන්නෙන් අදහස් කරන්නේ, භාණ්ඩයක් හෝ සේවාවක් වෙළෙඳ පොළේ අලෙවි වන මිල යි. වෙළෙඳ පොළ මිලට සියලු ම බදු ඇතුළත් කරනු ලබන අතර, නිෂ්පාදන සහනාධාර බැහැර කරනු ලැබේ. රටක දළ දේශීය නිෂ්පාදිතය වෙළෙඳ පොළ මිල ගණන් යටතේ මත පමණක් ගණනය කෙරේ.

# දළ දේශීය නිමැවුම ඇගයීම සඳහා භාවිතා කෙරෙන මිල

ජාතික ගිණුම්කරණයේ දී යෙදවුම්, නිමැවුම් සහ මිල දී ගැනීම් ඇගයීම සඳහා යොදා ගන්නා මිල ගණන් විවිධ වේ.

මේ අනුව සමස්ත නිමැවුම ඇගයීමේ දී භාවිතා කෙරෙන මිල ගණන් තුන කි.

1. මූලික මිල.
2. නිෂ්පාදකයන්ගේ මිල.
3. ගැනුම්කරුවන්ගේ මිල.

## නිමැවුම් ප්‍රවේශයට අදාල විශේෂ සටහන්

- ආර්ථික කටයුතු
  - නිෂ්පාදන නොවන ක්‍රියාකාරකම්
    - ශුද්ධ වශයෙන් මූල්‍යමය ස්වරූපයක් ඇති ගනුදෙනු
    - පාවිච්චි කළ භාණ්ඩ නැවත විකිණීම ආශ්‍රිත ගනුදෙනු
    - සංක්‍රාම (මාරුවීම)
  - නිෂ්පාදන ක්‍රියාකාරකම්
    - ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම්
      - ස්වයං සේවා
      - ස්වභාවික නිෂ්පාදන ක්‍රියා
    - ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම්
      - → ජාතික ගිණුම් සම්පාදනයේ§ ඇතුළත් කරනු ලබන ආර්ථික ක්‍රියා

        ( නිෂ්පාදන ඉමට ඇතුළත් වන ක්‍රියාකාරකම් )

# ආදායම් ප්‍රවේශයට අදාල විශේෂ සටහන්

## 1. සේවක ආදායම්

නිෂ්පාදන ක්‍රියාවලියේ දී, සේවකයන් සපයන ලද ශ්‍රමය හෝ සේවාවන් වෙනුවෙන් සේවා යෝජකයා විසින් සිදු කරන මූල්‍ය හෝ මූල්‍ය නොවන සියලු ම ගෙවීම් සේවක ගෙවීම් නම් වේ.

1. වැටුප් හා වේතන
2. සේවා යෝජකයා විසින් ලබාදෙන සමාජ සංරක්ෂණ දායක ගෙවීම්
3. රෝගී තත්ත්වයක දී හෝ විරැකියා තත්ත්වයක දී හෝ විශ්‍රාම යන අවස්ථාවේ දී හෝ සේවා යෝජකයා විසින් ඍජුව ම සේවකයින් වෙත ගෙවනු ලබන ප්‍රතිලාභය යි.

## 2. මෙහෙයුම් අතිරික්තය

- මෙහෙයුම් අතිරික්තය සංකල්පය යොදා ගැනෙන්නේ සමාගමික අංශය විසින් ජනනය කරන ආදායම හැඳින්වීමට ය.
- නිෂ්පාදන ක්‍රියාවලියට භාවිතා කරන ශ්‍රමය හැර අනෙකුත් නිෂ්පාදන සාධකයන්ගෙන් සමාගමික අංශයේ ව්‍යවසායකයින් විසින් ජනනය කරන ආදායම්වල එකතුව යි.

## 3. මිශ්‍ර ආදායම්

ගෘහ ඒකක විසින් හිමිකරගෙන සිටින හෝ හවුල් ව්‍යාපාර වශයෙන් පවත්වා ගෙන යනු ලබන හෝ සමාගමික නොවන ව්‍යවසායන් ජනනය කරන ආදායම් මිශ්‍ර ආදායම් ලෙස සැලකේ.

## 4. නිෂ්පාදනය මත අනෙකුත් බදු අඩුකළා සහනාධාර

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා රජය විසින් සපයන විවිධ සේවාවන් සඳහා අයකරන බලපත්‍ර ගාස්තු, සහ වෙනත් ස්ථාවර ගෙවීම් වැනි ආදායම්, නිෂ්පාදන ක්‍රියාවලිය මත අය කෙරෙන අනෙකුත් බදු ලෙස හැඳින් වේ. නිෂ්පාදන ක්‍රියාවලියේ දී රජය නිෂ්පාදකයින්ට ලබා දෙන දෑ සහනාධාර ලෙස හැඳින් වේ.

# සාර්ව ආර්ථික අරමුණු ලඟා කර ගැනීමෙහිලා ආණ්ඩුවේ මැදිහත්වීම

පරමාදර්ශී වෙළෙඳපොළක් අන් සියළු ම වෙළෙඳ පොළවලට වඩා විශිෂ්ට වෙතැයි ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති. එහි දී ආර්ථිකයේ සෑම නිෂ්පාදන ක්ෂේත්‍රයක ම නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය හා සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවය යන දෙකම එකවිට සාක්ෂාත් කරගනු ලබන අතර සියළු ම පිරිවැය හා මිල ගණනක් ම පෞද්ගලික හා සමාජ පිරිවැය ද නිරූපණය කරයි. මෙම තත්ත්වය යටතේ ආර්ථිකයේ සෑම වෙළෙඳ පොළක ම පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තය උපරිම අගයක් ගන්නා අතර, තවදුරටත් ගැලපුම් ඇති කොට ශුභසාධනය ඉහළ නංවා ගැනීමට අවකාශයක් නොපවතී. එබැවින් පරමාදර්ශී වෙළෙඳපොළක ශුභසාධනය ඉහළ නංවා ගැනීමට බාහිර මැදිහත්වීමක් අවශ්‍ය නොවේ. නමුත් ප්‍රායෝගික ලෝකයේ 100% ක් පරමාදර්ශී වෙළෙඳපොළ ආර්ථිකයක් සොයා ගැනීමට අපහසු ය.

## වෙළෙඳපොළ අසමත්වීම්

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

## වෙළෙඳපොළ ආර්ථිකයක ආණ්ඩුවේ කාර්යභාරය

**01.** ..............................................................................................................................

මේ සඳහා ආණ්ඩුව පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි

- පොදු භාණ්ඩ සැපයීම
- අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත මට්ටමට සැපයීම
- පොදු දේපළ සම්පත්වල ආරක්ෂාව තහවුරු කිරීම
- ශුභ සාධන භාණ්ඩ ප්‍රශස්ත මට්ටමට සැපයීම
- අවගුණ භාණ්ඩ සැපයුම පාලනය කිරීම
- බාහිරතා අවම කිරීම
  (බාහිර පිරිවැයක් ඇති කරන නිෂ්පාදන හා පරිභෝජන ක්ෂේත්‍ර අධෛර්යමත් කිරීම හා බාහිර ප්‍රතිලාභ ඇති කරන නිෂ්පාදන හා පරිභෝජන ක්ෂේත්‍ර ධෛර්යමත් කිරීම)

**02.** ..............................................................................................................................

මේ සඳහා ආණ්ඩුව පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි

- අන්ත දිළිඳු පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම
  උදා : අවම ආදායම් මට්ටමක් සහතික කිරීම
  ආහාර මුද්දර ලබා දීම, නිවාස හා සෞඛ්‍ය පහසුකම් සැපයීම
- අනුක්‍රම බදු ප්‍රතිපත්ති සකස් කිරීම
- සංක්‍රාම ගෙවීම් (මූල්‍යමය හා ද්‍රව්‍යමය සංක්‍රාම)
- දේපොළ සීමා කිරීම
- ශුභ සාධන භාණ්ඩ ප්‍රමාණවත් ලෙස සැපයීම
  උදා : අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සේවා සහන මිලට හෝ නොමිලයේ සැපයීම
- වෙළෙඳ පොළට මැදිහත් වීම
  උදා : මිල පාලනය, සහතික මිල, බදු, සහනාධාර
- නීතිරීති හා රෙගුලාසි පැනවීම.

**03.** ..............................................................................................................................

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදාගනිමින් උද්ධමනය සහ සේවා වියුක්තිය ඉවත් කිරීම තුළින් ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට කටයුතු කරයි

**04.** ..............................................................................................................................

ආර්ථික , සාමාජීය හා පාරිසරික අංශවල තුලනාත්මක වැඩිදියුණු කිරීම තුළින් තිරසාර සංවර්ධනය සඳහා වූ වෙළෙඳපොළ ක්‍රමයක් පවත්වා ගැනීමට රජය කටයුතු කරයි

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

ආණ්ඩුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනුයේ රාජ්‍ය අයවැය ලේඛනය මඟින් වන අතර රාජ්‍ය බදු, රාජ්‍ය වියදම් සහ රාජ්‍ය ණය, රාජ්‍ය මූල්‍ය උපකරණ වේ.

# රාජ්‍ය වියදම

රාජ්‍ය වියදම යනු කිසියම් කාලපරිච්ඡේදයක් තුළ රජයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට දැරීමට සිදුවන වියදම් ය.

## රජයට වියදම් දැරීමට සිදුවන හේතු

- ..................................................................................................................................
- ..................................................................................................................................
- ..................................................................................................................................
- ආදායම් පුනර්ව්‍යාප්තියට / දිළිඳුකම තුරන් කිරීමට.
- සාර්ව ආර්ථික ස්ථායීකරණයට.
- ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීමට.
- යටිතල පහසුකම් සැපයීමට.

## ආණ්ඩුවේ වියදම් පුළුල් වශයෙන් කොටස් 2කි.

1. ..................................................................................................................................
2. ..................................................................................................................................

### පුනරාවර්තන වියදම්

අදාළ වර්ෂය තුළ එදිනෙදා රාජ්‍ය සේවා පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම සඳහා දරන වියදම් සහ සංක්‍රාම ගෙවීම් පුනරාවර්තන වියදම් වේ. වර්තන වියදම් ප්‍රධාන කොටස් තුනකි

1. ..................................................................................................................................

   රාජ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම වෙනුවෙන් කළ යුතු භාණ්ඩ හා සේවා මිලට ගැනීමට දරන වියදම් ය
   උදා : රාජ්‍ය සේවකයින්ට වැටුප් ගෙවීම

2. ..................................................................................................................................

   රජය විසින් දේශීයව හා විදේශීයව ලබාගත් ණය සඳහා කරනු ලබන පොලී ගෙවීම් මින් නිරූපණය වේ.

3. ..................................................................................................................................

   රජය විසින් කුටුම්බ හා රාජ්‍ය ආයතන වෙත ලබාදෙන ගනුදෙනුවක ස්වරූපයක් නොගන්නා වර්තන ස්වරූපයේ (ඒක පාර්ශ්වික) ගෙවීම් වර්තන පැවරුම් නම් වේ

**ප්‍රාග්ධන වියදම්**

සාමාන්‍යයෙන් වර්ෂයකට වඩා වැඩි කාලයක් පවතින මූර්ත වත්කම් අත්පත්කර ගැනීම, පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා දරන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.

ප්‍රාග්ධන වියදම් කොටස් දෙකකින් යුක්ත වේ.

1. මූර්ත වත්කම් අත්පත් කර ගැනීම සඳහා කරන වියදම්

   ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, ප්‍රවාහන උපකරණ, යටිතල පහසුකම් වැනි දිගු කාලීන පැවැත්මක් ඇති ප්‍රාග්ධන භාණ්ඩ බිහි කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් රජය දරන වියදම් ය.

2. ප්‍රාග්ධන පැවරුම්

   රාජ්‍ය සංස්ථා හා ආයතන සහ උප රාජ්‍ය ආයතනවල ආයෝජන කටයුතු මූල්‍යකරණය කිරීම සඳහා රජය විසින් සපයන අරමුදල් ය. මේවා අනාගත සංවර්ධන ක්‍රියාදාමය සඳහා හේතුවන ඒක පාර්ශ්වික ගෙවීම් නිසා ප්‍රාග්ධන පැවරුම් යටතට ගැනේ.

# රාජ්‍ය අයභාරය

රාජ්‍ය අයභාරය යනු කිසියම් කාලපරිච්ඡේදයක් තුළ රජයක් සතුව පවතින විවිධ අය මාර්ග ඔස්සේ උපයා ගනු ලබන ආදායම වේ.

රාජ්‍ය අයභාරය ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකකි.

1. ....................................................................................................................................

2. ....................................................................................................................................

### බදු ආදායම

බද්දක් යනු, පොදු අරමුණු උදෙසා රජයක් විසින් සිය අධිකාරී බලය මත පුද්ගලයින් සහ ආයතන වෙතින් අයකරනු ලබන්න කි. මෙය අනිවාර්ය ගෙවීමක්වන අතර එමගින් ගෙවන්නාට සෘජු ප්‍රතිලාභයක් හිමි නොවේ. බදු මගින් පෞද්ගලික අංශයේ සම්පත් නීත්‍යානුකූලව රජයට මාරුවීමක් සිදු වේ.

### බදු වර්ග කිරීම

**1.** ..........................................................................................

නෛතික වශයෙන් බද්දට යටත්වන පුද්ගලයා ම බදු බර දරයි නම් එය සෘජු බදු වේ. මේවා තවත් අයෙකුට විතැන් කළ නොහැක

උදා : පුද්ගල ආදායම් බද්ද, සමාගම් බද්ද

**2.** ..........................................................................................

නෛතික වශයෙන් බද්දට යටත්වන පුද්ගලයාට එම බද්ද වෙනත් අයෙකුට පැවරීමට (විතැන් කිරීමට) හැකියාවක් ඇති විට ඒවා වක්‍ර බදු නම් වේ. එනම් භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදු ය

## රාජ්‍ය අයවැය ලේඛනය

අයවැය ලේඛනය යනු, ඉදිරි මුදල් වර්ෂයක් තුළ රජයේ කටයුතු සඳහා දැරීමට අපේක්ෂා කරන වියදමත්, එම වියදම පියවා ගැනීම සඳහා ආදායම් රැස්කර ගන්නා මාර්ගත්, අයවැය හිඟයක් ඇතොත් එය පියවා ගන්නා ආකාරයත්, ඇතුළත් කරමින් මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මුදල් සැලැස්ම යි.

රාජ්‍ය අයවැය ලේඛනයේ රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් ගැළපීමෙන් අයවැය ශේෂ ලබා ගන්නා අතර එම අයවැය ශේෂයෙහි ස්වභාවය අනුව ප්‍රධාන අයවැය සංකල්ප තුනක් හඳුනාගත හැකිය ඒවා නම්.

.................................- රාජ්‍ය වියදම් රාජ්‍ය ආ ආදායම්ට වඩා වැඩි අවස්ථාවක් හිඟා අයවැයක් නම් වේ

.................................- රාජ්‍ය වියදම රාජ්‍ය ආදායමට වඩා අඩු අවස්ථාවක් අතිරික්ත අයවැයක් නම් වේ.


.................................- රාජ්‍ය වියදමත් රාජ්‍ය ආදායත් සමාන වන අවස්ථාවක් තුලිත අයවැයක් නම් වේ

## අයවැය හිඟය මූල්‍යනය කිරීම

අයවැය ලේඛනයක හිඟයක් හට ගන්නා විට එම හිඟය මූල්‍යනය කිරීම (පියවීම) සඳහා යොදාගත හැකි මූලාශ්‍ර කිහිපය කි.

1. .................................................................................................................................

2. .................................................................................................................................



## දේශීය මූලාශ්‍ර / ප්‍රභව

ආණ්ඩුවේ අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන දේශීය ණය ප්‍රභව දෙක කි

**1. වෙළෙඳ පොළ මූලාශ්‍ර වලින් ණය ගැනීම.**

රජය විවිධ ණය උපකරණ දේශීය මූල්‍ය වෙළෙඳ පොළේ බැංකු හා බැංකු නොවන අංශ වෙත අලෙවි කිරීමෙන් සපයා ගන්නා ණය, වෙළෙඳ පොළ ණය ගැනීම් නම් වේ.

**2. වෙළෙඳ පොළ නොවන මූලාශ්‍ර වලින් ණය ගැනීම.**

රජය අයවැය හිඟය මූල්‍යනය සඳහා රජයේ විවිධ දෙපාර්තමේන්තුවල ඇති අරමුදල් භාතැන්පතුවල ඇති මුදල් තාවකාලිකව යොදා ගනී නම් එය වෙළෙඳපොළ නොවන ණය ගැනීම නම් වේ.

## විදේශීය මූලාශ්‍ර/ප්‍රභව

අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා විදේශීය රජයන්, ජාත්‍යන්තර සංවිධාන සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳ පොළ යනාදියෙන් ලබා ගන්නා අරමුදල්, විදේශ මූලාශ්‍ර ලෙස හඳුන්ව යි. ප්‍රධාන විදේශීය මූලාශ්‍ර වර්ග 02 කි.

**1.** ..............................................................................................................................

ආපසු ලබා ගැනීමේ අදහසකින් තොරව රජයක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් දෙනු ලබන මුදල් හෝ ද්‍රව්‍යමය දෑ ය. මේවා නැවත ගෙවීමක් හෝ ඒ සඳහා පොලී ගෙවීමක් අවශ්‍ය නොවන පරිත්‍යාගයන් වේ.

**2.** ..............................................................................................................................

පොලී සහිතව හෝ රහිතව ආපසු ගෙවීමේ පොරොන්දුව මත විදේශ රජයකින්, අන්තර්ජාතික සංවිධානයකින් හෝ විදේශ පෞද්ගලික අංශයකින් සහනදායී කොන්දේසි සහිතව හෝ රහිතව ලබාදෙන මුදල් හෝ ද්‍රව්‍යමය දෑ විදේශ ණය / ආධාර ලෙස හඳුන්වයි.

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය / ෆිස්කල් ප්‍රතිපත්තිය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් සිදුවන්නේ රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම, රාජ්‍ය ණය ආදිය හැසිරවීම මගින් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ට බලපෑම් කිරීම යි

### රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගතහැකි ආකාර තුන කි.

1. ........................................................................................................................
   ආණ්ඩුවේ වියදමට වඩා බදු අය කිරීම් විශාල වන විට සමස්ත ඉල්ලුම කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති වී මූර්ත නිමවුම හා සේවා නියුක්තිය පහත වැටේ.

2. ........................................................................................................................
   ආණ්ඩුවේ බදු අය කිරීම්වලට වඩා වියදම විශාල වන විට සමස්ත ඉල්ලුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති වී මූර්ත නිමැවුම හා සේවා නියුක්තිය ඉහළ යයි.

3. ........................................................................................................................

## ආණ්ඩුවේ අසාර්ථක වීම්

ආණ්ඩුවේ අසාර්ථක වීම් යනු, වෙළෙඳපොළ අසාර්ථක වීම් මැඩපවත්වා ගැනීම සඳහා ආණ්ඩුව විසින් ආර්ථිකය තුළට කරනු ලබන මැදිහත්වීම්, රාජ්‍ය අංශයට ආවේණික වූ ඇතැම් දුර්වලතා කරණ කොට ගෙන අපේක්ෂිත ප්‍රතිඵල ගෙන නොදී තව තවත් ආර්ථික අකාර්යක්ෂමතා බිහි කිරීම යි.

- ........................................................................................................................
- ........................................................................................................................
- ........................................................................................................................
- නාස්තිය හා දූෂණ බහුල වීම
- නීතිරීති, රෙගුලාසි බහුල වීම නිසා තීරණ ගැනීමේ ප්‍රමාදයන් ඇතිවීම ඃඍසටසාසඑසැ*
- සමාජ අරමුණු හා රජයේ අරමුණු අතර සට්ටන ඇති වීම
- ඡන්ද දායකයන්ගෙන් එල්ලවන පීඩනය නිසා අනුචිත වියදම් හට ගැනීම.
- දිගු කාලීන දැක්මකින් තොරව කෙටි කාලීන වියදම් උදෙසා කටයුතු කිරීම.

### මිල ස්ථායිතාවය

උද්ධමනයක් හෝ අවධමනයකින් තොරව ආර්ථිකය ස්ථාවරව පවත්වා ගෙන යාම මිල ස්ථායිතාවය ලෙස හැඳින්වේ. එනම්, අවම උද්ධමන අනුපාතයක් යටතේ ආර්ථිකය පවත්වා ගෙන යාමයි.

### පූර්ණ සේවා නියුක්තිය

ආර්ථිකය සතු සියලුම සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කිරීම පූර්ණ සේවා නියුක්තිය ලෙස අදහස් වේ. සේවා වියුක්තිය අවම කර ගැනීම තුළින් ඉහළ සේවා නියුක්තියක් අත්කර ගැනීම එමගින් අපේක්ෂා කෙරේ.

### ගෙවුම් ශේෂ සමතුලිතතාවය

විදේශ රටවල් සමග සිදු කරන ගනුදෙනුවලදී ගෙවුම් ශේෂ අර්බුදවලින් තොරව ආර්ථිකය පවත්වා ගෙන යාම මින් අදහස් වේ. එනම් ගෙවුම් ශේෂ අතිරික්තයක් පවත්වා ගෙන යාම හෝ ගෙවුම් ශේෂ හිඟය අඩු කර ගැනීමයි.

### සාධාරණත්වය

සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කරලීම මින් අදහස් වේ. එනම් ආර්ථිකයක සියලුම පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි ආදායම, ධනය බෙදාහැරීමයි.

### තිරසාර සංවර්ධනය

පරිසරයේ ගුණාත්මක බව රැකගනිමින් නිෂ්පාදන ඉහළ නංවා ගැනීමත්, සියලු ජන කොටස් අතර සාධාරණව ප්‍රතිලාභ බෙදී යාමටත් සැලැස්වීම තිරසාර සංවර්ධනය ලෙස හැඳින්වේ. ඒ අනුව තිරසාර සංවර්ධනය යනු ආර්ථික, පාරිසරික හා සමාජයීය යන සියලුම අංශයන්හි තුලනාත්මක වර්ධනයක් ඇති කරලීමයි.

### ආර්ථික වර්ධනය

රටක මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාම ආර්ථික වර්ධනයක් ලෙස අදහස් කෙරේ.

## සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

ආර්ථිකයක ඇති විය හැකි සාර්ව ආර්ථික ගැටලු විසඳා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ආර්ථික කළමනාකරණය ලෙස හැඳින්වේ. අපේක්ෂිත අරමුණු කරා ආර්ථිකය මෙහෙයවීම මෙහි මූලික කාර්යය වන අතර සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා යොදා ගැනෙන අර්ථික ප්‍රතිපත්ති සහ උපායමාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස අදහස් කෙරේ.

### මූල්‍ය ප්‍රතිපත්තිය

මුදල් සැපයුම, ණය සැපයුම, පොළී අනුපාතිකයට සිදු කරන බලපෑම් තුළින් මුදල් සැපයුම වෙනස් කිරීම මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් සිදු වේ. මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන උපකරණ ලෙස මුදල් සැපයුමත්, පොළී අනුපාතයත් හැඳින්විය හැකිය.

### පිස්කල් ප්‍රතිපත්තිය

රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම හා රාජ්‍ය ණය වෙනස් කිරීමට පියවර ගැනීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු කෙරේ. රජයේ වියදම් ද, රජයේ බදු ද, රාජ්‍ය ණය ද පිස්කල් ප්‍රතිපත්තියේ ප්‍රධාන උපකරණ ලෙස සැලකේ.

### සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය

නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා පහසුකම් සැපයීම සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. පෞද්ගලීකරණය, නියාමනහරණය, බදු ප්‍රතිසංස්කරණය, යනාදිය සිදු කිරීම තුළින් සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරේ.

### ආදායම් ප්‍රතිපත්තිය

වැටුප් අනුපාත සහ භාණ්ඩ මිල ඉහළ යාමේ වේගය අඩු කිරීම සඳහා නීති මගින් ද, පෙළඹවීමෙන් ද පියවර ගැනීම ආදායම් ප්‍රතිපත්තිය වශයෙන් හැඳින්වේ.

### විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

නිදහස් අන්තර්ජාතික වෙළෙඳාමට බලපෑම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය වශයෙන් හැඳින්වේ. තීරු බදු, අපනයන සහනාධාර, ආනයන අපනයන සලාකනය, විනිමය අනුපාතිකයට ගැළපුම් කිරීම, ප්‍රපාතනය, අභිමතය පරිදි කෙරෙන අපනයන සීමා යනාදිය විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියේ ප්‍රධාන උපකරණ වේ.

### ඍජු පාලන ප්‍රතිපත්තිය

සම්පත්වල හිමිකාරිත්වයත්, ව්‍යාප්තියත් වෙනස් කිරීම ද, වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන මිල ගණන්වලට බලපෑම් කිරීම සඳහා ද යොදා ගන්නා ක්‍රියාමාර්ග ඍජු පාලන ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

## ව්‍යාපාර චක්‍රය හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම
(Trade Cycle and Its Impact on Business)

කාලයත් සමග මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ හා පහළ යාම හැඳින්වෙන්නේ ව්‍යාපාර චක්‍ර (Business Cycles) ලෙස ය.

නිෂ්පාදනය දිගු කාලයක් තිස්සේ අඛණ්ඩ ලෙස ඉහළ යාම ආර්ථික ප්‍රසාරණයක් හෙවත් ආර්ථික උත්පාතයක් ලෙස හඳුන්වනු ලබයි. එලෙසම නිෂ්පාදනය පහළ වැටීම ආර්ථික පසුබැසීමක් හෙවත් ප්‍රතිගමනයක් ලෙස හඳුන්වනු ලබන අතර එම පහත වැටීම දිගුකාලයක් පැවතීම ආර්ථික අවපාතයක් හෙවත් පරිහානියක් ලෙස සැලකේ. ආර්ථික පසුබැසීමක් කෙටි කාලයක් තුළ සිදු විය හැකි වුවද ආර්ථික ප්‍රසාරණයක් සඳහා දිගු කාලයක් ගත වේ. ව්‍යාපාර චක්‍රය තුළ විවිධ වූ අවධි හතරක් දැක ගත හැක. ඒවා නම්,

- මුදුණත
- පතුළ
- පසු බැසීමේ අවධිය
- ප්‍රසාරණ අවධිය

ලෙස සැලකේ. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටෙන කාලපරිච්ඡේදය පසු බැසීමේ අවධිය ලෙස සැලකෙන අතර මෙම කාලච්ඡේදය තුළදී නිෂ්පාදනය මෙන්ම සේවා නියුක්තිය ද පහත වැටේ. ආර්ථික පසු බැසීමේ අවධිය අවසන් වී නැවත ප්‍රසාරණ අවධිය ආරම්භ වන්නේ පතුල ලෙස හැඳින්වෙන අවධියේදී ය. පසු බැසීමේ පහළම අවස්ථාව ලෙස පතුළ හැඳින්වේ. ප්‍රසාරණ අවධියේ ඉහළම අවස්ථාව මුදුණත වන අතර ආර්ථික ක්‍රියාවලියේ පතුළ සිට මුදුණත දක්වා ගමන් කරන කාලය ප්‍රසාරණ අවධිය ලෙස හඳුන්වනු ලැබේ.

ආර්ථිකය සතු සම්පත් සම්භාරයත්, ඒවායේ ඵලදායිතාවත් මත විභව නිමවුම තීරණය කෙරේ. විභව නිමවුම මට්ටම තුළින් පෙන්නුම් කරනුයේ ආර්ථිකයේ දිගු කාලීන ආර්ථික වෘද්ධියේ හැකියාව ය. විභව නිෂ්පාදන මට්ටම යනු ආර්ථිකයේ සියලුම නිෂ්පාදන සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව උපයෝජනය කරන විට බිහි වන මූර්ත දළ දේශීය නිෂ්පාදිතයයි. එනම් ආර්ථිකයේ උපරිම නිමවුම් මට්ටම විභව නිමවුම මගින් පෙන්නුම් කෙරේ.

සැබෑ නිමවුමත් විභව නිමවුමත් අතර වෙනස හෙවත් අඩු වැඩි වීම නිමවුම් පරතරය ලෙස හැඳින්වේ. ආර්ථිකයේ නිමවුම් පරතරය අඩු කරමින් විභව නිමවුම් මට්ටමට ළඟා කරවීම ආර්ථික ස්ථායිකරණය වන අතර ඒ සඳහා භාවිත කරන ආර්ථික ප්‍රතිපත්ති සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

## සාර්ව ආර්ථික අරමුණු

- **<u>මිල ස්ථායිතාවය</u>**
  උද්ධමනයක් හෝ අවධමනයකින් තොරව ආර්ථිකය ස්ථාවරව පවත්වා ගෙන යාම මිල ස්ථායිතාවය ලෙස හැඳින්වේ.
- **<u>පූර්ණ සේවා නියුක්තිය</u>**
  ආර්ථිකය සතු සියලුම සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කිරීම පූර්ණ සේවා නියුක්තිය ලෙස අදහස් වේ.
- **<u>ගෙවුම් ශේෂ සමතුලිතතාවය</u>**
  විදේශ රටවල් සමග සිදු කරන ගණුදෙනු වලදී ගෙවුම් ශේෂ අර්බුද වලින් තොරව ආර්ථිකය පවත්වා ගෙන යාම මින් අදහස් වේ.
- **<u>සාධාරණත්වය</u>**
  සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇතිකරලීම මින් අදහස් වේ. එනම් ආර්ථිකයක සියලුම පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි ආදායම ධනය බෙදා හැරීමයි.
- **<u>තිරසාර සංවර්ධනය</u>**
  පරිසරයේ ගුණාත්මක බව රැක ගනිමින් නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමත් සියලු ජන කොටස් අතර සාධාරණව ප්‍රතිලාභ බෙදී යාමටත් සැලැස්වීම තිරසාර සංවර්ධනය ලෙස හැඳින්වේ.
- **<u>ආර්ථික වර්ධනය</u>**
  රටක මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාම ආර්ථික වර්ධනයක් ලෙස අදහස් කෙරේ.

↓

## සාර්ව ආර්ථික අරමුණු අතර පවතින ගැටුම්

- ඉහළ ආර්ථික වරධනයක් සහ අඩු උද්ධමනයක්
- ඉහළ ආර්ථික වර්ධනය සහ ගෙවුම් ශේෂ සමතුලිතතාවය
- පූර්ණ සේවා නියුක්තිය හා අඩු උද්ධමනය
- ආර්ථික වර්ධනය හා පරිසරය
- ආර්ථික වර්ධනය හා සමානාත්මතාව

## ආර්ථික ප්‍රතිපත්ති

- **<u>මූල්‍ය ප්‍රතිපත්තිය</u>**
  මුදල් සැපයුම, ණය සැපයුම, පොලී අනුපාතිකයට සිදු කරන බලපෑම් තුළින් මුදල් සැපයුම වෙනස් කිරීම මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් සිදු වේ.
- **<u>පිස්කල් ප්‍රතිපත්තිය</u>**
  රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම හා රාජ්‍ය ණය වෙනස් කිරීමට පියවර ගැනීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු කෙරේ.
- **<u>සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය</u>**
  නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා පහසුකම් සැපයීම සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ.
- **<u>ආදායම් ප්‍රතිපත්තිය</u>**
  වැටුප් අනුපාත සහ භාණ්ඩ මිල ඉහළ යාමේ වේගය අඩු කිරීම සඳහා නීති මගින් ද පෙළඹවීමෙන් ද පියවර ගැනීම ආදායම් ප්‍රතිපත්තිය වශයෙන් හැඳින්වේ.
- **<u>විදේශ වෙළඳ ප්‍රතිපත්තිය</u>**
  නිදහස් අන්තර්ජාතික වෙළදාමට බලපෑම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම විදේශ වෙළඳ ප්‍රතිපත්තිය වශයෙන් හැඳින්වේ.

- ❖ <u>සෘජු පාලන ප්‍රතිපත්තිය</u>

  සම්පත්වල හිමිකාරීත්වයත් ව්‍යාප්තියත් වෙනස් කිරීමද, වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන මිල ගණන්වලට බලපෑම් කිරීම ද සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග සෘජු පාලන ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

## ව්‍යාපාර චක්‍ර

- ❖ <u>ප්‍රසාරණ අවධිය</u>

  ආර්ථික කටයුතු අඛණ්ඩව වර්ධනය වෙමින් ඉහළට ගමන් කරන අවධිය ප්‍රසාරණ අවධිය ලෙස හඳුන්වයි.

- ❖ <u>මුදුනත</u>

  ප්‍රසාරණ අවධියේ උච්චතම අවස්ථාව මුදුනත ලෙස සැලකේ.

- ❖ <u>පසු බැසීමේ අවධිය</u>

  සමස්ත ආර්ථික ක්‍රියාවලිය දුර්වල වීමක් පසු බැසීමේ අවධිය තුළින් පෙන්නුම් කෙරේ.

- ❖ <u>පතුල</u>

  ආර්ථික පසු බැසීමකට ලක්වීම අවසාන වී නැවත ප්‍රසාරණය ආරම්භ වන අවධිය පතුල ලෙස සැලකේ.

## ආයතනික ඒකක

- ❖ මූල්‍ය නොවන සමාගමික අංශය (Non-Financial Corporation Sector)
- ❖ මූල්‍ය සමාගමික අංශය (Financial Corporate Sector)
- ❖ රාජ්‍ය අංශය (General Government)
- ❖ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය (Non Profit Institutions Serving Household Sector)
- ❖ ගෘහ ඒකක / කුටුම්භ අංශ (Household Sector)
- ❖ නේවාසික නොවන කුටුම්භ සමාගමික අංශය -අවශේෂ ලෝකය (Rest of the World –ROW)

## ජාතික ආදායම

- ❖ <u>**නිෂ්පාදන ප්‍රවේශය-**</u>

  කිසියම් ආර්ථිකයක කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත නිෂ්පාදනය කරන ලද සියලුම අවසාන නිෂ්පාදිතයන්ගේ වටිනාකම ගණනය කිරීම දළ දේශීය නිෂ්පාදිතය වන අතර මෙම ප්‍රවේශය තුළින් එහි අගය ගණනය කිරීම සිදු කෙරේ.

- ❖ <u>**ආදායම් ප්‍රවේශය**</u>

  නිෂ්පාදන ක්‍රියාවලියක් තුළදී එයට අදාළ කරගත් සියලුම නිෂ්පාදන සාධක සඳහා කරනු ලබන ගෙවීම් හෙවත් සාධක ඉපයීම් පදනම් කරගෙන නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කිරීම ආදායම් ප්‍රවේශය තුළින් සිදු කෙරේ. මෙලෙස ගණනය කරනු ලබන ආදායම ශුද්ධ දේශීය ආදායම ලෙස හඳුන්වනු ලැබේ.

- ❖ <u>**වියදම් ප්‍රවේශය**</u>

  දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම එම නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා දරනු ලබන වියදම ගණනය කිරීම වියදම් ප්‍රවේශය ඔස්සේ සාකච්ඡා කෙරේ.

**ජාතික ආදායමට සම්බන්ධ සංකල්ප**

- **දළ දේශීය නිෂ්පාදිතය**
  කිසියම් රටක දේශසීමාවලින් වෙන් කොට ඇති භූගෝලීය ප්‍රදේශ තුළ නිපදවෙන අවසාන නිෂ්පාදිතයේ වටිනාකමයි.


- **දළ ජාතික නිෂ්පාදිතය**
  සලකා බලන වර්ෂය තුළ රටේ වැසියන්ට හිමි වන අවසාන නිෂ්පාදිතයේ ප්‍රමාණයයි.

- **ශුද්ධ ජාතික නිෂ්පාදිතය**
  දළ ජාතික නිෂ්පාදිතයෙන් ප්‍රාග්ධන ක්ෂය වීම අඩු කළ විට ශුද්ධ ජාතික නිෂ්පාදිතය ලැබේ.

- **වෙළෙඳපොළ මිල සහ සාධක පිරිවැය මිල මත නිෂ්පාදනය**
  සාධක පිරිවැය මිල යටතේ ගණනය කරනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට ශුද්ධ වක්‍ර බදු එකතු කළ විට වෙළෙඳපොළ මිල යටතේ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ලැබේ.

- **ස්ථාවර මිලට නිෂ්පාදිතය**
  වර්තන මිල යටතේ ගණනය කරන ලද නිෂ්පාදිතයේ වටිනාකමින් මිල වෙනස් වීම් ඉවත් කොට සකසා ගන්නා ලද ඇස්තමේන්තුව.

- **ඒක පුද්ගල ආදායම**
  ජාතික නිෂ්පාදිතයෙන් පුද්ගලයෙකුට ලැබෙන කොටස ඒක පුද්ගල ආදායම යනුවෙන් හැඳින්වේ.



# 05. මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම්

## මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම

### මුදල් භාවිතයට පෙර යුගය

අතීතයේ දී පුද්ගලයින් තමන්ට අවශ්‍ය දෑ තමන් විසින්ම නිෂ්පාදනය කර ගන්නා ලදී. එනම් එදිනෙදා තමන්ට අවශ්‍ය කරන සියළුම භාණ්ඩ හා සේවාවන් තමන් විසින්ම සපයා ගන්නා ලදී මෙම ක්‍රමය සෘජු නිෂ්පාදනය ලෙස හඳුන්වන ලදී. නමුත් කල් යත්ම මිනිස් වුවමනා වර්ධනය වීම නිසා තමන්ට අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවා තමා විසින්ම නිපදවා ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර විය.

එයට විකල්පයක් ලෙස තමන්ට වඩාත් කාර්යක්ශමව නිපදවිය හැකි භාණ්ඩ අතිරික්ත වශයෙන් නිෂ්පාදනය කොට එම් අතිරික්ත නිෂ්පාදනය තවත් පුද්ගලයෙක් සතුව ඇති අතිරික්ත නිෂ්පාදනය සමඟ හුවමාරු කර ගැනීම්ට පුද්ගලයන් පෙළඹිණි.

මෙය භාණ්ඩ හුවමාරුව හෙවත් බටර් ක්‍රමය ලෙස හඳුන්වනු ලබයි. කල්යත්ම මෙම භාණ්ඩ හුවමාරු ක්‍රමයේද විවිධ දුෂ්කරතා ඇතිවිය ඒවා පහත පරිදි දැක්විය හැක.

- ...................................................................................... - එනම් හුවමාරුවට සම්බන්ධ වන පාර්ශවයන් දෙකෙහි වුවමනාවන් ගේ නොගැලපීමක් ඇති වීම
- ......................................................................................
- ......................................................................................
- කුඩා කොටස් වලට බෙදීම අපහසු වීම
- රැගෙන යාම අපහසු වීම්
- ගබඩා කර තබා ගැනීමේ අපහසුතාවය
- සේවාවන් හුවමාරු කර කර ගැනීමට අපහසු වීම
- ආර්ථික ප්‍රසාරණයට බාධා ඇතිවීම

### මුදල් භාවිතයට පැමිණීම

මේ අනුව භාණ්ඩ හුවමාරුවේ පැවති ඉහත දුෂ්කරතා හේතුකොටගෙන භාණ්ඩ හා සේවා හුවමාරු ක්‍රියාවලිය සඳහා අතරමැදි මාධ්‍යයක අවශ්‍යතාවය වඩාත් පුළුල් විය.

# මුදල්

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

එනම් මූල්‍ය බලාධිකාරයක් විසින් නිකුත් කරනු ලබන පොදුවේ පිළිගන්නා ඕනෑම කාසියක් හෝ නෝට්ටුවක් මුදල් ලෙස අර්ථකථනය කරයි.

(වර්තමානයේ අප විසින් භාවිතා කරනු ලබන මුදල් භාවිතයට පැමිණීමට පෙර අතරමැදි මාධ්‍යයක් ලෙස මුල් අවදියේදී සිප්පිකටු, දුම්කොළ, ගල් කැබලි, සත්ත්ව ඇටකටු ආදිය ද පසුව රන්, රිදී, තඹ වැනි ලෝහමය වටිනාකමක් ඇති දෑද භාවිතා කොට ඇත. )

## හොඳ මුදලක ලක්ෂණ

- ..........................................................................................................................
- ..........................................................................................................................
- ..........................................................................................................................
- කල් පවත්නා බව.
- පහසුවෙන් රැගෙන යා හැකි වීම.
- සමජාතීය බව.
- වටිනාකම ස්ථාවරව පැවතීම.
- නෛසර්ගික අගයක් නො පැවතීම.
- සාපේක්ෂව සුලබ හෝ දුලබ නොවීම.
- ව්‍යාජ මුදල් නො තිබීම / අනුකරණය අපහසු වීම.
- නීත්‍යානුකූල වලංගුභාවය.

## මුදලේ කාර්යයන්

මුදලේ අපේක්ෂිත කාර්යයන් 4කි ඒවා නම්

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................

## මුදලේ කාර්යයන් පුළුල්ව විස්තර කිරීම

### හුවමාරු මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

හුවමාරු මාධ්‍යයක් / විනිමය මාධ්‍යයක් / ගෙවුම් මාධ්‍යයක් යන්නෙන් අදහස් කරනුයේ, භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී අතරමැදියෙකු ලෙස මුදල් ක්‍රියා කරන බව යි. මුදල් පූර්ණ ද්‍රවශීල වත්කමක් වන්නේ ද මේ නිසා ය. මුදලේ මෙම කාර්යය නිසා මුදල් වෙනත් වත්කම්වලින් පැහැදිලි ව වෙන්කොට හඳුනාගත හැකි ය.

### වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම

අනාගත ප්‍රයෝජනය සඳහා අගය හෝ ක්‍රය ශක්තිය රැස්කර තබා ගැනීමේ මාධ්‍යයක් ලෙස මුදල් කටයුතු කරන බව මින් අදහස් වේ. අවදානමකින් සහ අපහසුවකින් තොරව වටිනාකම රැස්කොට තබා ගැනීම සඳහා වඩාත් යෝග්‍ය මාධ්‍යය වන්නේ මුදල් ය. මෙය ක්‍රය ශක්තිය රැස්කර තබා ගැනීමක් ලෙස ද හැඳින් වේ.

### ගිණුම් ඒකකයක්  ලෙස කටයුතු කිරීම

සෑම භාණ්ඩයක ම හා සේවාවක ම වටිනාකම පොදු ඒකකයකින් ප්‍රකාශ කිරීම සඳහා මුදල් යොදාගත හැකි බව මින් අදහස් වේ. භාණ්ඩ හා සේවාවල වටිනාකම මුදල් ඒකකවලින් ප්‍රකාශ කරන විට එය ''මිල'' ලෙස හැඳින් වේ.

### විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

කල්පසු වී කරනු ලබන ගෙවීම් කාර්යක්ෂම ලෙස සිදු කිරීමේ මාධ්‍යයක් ලෙස මුදල් යොදාගත හැකි බව මින් අදහස් වේ. එනම් අනාගතයේ දී සිදු කරනු ලබන ගෙවීම් සම්බන්ධ ගනුදෙනු මුදල් භාවිතයෙන් සිදු කළ හැකි වීම යි.

## මුදලේ ඉහත කාර්යයන් ඉටු කිරීමට ඇති බාධා

- උද්ධමනය සමඟ මුදලේ අගය අඩුවීම
- මුදල් ළඟ තබා ගැනීමේ අවදානම
- මුදලට ආවස්ථික පිරිවැයක් පැවතීම
- මුදල් වලට වඩා පහසු මාධ්‍යයන්හි ඇති සුලභතාවය
- තාක්ෂණික දියුණුව

## මුදල් වර්ග

### ව්‍යවහාර මුදල්

කිසියම් රටක් තුල ඕනෑම ගනුදෙනුවක් පියවීම සඳහා නීතියෙන් වලංගු යැයි නියෝග කොට රජය හෝ රජය වෙනුවෙන් රටේ මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු ව්‍යවහාර මුදල් නම් වෙයි.

උදා :- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වේ.**

### බැංකු මුදල්

චෙක්පත් ලිවීම මගින් ප්‍රයෝජනයට ගත හැකි බැංකු තැන්පතු, බැංකු මුදල් හෙවත් ඉල්ලුම් තැන්පතු ලෙස හැඳින් වේ. බැංකු මුදල් ද ඉතා ඉහළ ද්‍රවශීලතාවක් සහිත වත්කමක් වේ. බැංකු මුදල් ගනුදෙනු සිදුකිරීමට භාවිත කරන මාධ්‍යය චෙක්පත් වන අතර, චෙක්පත් මුදල් වර්ගයක් නොව උපකරණය කි.

### ආසන්න මුදල්

හුවමාරු මාධ්‍යක් ලෙස මුදලේ කාර්යය ඉටු නො කරන, එහෙත් වටිනාකමේ සන්නිධියක් ලෙස මුදලේ කාර්යය ඉටු කරනු ලබන, ඉතා ඉක්මනින් හුවමාරු මාධ්‍යක් බවට පත්කළ හැකි මූල්‍ය වත්කම් ය

උදා :- ඉතුරුම් තැන්පතු ල ස්ථාවර තැන්පතු

### මුදල් ආදේශක

වටිනාකමේ සන්නිධියක් ලෙස මුදලේ කාර්යය ඉටු නො කරන එහෙත් තාවකාලික හුවමාරු මාධ්‍යක් ලෙස මුදලේ කාර්යය ඉටු කරන මාධ්‍යන් ය.

උදා :- ණයපත්

### වීද්‍යුත් මුදල්

මුදල්, විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් ගබඩා කොට තබා මෘදුකාංගයක් මගින් ගණුදෙනු සඳහා යොදා ගන්නා ක්‍රමවේදය විද්‍යුත් මුදල් වශයෙන් ලෙස හැඳින් වේ.

උදා :- E Banking , Easy Cash

## විද්‍යුත් මුදල් භාවිතා කරන ආකාරය

- එකම ආයතනයේ ඇති ගිණුම් දෙකක් අතර මුදල් මාරු කිරීම සඳහා
- වෙනත් ශාඛාවක සංචාරක ගිණණුමකට මුදල් මාරු කිරීම
- කොටස් වෙළඳපොළට මුදල් මාරු කිරීම
- එකම ආයතනයේ හෝ බාහිර ආයතනයක ඇති අනෙකුත් පවුලේ සාමාජිකයින්ගේ ගිණනුම්වලට මුදල් මාරුකිරීම
- පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට ගෙවීම් කිරීම
- බිල්පත් සඳහා ගෙවීම් කිරීම

## විද්‍යුත් මුදල් භාවිතා කිරීමට හේතු

- පහසුවෙන් හා ඉක්මනින් ගෙවීම් කළ හැකි වීම.
- ජාත්‍යන්තර ගනුදෙනු සිදුකළ හැකි වීම
- භෞතික මුදල් වලට වඩා ආරක්ෂාකාරී වීම
- බැංකු වල අභ්‍යන්තර ජාල සඳහා සම්බන්ධ විය හැකි වීම
- වාණිජ ආයතන අතර පවත්නා තරගකාරීත්වය නිසා

## විද්‍යුත් මුදල් භාවිතා කිරීමේ වාසි හා අවාසි

**වාසි**

- රැගෙන යාම හා භාවිතා කිරීම පහසු වීම
- ගෙවීම් පියවීම් ඉක්මන් වීම හා කාලය ඉතුරු වීම
- අවදානම අඩු වීම්
- ලෝකයේ ඕනෑම තැනකින් ගෙවීම් සිදු කිරීමට භාවිතා කළ හැකි වීම
- ඉහළ සමාජ පිළිගැනීම්

**අවාසි**

- තව කෙනෙකුට පැවරිය නො නොහැකි වීම
- නෛතිකමය පිළිගැනීම් අඩු බව
- ඉක්මනින් යල් පැන යෑම
- තාක්ෂණික මය ගැටලු
- ඉතා පුළුල් ව ව්‍යාප්ත වූ තොරතුරු තාක්ෂණ යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වීම

**මුදල් ඉල්ලුම** (Money Demand)

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

## මුදලට ඉල්ලුමක් ඇති වීමට හේතු


.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

## ගනුදෙනු චේතනාව යටතේ මුදලට කරනු ලබන ඉල්ලුම්


පුද්ගලයෙකුට ආදායම් ලැබීමත් වියදම් දැරීමත් එකිනෙකට සමපාත නොවන නිසා එදිනෙදා සිදුවන ගනුදෙනු සුමටව ඉටුකර ගැනීම සඳහා මුදල් ශේෂ වලට කරනු ලබන ඉල්ලුම මින් අදහස් වේ ගනුදෙනු චේතනාව යටතේ මුදල්ට ඇති ඉල්ලුම තීරණය වන්නේ පුද්ගල ආදායම මතයි. පුද්ගල ආදායමත් ගනුදෙනු චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුමත් අතර අනුලෝම හෙවත් ධන සම්බන්ධතාවයක් පවතී.එනම් පුද්ගල ආදායම් ඉහළ යනවිට ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම ඉහළ යන අතර ආදායම පහළ යන විට ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම පහල යයි මෙය පහත ප්‍රස්ථාරය මගින් දැක්විය හැකිය.




## ආරක්ෂණ චේතනාව යටතේ මුදලට කරනු ලබන ඉල්ලුම

පුද්ගලයෙකුට ආදායම් ලැබීමත් වියදම් දැරීමත් එකිනෙකට සමපාත නොවන නිසා අනපේක්ෂි;ව හට.; හැකි වියදම් කාර්යක්ෂමව පියවාර ගැනීමට මුදල් ශේෂ ළග තබා ගැනීම ආරක්ෂණ චේනාවෙන් මුදලට කරන ඉල්මලු ලෙස හැඳින් වේ.


ආරක්ෂණ චේතනාව යටතේ මුදල්ට ඇති ඉල්ලුම තීරණය වන්නේ ද පුද්ගල ආදායම මතයි. පුද්ගල ආදායමත් ආරක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුමත් අතර අනුලෝම හෙවත් ධන සම්බන්ධතාවයක් පවතී.එනම් පුද්ගල ආදායම් ඉහළ යනවිට ආරක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම ඉහළ යන අතර ආදායම පහළ යන විට ආරක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම පහල යයි. මෙය පහත ප්‍රස්ථාරය මගින් දැක්විය හැකිය.



## සමපේක්ෂණ චේතනාව යටතේ මුදල්ට කරනු ලබන ඉල්ලුම

පිළිනපත්වල මුදල් ආයෝජනය කිරීම තුළින් අනාගත ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් මුදල් ශේෂ ළඟ තබාගැනීම සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම ලෙස අදහස් කෙරේ. සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම තීරණය කරනු ලබන්නේ පොලී අනුපාතය මගිනි. පොලී අනුපාතයක් සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අතර ප්‍රතිලෝම හෙවත් ඍන සම්බන්ධතාවයක් පවතී එනම් පොලී අනුපාතය අඩුවන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම වැඩිවන අතර පොලී අනුපාතය වැඩි වනවිට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අඩු වේ

මෙය පහත ප්‍රස්ථාරය මගින් දැක්විය හැකිය.



## මුදලට ඇති ඉල්ලුම තීරණය කරන සාර්ව ආර්ථික විචල්‍යයන්

.............................................................................................................................................

මූර්ත ආදායම හා මුදලට ඇති ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී

.............................................................................................................................................

පොලී අනුපාතිකය හා මුදලට ඇති ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී

.............................................................................................................................................

මිල මට්ටම් හා මුදලට ඇති ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතී. භාණ්ඩ හා සේවා වල මිල ගණන් වැඩි වීමේ දී ඒවාට කලින් ගෙවූ මුදලට වඩා වැඩි මුදලක් ගෙවීමට සිදු වීම මීට හේතුවයි

.............................................................................................................................................

මුදල් ළඟ තබා ගැනීම සඳහා තාක්ෂණයෙන් ඇතිවන බලපෑම මින් අදහස් වේ මෙම නව්‍යතාවයන් නිසා මුදල් ශේෂ ළඟ තබාගැනීම අඩුවේ

.............................................................................................................................................

පිලිනපත්වල මිල අනාගතයේදී ඉහළ යයි යන අපේක්ෂාවෙන් වර්තමානයේ පිළිනපත් මිලදී ගැනීමට පෙළඹෙන අතර මුදල් ශේෂ ළඟ තබා ගන්නා ප්‍රමාණය අඩුවේ

.............................................................................................................................................

ආයතනික සාධක යනු ආදා ආදායම් ලැබෙන වාර දෙකක් අතර කාල පරාසයයි එම කාල පරාසය අඩු නම් මුදල් ශේෂ සඳහා කරනු ලබන ඉල්ලුම් පහළ යන අතර එම කාල පරාසය වැඩි නම් මුදල් ශේෂ සඳහා කරනු ලබන ඉල්ලුම්ද වැඩි වේ.

## මුදල් සැපයුම

කිසියම් නිශ්චිත අවස්ථාවකදී මහජනතාව අතර සංසරණය වන මුළු මුදල් තොගය මුදල් සැපයුම හෙවත් මූල්‍ය සමස්තය ලෙස හැඳින් වේ. රටක මුදල් සැපයුම තුළ පහත පරිදි විවිධ නිර්වචනයන් (සංකල්ප) දක්නට ලැබේ.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

## පටු මුදල් සැපයුම ($M_1$)

කිසියම් නිශ්චිත අවස්ථාවක දී මහජනතාව සතු ව්‍යවහාර මුදල් හා මහජනයා නමින් වාණිජ බැංකු වල ඇති ඉල්ලුම් තැන්පතු වල එකතුව පටු මුදල් ලෙස හැඳින්වේ.

$$M_1 = C_p + DD_p$$

$M_1$ = පටු මුදල් සැපයුම

$C_p$ = මහජනයා සතු ව්‍යවහාර මුදල්

$DD_p$ = මහජනයා සතු වාණිජ බැංකු වල ඇති ඉල්ලුම් තැන්පතු

## පුළුල් මුදල් සැපයුම ($M_2$)

කිසියම් නිශ්චිත අවස්ථාවක දී පටු මුදල් සැපයුම හා මහජනතාව සතු වාණිජ බැංකු වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු වල එකතුව පුළුල් මුදල් ලෙස හැඳින්වේ.

$$M_2 = M_1 + TSD_{CP}$$

$M_2$ = පුළුල් මුදල් සැපයුම

$M_1$ = පටු මුදල් සැපයුම

$TSD_{CP}$ = මහජනයා සතු වාණිජ බැංකු වල කාලීන හා ඉතුරුම් තැන්පතු

### ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)

පුළුල් මුදල් සැපයුමට අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50% ක් හා විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය එකතු වීමෙන් ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2B}$) සෑදේ.

$$M_{2b} = M_2 + TSD_{NRFC} + RD_{FCBU}$$

$TSD_{NRFC}$ = අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50%

$RD_{FCBU}$ = විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු

### වඩාත් පුළුල් මුදල් සැපයුම (M4)

ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු එකතු වීමෙන් වඩාත් පුළුල් මුදල් සැපයුම ලැබේ.

$$M_4 = M_{2b} + LSB + REC$$
$$M_4 = M_1 + \text{ආසන්න මුදල්}$$

LSB = මහජනතාව සතු ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

REC = ලියාපදිංචි මූල්‍ය සමාගම් වල ඇති මහජනතාව සතු ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

### මුදල් සැපයුම තීරණය වන සාධක

රටක මුදල් බිහිකරනු ලබන්නේ මහ බැංකුව හා වාණිජ බැංකු මගිනි. ඒ අනුව මුදල් සැපයුම තීරණය කරන සාධක පහත පරිදි හඳුනාගත හැකිය.

- බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම් - බැංකු ක්‍රමය මගින් රජයට ලබා දෙන ශුද්ධ ණය හා වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණය වලින් බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම් සමන්විත වේ.
- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම් - මහ බැංකුව සහ වාණිජ බැංකු සතු විදේශ වත්කම් හා වගකීම් අතර වෙනස බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් ලෙස හැඳින්වේ.
- බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම්

### පදනම් මුදල් (අධිබලැති මුදල්)

කිසියම් රටක සමස්ත මුදල් සැපයුමට පදනම සපයන මහ බැංකුව සතු ඍජු මූල්‍ය වගකීම් පදනම් මුදල් හෙවත් අධි බලැති මුදල් වශයෙන් හැඳින් වේ.

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

$$H = C_p + C_B + RR + D_{0I}$$

- මහජනයා සතු ව්‍යවහාර මුදල් ($C_p$)
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ($C_{CB}$)
- වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු (RR)
- රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු ($D_{0I}$)

## ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය (Financial System of Sri Lanka)

දේශීය විදේශීය කුටුම්භ, ව්‍යාපාරික ආයතන, රජය යන ප්‍රධාන ආර්ථික ඒකකයන්ගේ මූල්‍ය තීරණයන් ක්‍රියාත්මක කරන වෙළඳපොළවල්, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ සහ මූල්‍ය යටිතල පහසුකම් යනාදියෙහි එකතුවක් මූල්‍ය පද්ධතියක් ලෙස හැඳින් වේ. මූල්‍ය පද්ධතිය පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ.

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

## මූල්‍ය ආයතන

විවිධ මූල්‍ය උපකරණ ආශ්‍රිතව ගනුදෙනු වල යෙදී සිටිමින් විවිධ මූල්‍ය සේවාවන් සපයන ආයතන මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන ව්‍යුහය කොටස් 4 කින් යුක්ත වේ. ඒවා නම්,

- අතරමැදි මූල්‍ය ආයතන
- මූල්‍ය සේවා සපයන ආයතන

### අතරමැදි මූල්‍ය ආයතන

අතිරික්ත අරමුදල් ඇති ඒකක වලින් ඉතුරුම් ඒකරාශී කර ගැනීමත්, අරමුදල් හිඟ ඒකක වලට එම ඉතුරුම් ලබා දීම මගින් ලාභ උපයා ගැනීමත් සිදු කරන ආයතන අතරමැදි මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ එවැනි අතරමැදි මූල්‍ය ආයතන ලෙස රක්ෂණ සමාගම්, ඒකකභාර, කල්බදු සමාගම්, අර්ථසාධක හා විශ්‍රාම අරමුදල් හා තැන්පතු බාර ගැනීම සහ එමගින් බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති ආයතන දැක්විය හැකිය.

### මූල්‍ය සේවා සපයන ආයතන

මහජනතාවට සහ ව්‍යාපාර ආයතන වලට මූල්‍ය වෙළඳපොලේ සිදුවන ගනුදෙනු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවා සපයන ආයතන මූල්‍ය සේවා සපයන ආයතන ලෙස හැඳින්වේ. උදාහරණ ලෙස වණික් බැංකු, අරමුදල් කළමනාකරණ ආයතන, මූල්‍ය තැරැව්කාර ආයතන සහ ආණ්ඩුවේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළෙඳුන් දැක්විය හැකිය.

## මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන

මූල්‍ය පද්ධතියක ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම සඳහා අණපනත් හා රෙගුලාසි කටයුතු ඉටු කිරීමට රජය විසින් ස්ථාපිත කර ඇති ආයතන මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන නම් වේ. මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවල ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය හැඳින්විය හැකිය.

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතන වර්ග කර ඇති ආකාරය

- මහ බැංකුව
- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- සමූපකාර හා ණය ගනුදෙනු සමූපකාර සමිති
- විශේෂිත මූල්‍ය ආයතන
  - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
  - ප්‍රාථමික අලෙවිකරුවන්
  - කොටස් තැරැව්කරුවන්
  - ඒකක භාර / ඒකකභාර කළමනාකරණ සමාගම්
  - වෙළඳපොළ අතරමැදියන්
  - ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
- ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන
  - රක්ෂණ සමාගම්
  - සේවක අර්ථසාධක අරමුදල
  - සේවක භාරකාර අරමුදල
  - අනුමත විශ්‍රාම හා අර්ථ සාධක අරමුදල
  - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

## මූල්‍ය වෙළෙඳපොළ

කෙටි කාලීන හා දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය උපකරණ මිලට ගැනීම හා විකිණීම සිදු කරන සමස්ත වෙළෙඳපොළ මූල්‍ය වෙළෙඳපොළ ලෙස හැඳින්වේ. මූල්‍ය වෙළඳපොළෙහි ප්‍රධාන අංශ දෙකකි. එනම්,

- මුදල් වෙළෙඳපොළ
- ප්‍රාග්ධන වෙළෙඳපොළ

## මුදල් වෙළෙඳපොළ

මුදල් වෙළෙඳපොළ යනු වසරකට අඩු කාලයක් තුළදී පරිණත වන භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා හා තැන්පතු සහතිකපත් වැනි පොළී උපයන කෙටි කාලීන වත්කම් වෙළඳාම සිදුවන වෙළඳපොළ යි. මුදල් වෙළඳපොළ පහත සඳහන් උප වෙළඳපොළවල් වලින් සමන්විත වේ.

- අන්තර් බැංකු ඒක්ෂණ ණය මුදල් වෙළෙඳපොළ
- භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
- වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ

## ප්‍රාග්ධන වෙළෙඳපොළ

වර්ෂයකට වඩා වැඩි කාලයකදී පරිණත වන එනම්, දිගුකාලීන මූල්‍ය උපකරණ හා සමාගම් වල කොටස් යනාදිය හුවමාරු වන වෙළඳපොළ ප්‍රාග්ධන වෙළඳපොළ යනුවෙන් හැඳින්වේ. ප්‍රාග්ධන වෙළෙඳපොළ පහත සඳහන් උප වෙළඳපොළවල් වලින් සමන්විත වේ.

- භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
- සමාගමික බැඳුම්කර වෙළෙඳපොළ
- කොටස් වෙළෙඳපොළ

## මූල්‍ය උපකරණ

ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ තුළ ගණුදෙනු වන මූල්‍ය උපකරණ පහත ආකාරයෙන් දැක්විය හැකිය.

### රජය නිකුත් කරන ණය උපකරණ

- භාණ්ඩාගාර බිල්පත්
- භාණ්ඩාගාර බැඳුම්කර
- රජයේ ණය සුරැකුම්පත්
- සමාගම් නිකුත් කරන ණය උපකරණ
- වාණිජ පත්‍රිකා
- ණයකර

### වාණිජ බැංකු භාවිතා කරන උපකරණ

- තැන්පතු සහතික
- වත්කම් පදනම් කරගත් සුරැකුම්පත්
- කල්බදු හෙවත් කුලී පිට ගැණුම්
- ඒක්ෂණ ණය
- ව්‍යාපාරික කොටස්

## ණය ශ්‍රේණිගත කිරීම

මූල්‍ය වෙළඳපොළ ප්‍රසාරණය වීමත් සමගම මූල්‍ය උපකරණ සංඛ්‍යාව වැඩි වීම නිසා ඒවායේ ආයෝජනය කරන ආයෝජකයන්ට එම උපකරණ වල ගුණාත්මක තත්වය හඳුනාගෙන ආයෝජන තේරීම් කිරීම සඳහා විධිමත් මගපෙන්වීමක් ලෙස ණය ශ්‍රේණිගත කිරීම හැඳින්විය හැකිය.

එනම් කිසියම් සමාගමක් හෝ ආයතනයක් හෝ පුද්ගලයෙක් ලබා ගන්නා ණය ඉදිරි කාලයේ දී අපහසුතාවයකින් තොරව ගෙවා නිම කිරීමේ හැකියාවක් ඇති බවට පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන සහතිකය ණය ශ්‍රේණිගත කිරීම ලෙස හැඳින්වේ. ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ලෙස මූඩීස් සමාගම, ස්ටෑන්ඩර්ඩ් හා පුවර්ස් සමාගම සහ ෆිච් ඇන්ඩ් රේටින්ග්ස් දැක්විය හැකිය.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යභාරය
(Objectives and Functions of Central Bank of Sri Lanka)

1949 අංක 58 දරන මුදල් නීති පනත මගින් 1950 අගෝස්තු 28 වන දින ජෝන් එක්සටර් මහතා ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකා ආර්ථිකයේ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම මූල්‍ය කටයුතු සඳහා උපදේශනය, ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම සඳහා පිහිටවූ ස්වාධීන ආයතනය මහ බැංකුවයි.

### ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙකකි.

..........................................................................................................................................

..........................................................................................................................................

- **ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වාගෙන යාම**

  අඩු උද්ධමන වේගයක් කරා ළඟා වීමට මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම ආර්ථික හා මිල ස්ථායීතාව ලෙස අදහස් කෙරේ.
- **මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම**

  මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව යනු ආර්ථික, මූල්‍ය, දේශපාලන හා වෙනත් ක්ෂේත්‍රයන්හි පැන නගින අභ්‍යන්තර හෝ බාහිර කම්පනයන් හමුවේ නොසැලී සිටීමේ හැකියාවයි.

### මහ බැංකුවේ කාර්යයන්

- ..........................................................................................................................
- ..........................................................................................................................
- ..........................................................................................................................
- සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය හා පරිපාලනය
- නිල විදේශ සංචිත කළමණාකරණය
- විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම
- නියෝජ්‍යාතන කටයුතු
- රජයේ උපදේශක බැංකුකරු හා මූල්‍ය නියෝජිත ලෙස කටයුතු කිරීම.
- කුඩා පරිමාණ මූල්‍යකරණය කටයුතු සහ ග්‍රාමීය ණය යෝජනා වැඩසටහන් පවත්වාගෙන යාම.

මූල්‍ය ප්‍රතිපත්තිය යනු ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය ප්‍රතිපත්තියේ ස්ථායීතාව යන අරමුණු වෙත ළඟා වීමට පොලී අනුපාතය හා මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීමට මූල්‍ය උපකරණ හැසිරවීමේ ක්‍රියාවලියයි. වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ අරමුණු කිහිපයකි. එනම්,

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

## මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ

ආර්ථික හා මිල ස්ථායීතාව හා මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව යන අරමුණු ඉටු කර ගැනීමට පොළී අනුපාතිකයට හා මුදල් සැපයුමට බලපෑම් කිරීමට මහ බැංකුව විසින් භාවිතා කරන උපකරණ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස හැඳින් වේ. මෙම මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ කොටස් දෙකකි. එනම්,

..........................................................................................................................................

..........................................................................................................................................

## ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ

ණය සැපයුම පාලනය කිරීම සඳහා පොදුවේ ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නම් වේ. ප්‍රමාණාත්මක මූල්‍ය උපකරණ 3 කි. මෙම උපකරණ මගින් මුදල් සැපයුම අඩු වැඩි වේ.

- **මහ බැංකු පොළී අනුපාතිකය** - මහ බැංකුව විසින් අවසාන ණය දෙන්නා වශයෙන් ද්‍රවශීලතා ගැටලු වලට මුහුණ දී සිටින වාණිජ බැංකු වෙතින් අය කරනු ලබන පොළී අනුපාතය මහ බැංකු පොළී අනුපාතය යි. මෙම පොළී අනුපාතය වැඩි කළ විට වාණිජ බංකු ණය ගැනීම අඩු වී සංචිත අඩු වන අතර මහජනතාව වෙත ලබා දෙන ණය දීම අඩු කරනු ලැබේ. එබැවින් ණය මැවීමේ හැකියාවද අඩු වී මුදල් සැපයුම සංකෝචනය වේ. මහ බැංකු පොළී අනුපාතය අඩු කළ විට වාණිජ බැංකු වැඩි වැඩියෙන් ණය ලබා ගන්නා අතර මහජනතාව වෙත ලබා දෙන ණය ප්‍රමාණය ඉහළ යයි. එබැවින් මුදල් සැපයුම ප්‍රසාරණය වේ.
- **ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය** - මහ බැංකුවේ නියමයන්ට අනුකූලව වාණිජ බැංකු විසින් තම තැන්පතු ප්‍රමාණයෙන් යම් ප්‍රතිශතයක් අතැති මුදල් හා බැංකු මුදල් ලෙස ළඟ තබා ගැනීම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ලෙස හඳුන්වයි. මූල්‍ය ප්‍රසාරණයක් බලාපොරොත්තු වන අවස්ථාවකදී මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය පහත හෙළන අතර එහි දී වාණිජ බැංකු වල රඳවා ගත යුතු සංචිත පහළ යාම නිසා ණය දීමේ හැකියාව වැඩි වේ. මූල්‍ය සංකෝචනයක් බලාපොරොත්තු වන විට දී මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතික ඉහළ දමන අතර එමගින් වාණිජ බැංකු රඳවා ගත යුතු සංචිත ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් ණය දීමේ හැකියාවත් අඩු වේ.
- **විවිධ වෙළඳපොළ කටයුතු** - විවෘත වෙළඳපොළ තුළ මහ බැංකුව සුරැකුම්පත් මිලට ගැනීමත් විකිණීමත් විවිට වෙළඳපොළ කටයුතු ලෙස හැඳින්වේ. මහ බැංකුව විසින් විවිධ වෙළඳපොළේ සුරැකුම්පත් විකිණීම තුළින් වාණිජ බැංකු ඒවා මිල දී ගැනීම නිසා වාණිජ බැංකු වල සංචිත අඩු වී ණය සැපයීමේ හැකියාව අඩු වීමක් සිදු වේ. එනම් මුදල් සැපයුම සංකෝචනය වේ. මහ බැංකුවේ විවිධ වෙළඳපොළේ සුරැකුම්පත් නැවත මිල දී ගැනීමක් සිදු කළහොත් මහ බැංකුව වෙතින් වාණිජ බැංකු වෙත මුදල් ගලා ගෙන යන බැවින් වාණිජ බැංකු වල ණය ලබා දීමේ හැකියාව වැඩි වේ. එබැවින් මුදල් සැපයුම ප්‍රසාරණය වේ.

## ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ

ණය පරිමාව හා ණය ගලා යන දිශාව පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් ගන්නා ක්‍රියාමාර්ග ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස හැඳින්වේ.

- යහ පෙළඹවීම
- ඇප සුරැකුම් වෙනස් කිරීම
- උපරිම ණය සීමා පැනවීම
- වරණාත්මක පොළී අනුපාතිකයන් නියම කිරීම
- ණයවර ලිපි කාසි ආන්තික නියම කිරීම

## වාණිජ බැංකු (Commercial Banks)

චෙක්පතකින් හෝ විධානයකින් ඉල්ලූ විටක ආපසු ගෙවීමේ පොරොන්දුවකට යටත්ව මහජනයාගෙන් මුදල් තැන්පතු භාර ගැනීම විශේෂ කාර්යය කොටගත් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් මූල්‍ය අතරමැදිකරණයේ නියුක්තව සිටින ප්‍රමුඛතමවූ මූල්‍ය ආයතනය වාණිජ බැංකු ලෙස හඳුන්වනු ලැබේ.

### වාණිජ බැංකුවල කාර්යයන්


- ඉල්ලුම් තැන්පතු, ඉතුරුම් තැන්පතු සහ කාලීන / ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාම
- කෙටි කාලීන ණය ලබා දීම
- ණය සහ අත්තිකාරම් ලබා දීම
- නියෝජිත සේවා සැපයීම
- පොදු උපයෝගීතා සේවා සැපයීම

## මූල්‍ය අතරමැදිකරුවන් (Financial Intermediaries)

අතිරික්ත මුදල් ඇති ඒකක වලින් ඉතුරුම් ඒකරාශී කර ගැනීමත්, අරමුදල් හිඟ ඒකක වලට එම ඉතුරුම් ලබා දීම මගින් ලාභ උපයා ගැනීම සිදු කරන මූල්‍ය ආයතන අතරමැදි මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ඇති එවැනි අතරමැදි මූල්‍ය ආයතන පහත දැක්වේ.

- රක්ෂණ සමාගම්
- ඒකකභාර
- කල්බදු සමාගම්
- ආයෝජන සමාගම්
- අර්ථසාධක හා විශ්‍රාම අරමුදල්

- තැන්පතු බාර ගැනීම සහ බැංකු කටයුතු සිදු කිරීමට අවසර ලබා ඇති ආයතන
  - බලපත්‍රලාභී වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - සමූපකාර ග්‍රාමීය බැංකු
  - ලියාපදිංචි මූල්‍ය සමාගම්
  - ණය දෙන සමූපකාර සමිති
  - සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති




## වාණිජ බැංකුවල ද්‍රවශීලතාව හා ලාභදායකත්වය
## (Profitability and Liquidity relation to Commercial Banks)

වාණිජ බැංකුවක ප්‍රධාන අරමුණු දෙකකි.

..........................................................................................................................................

..........................................................................................................................................

ද්‍රවශීලතා අරමුණ යනු ගණුදෙනුකරුවන් ඉල්ලූ විගස ඔවුන්ගේ තැන්පත් මුදල් නැවත ලබා දීමේ හැකියාව වාණිජ බැංකුවක් සතු වීම යි. එනම් ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා වාණිජ බැංකුවක ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීම අතිශය වැදගත් වේ. මේ අනුව තැන්පත්කරුවන් තම තැන්පතු මුදල් නැවත ලබා ගැනීමට වාණිජ බැංකු වෙත පැමිණීමේදී ද්‍රවශීලතාවය ආරක්ෂා කර ගැනීම සඳහා වාණිජ බැංකු සතුව මුදල්, මුදල් ලෙස ළඟ තබා ගත යුතුය. නමුත් ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීමට මුදල් ළඟ තබා ගැනීමේ දී ආවස්ථික පිරිවැයක් හට ගනී. එනම් ණය ලබා දීමට හෝ වෙනත් ආයෝජන මාර්ග යෙදවීමෙන් ඉපයීමට තිබූ ආදායම අහිමි වේ.

එමෙන්ම ණය ලබා දීමෙන් සහ ආයෝජන වත්කම් මගින් උපයා ගන්නා ආදායමෙන් තැන්පතු සඳහා ගෙවන පොළී වියදම් අඩු කල පසු ලැබෙන ශුද්ධ පොළී ආදායම ලාභදායකත්වය යනුවෙන් අදහස් කෙරේ.

මෙම ද්‍රවශීලතාව සහ ලාභදායකත්වය යන අරමුණු දෙක ඉටු කර ගැනීමේදී එහි ඇති ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය හේතුවෙන් වාණිජ බැංකු වලට අර්බුදකාරී තත්වයකට මුහුණ දීමට සිදුවේ. මන්දයත් වාණිජ බැංකු වලට තම ද්‍රවශීලතාව ආරක්ෂා කර ගැනීමට යාමේදී ලාභදායකත්වය අඩු වන අතර ලාභදායකත්වය ආරක්ෂා කිරීමට යාමේදී ද්‍රවශීලතාවය අඩු වේ. එම නිසා ලාභදායකත්වය සහ ද්‍රවශීලතාවය අතර සමතුලිතතාවයක් පවත්වා ගෙන යාමට වාණිජ බැංකු වලට සිදු වේ. ඒ සඳහා වාණිජ බැංකු විසින් ඔවුන්ගේ වත්කම් ව්‍යුහය සකස් කරගනු ලබයි.

## මිල මට්ටම සහ උද්ධමනය (Price Level and Inflation)

භාණ්ඩ හා සේවා වල වටිනාකම මිල යන්නෙන් හැඳින්වේ. මිල වෙනස් වන විට යම් දෙන ලද මුදල් ප්‍රමාණයකින් මිල දී ගත හැකි භාණ්ඩ ප්‍රමාණය වෙනස් වේ. භාණ්ඩයක හෝ සේවාවක මිල ස්වරූප 3 කින් දැක්විය හැකිය. එනම්,

- නිරපේක්ෂ මිල
- සාපේක්ෂ මිල
- පොදු මිල මට්ටම

කිසියම් භාණ්ඩයක හෝ සේවාවක වෙළඳපොළ මිල නිරපේක්ෂ මිල ලෙස හැඳින්වේ. එමෙන්ම භාණ්ඩ වල මිල ගණන් අතර අනුපාතය සාපේක්ෂ මිල ලෙස හැඳින්වේ. සියලුම භාණ්ඩ හා සේවා වල නිරපේක්ෂ මිල ගණන් වල සාමාන්‍ය අගය පොදු මිල මට්ටම ලෙස හඳුන්වයි. පොදු මිල මට්ටම ආශ්‍රිතව සංකල්ප 3ක් සාකච්ඡා කෙරේ. එනම්,

- උද්ධමනය - ..........................................................................................
- අවධමනය - ..........................................................................................
- නිරුද්ධමනය - ..........................................................................................

## උද්ධමන වර්ග හා උද්ධමනයේ ප්‍රතිවිපාක
## (Type of Inflation and causes for Inflation)

### උද්ධමනයේ ප්‍රභේද

#### ප්‍රසර්පණ උද්ධමනය (මධ්‍යස්ත උද්ධමනය)

ආර්ථිකය පවතින මන්දගාමී උද්ධමනකාරී තත්වයක් ප්‍රසර්පණ උද්ධමනය ලෙස හැඳින්වේ. මිල මට්ටම ඉහළ යාමේ වේගය 5% ක් නොඉක්මවන තත්වයක් මෙයට අදාල වේ. සංවර්ධිත රටවල් බොහෝමයක දැකිය හැක්කේ මෙවැනි උද්ධමනකාරී තත්වයකි.

#### ජවන උද්ධමනය

පොදු මිල මටට්ම ඉතා සීඝ්‍ර ලෙස ඉහළ යාමේ තත්වයක් ජවන උද්ධමනය හෙවත් අති උද්ධමනය ලෙස හැඳින්වේ. භාණ්ඩ හා සේවා මිල ගණන් ඉතා කෙටි කාලයක් තුළ සීඝ්‍රයෙන් ඉහළ යාම නිසා මෙවැනි තත්වයක් ඇති වේ.

#### අති උද්ධමනය

මාසිකව 50% ක් තරම් වේගයකින් පොදු මිල මට්ටම ඉහළ යාමේ ස්වභාවයක් පෙන්නුම් කරයි නම් එය අති උද්ධමනය ලෙස හැඳින්වේ. අති උද්ධමනයට බලපාන ප්‍රධාන හේතුව වන්නේ මුදල් සැපයුමේ වේගවත් ප්‍රසාරණය යි.

#### සර්පිල උද්ධමනය

පොදු මිල මට්ටම දඟරයක් ආකාරයට හෙවත් සර්පිලව ඉහළ යාම සර්පිල උද්ධමනයයි. උද්ධමනකාරී තත්වයකදී ව්‍යාපාර ලාභ ඉහළ යාම හේතුවෙන් සාධක ඉල්ලුම ඉහළ යයි. එවිට සාධක මිල වැඩි වේ. මෙම ක්‍රියාවලිය අඛණ්ඩ දඟරයක් ආකාරයෙන් සිදුවීම සර්පිල උද්ධමනය ඇති වීමට හේතු වේ.

## මර්ධිත උද්ධමනය

භාණ්ඩ හා සේවා වල මිල මට්ටම වේගයෙන් ඉහළ යන විට එය පාලනය කිරීමට රජය මැදිහත් වේ. මිල පාලනය, සලාකනය, වැටුප් අනුපාතික නියම කිරීම වැනි ක්‍රියා මාර්ග රජය මෙහිදී යොදා ගනී.

## උද්ධමනය ඇති වීමට හේතූන්


උද්ධමනයට හේතු පැහැදිලි කිරීමේ ප්‍රධාන න්‍යායන් දෙකකි.

........................................................................................................................................................

........................................................................................................................................................

## ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය

සමාහාර සැපයුමට සාපේක්ෂව සමාහාර ඉල්ලුම වැඩි වීම නිසා භාණ්ඩ හා සේවා වල පොදු මිල මට්ටම ඉහළ යාම ඉල්ලුමෙන් ඇදුනු උද්ධමන න්‍යාය තුළින් අදහස් කෙරේ. එනම් සමස්ත ඉල්ලුමේ අතිරික්තය හේතුවෙන් පොදු මිල මට්ටම ඉහල යාම යි.




ඉල්ලුමෙන් ඇදුණු උද්ධමන න්‍යායෙහි විකල්ප ප්‍රවේශ දෙකක් පවතී. එනම්,

........................................................................................................................................................

........................................................................................................................................................

## මුදල් ප්‍රමාණවාදය

විනිමය සමීකරණය මත පදනම්ව මිල මට්ටමේ හැසිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම මුදල් ප්‍රමාණවාදී න්‍යාය තුළින් සිදු කෙරේ. එමගින් මිල මට්ටම වෙනස් වීමත්, මුදල් තොගය වෙනස් වීමක් අතර ඍජු හා සමානුපාතික සම්බන්ධතාවයක් ඇති බව අවධාරණය කෙරේ. නිදසුනක් ලෙස මුදල් තොගය දස ගුණයකින් ඉහළ නැංවුවහොත් මිල මට්ටම ද දස ගුණයකින් ඉහළ යනු ඇත. මෙම සම්බන්ධතාවය පෙන්වා දීමට MV = PT යන විනිමය සමීකරණය යොදා ගනු ලැබේ.

PT යනු ආර්ථිකයේ මුළු ගනුදෙනු ප්‍රමාණය වන අතර MV යනු මුදල් යොදා ගනිමින් සිදු කරන ලද ගණුදෙනු ප්‍රමාණයේ වටිනාකමයි. විනිමය සමීකරණය තුළ අඩංගු විචල්‍යයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් කරනු ලබන උපකල්පනයන් මත විනිමය සමීකරණය න්‍යායක් බවට පෙරලා ගැනිමේ දී යොදා ගනු ලබන උපකල්පන දෙකකි. එනම්,


- මුදලේ සංසරණ ප්‍රවේගය ස්ථාවර වීම
- ආර්ථිකයේ ගණුදෙනු පරිමාව නොවෙනස් වීම

## කේන්සියානු න්‍යාය

කේනීසියානු න්‍යාය තුළදී සමාහාර ආදායම් සහ සමාහාර වියදම් විශ්ලේෂණය තුළින් උද්ධමනයට හේතු පැහැදිලි කිරිම සිදු කෙරේ. ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති සමතුලිතය කරා ළඟා වීමෙන් පසුව තවදුරටත් සමාහාර ඉල්ලුම වැඩි වුවහොත් භාණ්ඩ හා සේවා ප්‍රමාණය වැඩි කළ නොහැකි බැවින් සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමට පටන් ගනී.

## පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය

සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹා යන අති විශාල මුදල් ප්‍රමාණයක් යනුවෙන් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය හැඳින්විය හැකිය. එනම් යෙදවුම් වල මිල ගණන් ඉහළ යාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය වැඩි වී භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාම පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයයි. ආනයන වල මිල ඉහළ යාම, සංවිධානාත්මක ශ්‍රමය, කතිපයාධිකාරී ආයතන වල ක්‍රියාකාරිත්වය වැනි සාධක හේතුවෙන් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය හට ගනී. මේ අනුව නිෂ්පාදන පිරිවැය ඉහල යාම තුළින් සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන් වන අතර ඒ තුළින් මිල මට්ටම ඉහළ යාමක් සිදු වේ.



## උද්ධමනය පොළී අනුපාතිකය අතර සම්බන්ධතාවය
## (Relationship between Inflation and interest rate)

උද්ධමනය හේතුකොට ගෙන ඉතිරි කිරීම් අඩු විය හැකිය. මන්ද ඉතිරි කරන්නන්ට ඉතිරි කිරීමේ හැකියාව අඩු වන බැවිනි. එමෙන්ම මූර්ත පොළී අනුපාතිකයේ පහළ බැසීමක් හේතුකොටගෙන ඉතිරි කිරීම් අඩු විය හැකිය.

| |
|---|
| මූර්ත පොළී අනුපාතිකය = නාමික පොළී අනුපාතිකය – උද්ධමන අනුපාතිකය |

මූර්ත පොළී අනුපාතිකය සෘණ අගයක් ගැනීම ඉතිරි කරන්නන්ට සහ ස්ථාවර ආදායම්ලාභීන්ට අහිතකර වන අතර විචල්‍ය ආදායම්ලාභීන් හට හිතකර තත්වයක් ඇති කෙරේ. ස්ථාවර ආදායම්ලාභීන් ලෙස විශ්‍රාමික පිරිස්, රාජ්‍ය හා කාර්යාල සේවකයන් සහ රජයෙන් ලබන සුබසාධන දීමනා මත යැපෙන්නන් හැඳින්විය හැකිය.

උද්ධමන තත්වයකදී ස්ථාවර ආදායම්ලාභීන්ට අහිතකර වන්නේ මුදල් ආදායමේ ක්‍රය ශක්තිය අඩු වන බැවිනි.

$$\text{මූර්ත ආදායම} = \frac{\text{මුදල් ආදායම}}{\text{මිල දර්ශකය}} \times 100$$

## උද්ධමනයේ ආර්ථික ප්‍රතිවිපාක සහ ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

### උද්ධමනයේ ආර්ථික ප්‍රතිවිපාක

- ..............................................................................................................................
- ..............................................................................................................................
- ..............................................................................................................................
- ආදායම් ව්‍යාප්තිය අයහපත් වීම
- නිරපේක්ෂ දරිද්‍රතාව ඉහළ යාම
- අපනයන වල තරගකාරීත්වයට බාධා එල්ල වීම
- පුද්ගලයන්ගේ ජීවන වියදම ඉහළ යාම
- විනිමය අනුපාතිකය ක්ෂය වීම

### උද්ධමනය පාලනය කිරීම සඳහා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

- සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීම
- කාර්යක්ෂම සම්පත් බෙදා හැරීමෙහිලා පවතින බාධක ඉවත් කිරීම
- සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා වීම
- සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම

## මුදලේ කාර්යයන්

- විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
- වටිනාකම මැනීමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම
- වටිනාකම රැස් කිරීමේ මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

## මුදල් ඉල්ලුම

කිසියම් අවස්ථාවකදී මහජනතාව විසින් මුදල්, මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට ඇති කැමැත්ත මුදල් ඉල්ලුම හෙවත් ද්‍රවශීලතාවරණය ලෙස අදහස් කෙරේ.

- ගණුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

## මුදල් සැපයුම

කිසියම් නිශ්චිත අවස්ථාවක දී මහජනතාව අතර සංසරණය වන මුළු මුදල් තොගය මුදල් සැපයුම හෙවත් මූල්‍ය සමස්තය ලෙස හැඳින්වේ.

- පටු මුදල් සැපයුම ($M_1$)
- පුළුල් මුදල් සැපයුම ($M_2$)
- ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)
- පුළුල් මුදල් සැපයුම ($M_4$)

## මූල්‍ය පද්ධතිය

දේශීය විදේශීය කුටුම්භ, ව්‍යාපාරික ආයතන, රජය යන ප්‍රධාන ආර්ථික ඒකකයන්ගේ මූල්‍ය තීරණයන් ක්‍රියාත්මක කරන වෙළඳපොළවල්, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ සහ මූල්‍ය යටිතල පහසුකම් යනාදියෙහි එකතුවක් මූල්‍ය පද්ධතියක් ලෙස හැඳින්වේ.

- මූල්‍ය ආයතන
- මූල්‍ය වෙළඳපොළ
- මූල්‍ය උපකරණ
- මූල්‍ය යටිතල පහසුකම්
- මූල්‍ය ආයතන අධීක්ෂණය කරන නියාමන ආයතන

## මිල මට්ටම

භාණ්ඩ හා සේවා වල වටිනාකම මිල යන්නෙන් හැඳින්වේ.

- නිරපේක්ෂ මිල
- සාපේක්ෂ මිල
- පොදු මිල මට්ටම

## උද්ධමනය

ආර්ථිකයේ පොදු මිල මට්ටමෙහි හට ගන්නා අඛණ්ඩ ඉහල යාමක් උද්ධමනය ලෙස හැඳින්වේ

- උද්ධමනය
- අවධමනය
- නිරුද්ධමනය

## උද්ධමනය ඇති වීමට හේතු

- ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය
- පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය

# අභ්‍යාස

1. මුදලේ කාර්යයක් නොවන්නේ,
   I. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
   II. වටිනාකම මැනීමේ මිනුමක් ලෙස කටයුතු කිරීම
   III. පොදු පිළිගැනීමක් තිබීම
   IV. වටිනාකමේ සන්නිධියක් වීම

2. මිනිසුන් මුදල් ඉල්ලුම් කිරීමට පොළඹවන සාධකයක් නොවන්නේ
   I. ගණුදෙනු චේතනාව  II. ආරක්ෂණ චේතනාව
   III. ආදායම් චේතනාව  IV. සමපේක්ෂණ චේතනාව

3. දේශීය වෙළඳපොලේ කිසියම් මුදල් ඒකකයකින් මිලදී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය හඳුන්වනු ලබනුයේ
   I. මුදලේ විදේශීය මූර්ත අගය  II. මුදලේ දේශීය මූර්ත අගය
   III. මුදලේ විදේශීය අගය  IV. මුදලේ විදේශීය මිල අගය

4. මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකු වල ඇති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු වල එකතුව හඳුන්වනු ලබනුයේ
   I. පටු මුදල් සැපයුම  II. පුළුල් මුදල් සැපයුම
   III. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම  IV. වඩාත් පුළුල් මුදල් සැපයුම

5. සමපේක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම තීරණය වනුයේ
   I. මුදල් ආදායම මත  II. පොළී අනුපාතය මත
   III. මිල මට්ටම මත  IV. ආයතනික සාධක මත

6. කල්පසුවී කරන ගෙවීම් සුමටව ඉටු කිරීම මුදල් විසින් කරනු ලබන කාර්යභාරය හඳුන්වනු ලබනුයේ
   I. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
   II. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම
   III. ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම
   IV. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

7. මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේදී යොදා ගන්නා ගුණාත්මක ණය පාලන උපකරණයක් නොවන්නේ
   I. මහ බැංකු පොළී අනුපාතිකය
   II. ඇප සුරකුම් වෙනස් කිරීම
   III. උපරිම ණය සීමා පැනවීම
   IV. ණයවර කාසි ආන්තික නියම කිරීම

8. උද්ධමනයේ ආර්ථික ප්‍රතිවිපාකයක් නොවන්නේ
   I. ණයහිමියන්ට වාසිදායක වීම  II. ණයගැතියන්ට වාසිදායක වීම
   III. ආදායම් ව්‍යාප්තිය අසමාන වීම  IV. ඉතිරිකරන්නන්ට අයහපත් වීම

9. මුදල් ප්‍රමාණවාදී න්‍යායට අනුව මුදල් සැපයුම හා මිල මට්ටම අතර ඇත්තේ
   I. ප්‍රතිලෝම සම්බන්ධතාවකි  II. අනුලෝම සම්බන්ධතාවකි
   III. සෘණ සම්බන්ධතාවකි  IV. කිසිදු සම්බන්ධතාවක් නොමැත

10. පසුගිය වර්ෂයේ පාරිභෝගික මිල දර්ශකයේ වටිනාකම 110 ක් වූ අතර මෙම වර්ෂයේ පාරිභෝගික මිල දර්ශකය 120 ක් විය. වර්ෂ දෙක අතර උද්ධමන අනුපාතය වන්නේ
    I. 10%  II. 6.52%  III. 12.36%  IV. 9.09%

11. හොඳ මුදලක ලක්ෂණ මොනවාද?
12. ආසන්න මුදල් හා මුදල් ආදේශක අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න.
13. අධි බලැති මුදල් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
14. පටු මුදල් සැපයුම හා පුළුල් මුදල් සැපයුම අතර පවත්නා වෙනස පැහැදිලි කර දක්වන්න.
15. වාණිජ බැංකුවක ද්‍රවශීලතා අරමුණ හා ලාභදායිතාව අරමුණ අතර සම්බන්ධතාවක් ගොඩ නගනු ලබන්නේ කෙසේද?

## 2020 ජුලි

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක උපකරණයක් වන්නේ කුමක් ද?

(1) බැංකු පොලී අනුපාතිකය.

(2) විවෘත වෙළෙඳපොළ මෙහෙයුම්.

(3) සංචිත අනුපාතිකය (reserve rate).

(4) ණය සඳහා කල්පිරීමේ උපරිම කාලසීමාවක් පැනවීම.

**1.9** පටු මුදල් සැපයුම, මහජනතාව සතු වාණිජ බැංකුවල ඇති කාලීන සහ ඉතුරුම් තැන්පතුවල එකතුව හඳුන්වනු ලබන්නේ:

(1) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ලෙසයි.  (2) පුළුල් මුදල් සැපයුම ලෙසයි.

(3) පුළුල් මුදල් ගුණකය ලෙසයි.  (4) වඩාත් පුළුල් මුදල් සැපයුම ලෙසයි.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛණයේ ජංගම ගිණුමේ ඇතුළත් **නොවන්නේ** කුමක් ද?

(1) සෘජු විදේශ ආයෝජන.  (2) භාණ්ඩ සහ සේවා අපනයනය.

(3) භාණ්ඩ සහ සේවා ආනයනය.  (4) ප්‍රාථමික ආදායම්.

04.

(a) (i) මුදලේ ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) විද්‍යුත් මුදල් (electronic money) භාවිතයට හේතු දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් (functions) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) මුදලට ඇති ඉල්ලුම සඳහා චේතනා (motives) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 2021 ජනවාරි

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, විද්‍යුත් මුදල් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ඉතුරුම් තැන්පතු (Savings Deposits). (2) ණයපත් (Credit Cards).

(3) ස්ථාවර තැන්පතු (Fixed Deposits). (4) භාණ්ඩාගාර බිල්පත් (Treasury Bills).

**1.13** ණය සඳහා උපරිම කල් පිරීමේ කාල සීමාවක් නියම කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ඇති ප්‍රමාණාත්මක පාලන උපකරණයකි.

04.

(a) වාණිජ බැංකුවක කාර්යයන් (functions) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) වාණිජ බැංකුවලට අදාලව ලාභදායකත්වය (profitability) සහ ද්‍රවශීලතාවය (liquidity) අතර සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) උද්ධමනය ඇතිවීමට හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

## 2020 ජනවාරි

**1.6** බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සඳහා උදාහරණයක් වන්නේ:

(1) කොමර්ෂල් බැංකුව. (2) හැටන් නැෂනල් බැංකුව.

(3) ලංකා බැංකුව. (4) ජාතික ඉතිරිකිරීමේ බැංකුව.

**1.7** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන්නේ:

(1) ආයෝජන කරුණු පිළිබඳව පුද්ගලයන්ට උපදෙස් දීමයි.

(2) ආනයනකරුවන්ට උපකාර සැපයීමයි.

(3) මූල්‍ය ස්ථායිතාවය පවත්වාගෙන යාමයි.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.8** දේශීය මුදල් ඒකකයකින් විදේශීය වෙළෙඳපොලකදී මිලදීගත හැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ:

(1) දේශීය මූර්ත අගය ලෙසයි. (2) විදේශ මූර්ත අගය ලෙසයි.

(3) දේශීය නිල අගය ලෙසයි. (4) විදේශ නිල අගය ලෙසයි.

1.17 …………………… *(පුළුල් / පටු)* මුදල් සැපයුම යනුවෙන් හඳුන්වන්නේ මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකුවල මහජනයා සතු ඉල්ලුම් තැන්පතුවල එකතුවයි.

05.
(a) (i) මුදලේ කාර්යයන් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(ii) සාමාන්‍ය මිල මට්ටම සහ මුදලේ අගය අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

06.
(A) (a) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන් තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

## 2019 ජූලි

1.11 විලම්බිත ගෙවීම් (කල් පසුවූ ගෙවීම්) මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම, මුදලේ කාර්යයක් වේ.

1.18 භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර විකිණීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් සැපයුම …………………… *(වැඩි කළ / අඩු කළ)* හැකිය.

04.
(b) මුදලට ඇති ඉල්ලුම සඳහා වන චේතනා (motives for demand for money) තුන(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

## 2018 ජූලි

1.6 පටු මුදල් සැපයුම, මහජනයා විසින් වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන, කාලීන සහ ඉතුරුම් තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල එකතුව හඳුන්වනු ලබන්නේ:

(1) පුළුල් මුදල් ගුණකය (Broad money multiplier) ලෙසයි.

(2) මුදල් පදනම (Monetary base) ලෙසයි.

(3) පුළුල් මුදල් සැපයුම [Broad money Supply ($M_2$)] ලෙසයි.

(4) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම [Consolidated Broad Money Supply ($M_2b$)] ලෙසයි.

1.7 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, (2013 පාදක වර්ෂය = 100 ලෙස ගෙන) 2015 සහ 2016 වර්ෂ සඳහා, කොළඹ පාරිභෝගික මිල දර්ශකය පිළිවෙලින් 109.8 සහ 114.7 විය. වර්ෂ දෙක අතර උද්ධමන අනුපාතිකය වන්නේ:

(1) 4.3% කි. (2) 4.9% කි. (3) 4.5% කි. (4) 9.8% කි.

1.14 ගනුදෙනු චේතනාව මත මුදලට ඇති ඉල්ලුම සහ මූර්ත ආදායම අතර සෘණාත්මක සම්බන්ධතාවයක් ඇත.

1.19 මුදල් ඉල්ලුම් සහ මුදල් සැපයුම් වක්‍ර එකිනෙක ඡේදනය වන (intersection) ලක්ෂ්‍යයේදී තීරණය වන පොලී අනුපාතිකය …………………… *(සමතුලිත පොලී අනුපාතිකය /අතිරික්ත පොලී අනුපාතිකය)* ලෙස හඳුන්වනු ලැබේ.

06.

(A) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිවල ගුණාත්මක පාලනයන් (qualitative controls) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(ii) "ද්‍රවශීලතාව සහ ලාභදායීතාව යන එකිනෙකට ගැටෙන අරමුණු දෙක අතර සමබරතාවය පවත්වා ගැනීමේ අභියෝගයට බැංකුවලට මුහුණදීමට සිදුවේ".

ඉහත ප්‍රකාශනය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

## 2019 ජනවාරි

**1.20** තැන්පත්කරුවන්ගෙන් අරමුදල් එකතු කර ණය ලබා ගන්නන්ට ඒවා ණයට දීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ ........................ *[මූල්‍ය අන්තර්ගතකරණය (Financial inclusion) / මූල්‍ය අතරමැදිකරණය (Financial intermediation)]* ලෙසයි. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

03.

(b) (i) වාණිජ බැංකුවක කාර්යයන් තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී (licensed) වාණිජ බැංකු සඳහා උදාහරණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 01)

04.

(a) මුදලට ඇති ඉල්ලුම වැඩිවීමකදී සමතුලිත පොලී අනුපාතිකය කෙරෙහි ඇතිවන බලපෑම ප්‍රස්තාරයක් ආධාරයෙන්, **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය (Demand Pull Inflation) සහ පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය (Cost Push Inflation) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

05.

(a) මුදල් සැපයුම කළමනාකරණය කිරීමේදී, විවෘත/විවට වෙළෙඳ කටයුතු (open market operations), ප්‍රමාණාත්මක පාලනයක් ලෙස ක්‍රියාකරන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

# 06. අන්තර්ජාතික වෙළෙඳාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ

## අන්තර්ජාතික වෙළෙඳාම International Trade

අන්තර්ජතික වෙළෙඳාම හෙවත් විදේශ වෙළෙඳාම ලෙස අදහස් කරනුයේ කිසියම් රටක් තවත් රටක් හෝ රටවල් කිහිපයක් සමග භාණ්ඩ හා සේවා හුවමාරු කරගැනීමයි. ඒ අනුව අපනයන වෙළෙඳාම සහ ආනයන වෙළෙඳාම ලෙස අන්තර්ජාතික වෙළෙඳාම කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. රටවල් විසින් අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වන්නේ ඒ තුළින් වාසි අත්කර ගත හැකි හෙයිනි.

## අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වීමෙන් අත්වන ප්‍රතිලාභ

- ..........................................................................................................
- ..........................................................................................................
- ..........................................................................................................
- අතිරික්ත නිෂ්පාදනය අලෙවි කිරීම සඳහා විදේශ වෙළෙඳපොළවල් සොයා ගත හැකි වීම
- සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගත හැකි වීම
- දේශීය වශයෙන් නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ විදේශ රටවලින් මිලදී ගත හැකි වීම
- ගුණාත්වයෙන් යුතු භාණ්ඩ අඩු මිලට පරිභෝජනය කළ හැකි වීම
- විදේශ ණය, විදේශ ආධාර, විදේශ ආයෝජනය රට තුළට ගලා ඒම

## අන්තර්ජාතික වෙළෙඳාමේදී භාවිතා වන මූලික සංකල්ප

- ..........................................................................................................
- ..........................................................................................................

### නිරපේක්ෂ වාසි න්‍යාය

ඇඩම් ස්මිත් (Adam Smith) සඳහන් කරන ලද්දේ අන්තර්ජාතික වෙළෙඳාමට සහභාගී වීමෙන් සෑම රටකටම වාසි ලබාගත හැකි බවයි. විශේෂ ප්‍රාගුණ්‍යය සහ ශ්‍රම විභජනය නිසා ඵලදායීතාව හා නිෂ්පාදන මට්ටම ඉහළ යන බවත්, එමගින් ලෝක නිෂ්පාදනය ඉහළ යන බවත් ස්මිත් පෙන්වා දුන්නේ ය.

ඇඩම් ස්මිත්ගේ නිරපේක්ෂ වාසි න්‍යායට අනුව කිසියම් රටක් කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් (වැඩි කාර්යක්ෂමතාවයකින්) හෝ වැඩි ඵලදායීතාවයකින් නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ වාසි පවතී.

නිරපේක්ෂ වාසි න්‍යාය සරල සංඛ්‍යාත්මක උදාහරණයක් මගින් පැහැදිලි කළ හැකිය.

ශ්‍රී ලංකාව සහ චීනයට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි සහල් සහ රෙදි ඒකක ප්‍රමාණ පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමවුම් ඒකක ප්‍රමාණය

| රට | රෙදි (ඒකක) | සහල් (ඒකක) |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 8 | 5 |
| චීනය | 4 | 7 |

මෙහිදී ශ්‍රී ලංකාවට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි රෙදි ඒකක ප්‍රමාණය චීනයට වඩා වැඩිය. චීනය ශ්‍රම ඒකකයකින් නිපදවන රෙදි ඒකක ප්‍රමාණය ඒකක 4ක් වන අතර ශ්‍රී ලංකාව නිපදවන රෙදි ඒකක ප්‍රමාණය ඒකක 8ක් වේ. මේ අනුව රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි ශ්‍රී ලංකාව සතුය.

චීනයට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි සහල් ඒකක ප්‍රමාණය ශ්‍රී ලංකාවට වඩා වැඩිය. ශ්‍රී ලංකාව ශ්‍රම ඒකකයකින් නිපදවන සහල් ප්‍රමාණය ඒකක 5ක් වන අතර චීනය නිපදවන සහල් ප්‍රමාණය ඒකක 4කි. එබැවින් සහල් සඳහා නිරපේක්ෂ වාසිය චීනය සතුය.

මේ තත්ත්වය යටතේ ශ්‍රී ලංකාවට රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් ද චීනයට සහල් නිෂ්පාදනය සම්බන්ධයෙන් ද නිරපේක්ෂ වාසියක් පවතී.

නිමවුම් ඒකකයක් සඳහා වැය වන යෙදවුම් ඒකක ප්‍රමාණය සලකා බලමින් ද නිරපේක්ෂ වාසි න්‍යාය පැහැදිලි කළ හැකිය. මෙහිදී කිසියම් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු සම්පත් ඒකක ප්‍රමාණයකින් කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කරයි නම් එම රටට අදාළ භාණ්ඩය සම්බන්ධයෙන් නිරපෙක්ෂ වාසි පවතී.

උදා- ශ්‍රී ලංකාව සහ චීනයට සහල් ඒකකයක් හා රෙදි ඒකකයක් නිපදවීමට අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

| රට | රෙදි (ශ්‍රම ඒකක) | සහල් (ශ්‍රම ඒකක) |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 4 | 7 |
| චීනය | 8 | 5 |

ඉහත උදාහරණයට අනුව රෙදි ඒකකයක් නිපදවීමට ශ්‍රී ලංකාවට අවශ්‍ය ශ්‍රම පැය ප්‍රමාණය චීනයට වඩා අඩුය. ශ්‍රී ලංකාවට රෙදි ඒකකයක් නිපදවීමට අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය 4 වන අතර චීනයට ශ්‍රම පැය 8ක් අවශ්‍ය වේ. එබැවින් රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසිය ශ්‍රී ලංකාව සතුය. එසේම සහල් ඒකක එකක් නිපදවීමට චීනයට ශ්‍රම ඒකක 5ක් අවශ්‍ය වන අතර ශ්‍රී ලංකාවට ඒ සඳහා ශ්‍රම ඒකක 7ක් අවශ්‍ය වේ. ඒ අනුව අඩු ශ්‍රම ඒකක ප්‍රමාණයකින් සහල් නිෂ්පාදනය කරන චීනයට සහල් නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසි පවතී.

## සාපේක්ෂ වාසි න්‍යාය

නිරපේක්ෂ වාසි න්‍යායේ පවතින දුර්වලතා ඉවත් කිරිම සඳහා ඩේවිඩ් රිකාඩෝ නැමැති ආර්ථික විද්‍යාඥයා විසින් සාපේක්ෂ වාසි න්‍යාය ඉදිරිපත් කරන ලදී. කිසියම් රටකට කිසිදු භාණ්ඩයක් සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි නොලැබුණා වුව ද විදේශ වෙළෙඳාමට සම්බන්ධ වී වාසි ලබා ගත හැකිය.

කිසියම් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතින බවත් කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් නිපදවීමේ දී වෙනත් රටකට සාපේක්ෂව වැඩි ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු වේ නම් එම රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ අවාසි පවතින බවත් සාපේක්ෂ වාසි න්‍යාය යටතේ අවධාරණය කෙරේ. එමෙන්ම, රටවල් අන්තර්ජාතික වෙළෙඳාමෙහි යෙදෙන විට සාපේක්ෂ වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය අපනයනය කිරීමෙන් වෙළෙඳාමට සම්බන්ධ වන රටවලට වැඩි වාසි අත්කර ගත හැකි බවද පෙන්නුම් කෙරේ.

## සාපේක්ෂ වාසි න්‍යායේදී පදනම් කර ගනු ලබන උපකල්පන

- ..................................................................................................................................
- ..................................................................................................................................
- ..................................................................................................................................
- ..................................................................................................................................

උදා- ඇමරිකා එක්සත් ජනපදය හා කැනඩාවට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි තිරිඟු හා රෙදි ඒකක ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවෙහි නිරූපණය වේ.

| රට | තිරිඟු (කිලෝග්‍රෑම්) | රෙදි (මීටර) |
|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 6 | 3 |
| කැනඩාව | 11 | 2 |

ඉහත වගුවෙහි දැක්වෙන ආකාරයට භාණ්ඩ දෙකම නිෂ්පාදනය කිරීමෙහිලා නිරපේක්ෂ වාසි ඇමරිකා එක්සත් ජනපදය සතු වන අතර වැඩිම නිරපේක්ෂ වාසියක් දක්නට ලැබෙනුයේ තිරිඟු නිෂ්පාදනය සම්බන්ධයෙනි. කැනඩාවට භාණ්ඩ දෙකම නිෂ්පාදනය සම්බන්ධයෙන් නිරපේක්ෂ අවාසියක් පවතින අතර නිරපේක්ෂ අවාසිය අඩුම රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙනි. එහෙත් මෙම ප්‍රකාශ දෙකම නිවැරදි නොවේ.

නිරපේක්ෂ වාසි න්‍යාය මත වෙළෙඳාමෙන් බිහි නොවූව ද යුතු සාපේක්ෂ වාසි න්‍යාය මත විදේශ වෙළෙඳාමෙන් බිහිවිය හැකි බව ඩේවිඩ් රිකාඩෝ විසින් පෙන්වා දෙන ලදී. මේ සඳහා භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් දෙරටෙහි ආවස්ථික පිරිවැය හඳුනාගත යුතුය.

ඇමරිකා එක්සත් ජනපදය තිරිඟු කිලෝග්‍රෑම් 6ක ආවස්ථික පිරිවැය රෙදි මීටර් 3කි. තිරිඟු කිලෝග්‍රෑම් 1ක ආවස්ථික පිරිවැය රෙදි මීටර් 0.5කි. (3/6) එසේම කැනඩාව තිරිඟු කිලෝ 1ක ආවස්ථික පිරිවැය රෙදි මීටර 2කි (2/1).

ඇමරිකාව රෙදි මීටර් 3ක ආවස්ථික පිරිවැය තිරිඟු කිලෝග්‍රෑම් 6කි. රෙදි මීටර් 1ක ආවස්ථික පිරිවැය රෙදි මීටර් 2කි (6/3). එසේම කැනඩාව රෙදි මීටර් 2ක් නිපදවීමේ ආවස්ථික පිරිවැය තිරිඟු කිලෝග්‍රෑම් 1ක් වන අතර රෙදි ඒකක 1ක් නිපදවීමේ ආවස්ථික පිරිවැය තිරිඟු කිලෝග්‍රෑම් 0.5 (1/2) කි.

| රට | තිරිඟු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය රෙදි ඒකක වලින් | රෙදි ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය තිරිඟු ඒකක වලින් |
|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 3/6 = 0.5 | 6/3 = 2 |
| කැනඩාව | 2/1 = 2 | 1/2 = 0.5 |

ඉහත සංඛ්‍යා සටහන අනුව තිරිඟු නිෂ්පාදනයේ අඩුම ආවස්ථික පිරිවැය ඇමරිකා එක්සත් ජනපදය සතුය. (0.5 < 2) එහෙයින් තිරිඟු නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ඇමරිකා එක්සත් ජනපදය සතුය. රෙදි නිෂ්පාදනයේ අඩු ආවස්ථික පිරිවැය කැනඩාව සතුය (0.5 < 2). එහෙයින් කැනඩාව රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් පවතී.

මේ අනුව ඇමරිකා එක්සත් ජනපදය තිරිඟු නිෂ්පාදනය විශේෂ ප්‍රාගුණ්‍ය කර ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වන අතර කැනඩාව රෙදි විශේෂ ප්‍රාගුණ්‍ය කොට විදේශ වෙළෙඳාමට සහභාගී වේ.

### අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වන සාපේක්ෂ වාසි හට ගන්නා ප්‍රධාන මූලාශ්‍ර

- සම්පත් සම්භාරයේ වෙනස්කම්
- ගුණාත්මක තත්වය
- අභිරුචියේ වෙනස්කම්
- පරිමාණානුකූල පිරිමැසුම්
- නිෂ්පාදන ප්‍රභේදනය
- තාක්ෂණික වෙනස්කම්
- රාජ්‍ය ප්‍රතිපත්ති
- උද්ධමනය
- ස්ථානගත වීම

### අන්තර්ජාතික වෙළෙඳාමේ වාසි

- ............................................................................................................................
  ............................................................................................................................
- ............................................................................................................................
  ............................................................................................................................
  ............................................................................................................................
- ............................................................................................................................
  ............................................................................................................................
  ............................................................................................................................
- විදේශ වෙළෙඳාම මගින් වැඩි දියුණු වන ජාත්‍යන්තර සම්බන්ධතා හේතු කොට විදේශ ආයෝජන, විදේශ ආධාර ආදිය තම රටවල දියුණුව සඳහා ලබාගැනීමට හැකියාව ලැබේ.
- සම්පත් හා තාක්ෂණික දැනුමෙන් දුර්වල රටවලට වුවද, නව තාක්ෂණික දැනුම මෙන්ම නිපැයුම් පරිහරණයට ද අවස්ථාව සැලසේ.
- විදේශ වෙළඳාමක් නොමැති තත්ත්වයක් දී පරිභෝජනය කිරීමට ලැබෙන භාණ්ඩ හා සේවා ප්‍රමාණයට වඩා විශාල පරාසයක භාණ්ඩ හා සේවාවන් අඩු මිල ගණන් යටතේ පරිභෝජනය කිරීමට අන්තර්ජාතික වෙළෙඳාම නිසා ඉඩ සැලසේ.
- අන්තර්ජාතික වෙළඳාම තුළින් රටවල් අතර දේශපාලනික, සංස්කෘතික හා සමාජීය සම්බන්ධතාවන් ගොඩනගා ගැනීමට හා ශක්තිමත් කර ගැනීමට අවකාශ සැලසේ.

### අන්තර්ජාතික වෙළෙඳාමේ අවාසි

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

## වෙළෙඳාමට අදාළ තීරුබදු හා තීරුබදු නොවන බාධක
(Tariff and non-tariff barriers to trade)

### ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග

විදේශීය භාණ්ඩ දේශීය වෙළෙඳපොල තුලට නිදහසේ ඇතුළු වීම සීමා කරන හෝ වළක්වන ඕනෑම ක්‍රියාමාර්ගයක් ආරක්ෂණවාදය නමින් හැඳින්වේ. නිදහස් වෙළෙඳාමට සීමාවන් ඇති කෙරෙන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය. එනම්,

1. තීරු බදු
2. තීරු බදු නොවන ක්‍රියාමාර්ග

තීරු බදු යනු අපනයන හා ආනයන මත බදු පැනවීමයි. ආනයන මත තීරු බදු පැනවීම මගින් එම භාණ්ඩ මිලදී ගන්නා දේශීය පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවීමට සිදු වේ. එමගින් ආනයන අධෛර්යමත් වේ.

ආනයන හා අපනයන මත තීරු බදු පැනවීමට අමතරව ආරක්ෂණය සඳහා යොදාගන්නා තීරු බදු නොවන ක්‍රියාමාර්ග කිහිපයකි.

- ..............................................................................................................................
- ..............................................................................................................................
- ..............................................................................................................................
- විදේශ විනිමය පාලනය.
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම.
- වෙළෙඳ සම්බාධක පැනවීම.

### ආරක්ෂණවාදයේ පක්ෂව ඉදිරිපත් කරන තර්ක

- ..............................................................................................................................
- ..............................................................................................................................
- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් වීම
- සේවා නියුක්තිය ආරක්ෂා කිරීමට වැදගත් වීම
- අවගුණ භාණ්ඩ ආනයන වැළැක්වීම සඳහා
- දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම සඳහා

### ආරක්ෂණවාදයේ විපක්ෂව ඉදිරිපත් කරන තර්ක

- ..............................................................................................................................
- ..............................................................................................................................
- දේශීය හා විදේශීය වෙළෙඳපොළ සංකෝචනය වීම
- විදේශ වෙළෙඳාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම අඩු වීම
- දේශීය නිෂ්පාදනවල පිරිවැය අඩු කිරීමට සානුබල නොමැති නිසා අකාර්යක්ෂම කර්මාන්ත බිහි විය හැකිය.

## වෙළෙඳ අනුපාතය (The Terms of Trade)

අන්තර්ජාතික වෙළෙඳාම නිසා ලැබෙන වාසි මූලික වශයෙන් තීරණය කෙරෙනුයේ වෙළෙඳ අනුපාතය මඟිනි. අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් වෙනුවෙන් ආනයන භාණ්ඩ ඒකක කෙතරම් ප්‍රමාණයක් ලබාගත හැකිද යන්න මෙමඟින් සලකා බලයි. එනම් වෙළෙඳ අනුපාතය යනු අපනයන ඒකකයක ආනයන ක්‍රයශක්තියයි.

වෙළෙඳ අනුපාතය පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කළ හැකිය.

| |
|---|
| |

ආනයන මිල දර්ශකයට සාපේක්ෂව අපනයන මිල දර්ශකය ඉහළ නගී නම් වෙළෙඳ අනුපාතය ඉහළ නගී. එසේම අපනයන මිල දර්ශකයට සාපේක්ෂව ආනයන මිල දර්ශකය ඉහළ ගියහොත් වෙළෙඳ අනුපාතය පිරිහේ. වෙළෙඳ අනුපාතය ඉහළයාම යහපත් ප්‍රවණතාවක් ලෙසත්, වෙළෙඳ අනුපාතයේ අගය පහළ යාම අයහපත් ප්‍රවණතාවක් ලෙසත් සැලකේ.

## ගෙවුම් ශේෂ ලේඛනය (Balance of Payment)

වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ රටක් විසින් අනෙකුත් රටවල් සමග කරන ලද ආර්ථික ගනුදෙනු මත වෙනත් රටවල් වලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනය **ගෙවුම් ශේෂ ලේඛනය** හෙවත් **ගෙවුම් තුලන ලේඛනය** ලෙස හැඳින්වේ.

ගෙවුම් ශේෂ ලේඛනයේ හර සහ බැර අගයන් වෙන් වෙන්ව දැක්විය යුතු අතර භාණ්ඩයක්, සේවාවක් හෝ වත්කමක් තම රටෙන් වෙනත් රටකට බැහැර වන විට එහි වටිනාකම බැර සටහනක් ලෙසත්, වෙනත් රටකින් තමන්ගේ රටට ලැබෙන විටදී එය හර සටහනක් ලෙසත් සටහන් කළ යුතු වේ.

### ගෙවුම් ශේෂ ලේඛනයේ ඇතුළත් වන ගනුදෙනු

- ආදායම් ලැබීම් හා ගෙවීම් ආශ්‍රිත ගනුදෙනු
- භාණ්ඩ හා සේවා ආනයන හා අපනයන කිරීමට අදාළ ගනුදෙනු
- වත්කම්, ධනය, ත්‍යාග වැනි ඒක පාර්ශවීයව සිදු කරනු ලබන ගනුදෙනු
- මූල්‍ය වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු
- නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු

### ගෙවුම් ශේෂ ලේඛනයේ ඇතුළත් ගිණුම්

- ..........................................................................................
- ..........................................................................................
- ..........................................................................................

## ජංගම ගිණුම

ජංගම හෙවත් වර්තන ගිණුමේ ප්‍රධාන උප ගිණුම් තුනකි.

- **භාණ්ඩ හා සේවා ගිණුම**
  - **භාණ්ඩ ගිණුම** - ලෝකයේ එක් රටක් අනෙකුත් රටවල් සමග සිදු කරන භාණ්ඩ අපනයන හා ආනයන සටහන් කරන ගිණුම **භාණ්ඩ ගිණුම** හෙවත් වෙළෙඳ ගිණුම ලෙස හැඳින්වේ. මෙම ගිණුමේ ශේෂය වෙළෙඳ ශේෂ ලෙස හැඳින්වේ.
  - **සේවා ගිණුම** - රටක් විසින් අනෙකුත් රටවල් සමග සාධක නොවන සේවා සඳහා කරනු ලබන ගෙවීම් සහ ලැබෙන ආදායම් සටහන් කරනු ලබන ගිණුම **සේවා ගිණුම** ලෙස හැඳින්වේ. සේවා ගිණුමට මුහුදු ප්‍රවාහන, සංචාරක සේවා, මූල්‍ය සේවා, විදුලි සංදේශ සේවා, රක්ෂණ සේවා යනාදිය ඇතුළත් වේ.

  භාණ්ඩ ගිණුමේ ශේෂ සහ සේවා ගිණුමේ ශේෂ ගැළපීමෙන් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය ලැබේ.

- **ප්‍රාථමික ආදායම් ගිණුම**

  නිෂ්පාදනය ආශ්‍රිතව පැන නගින පොළී, වැටුප්, මූල්‍ය වත්කම් ආයෝජනයෙන් ලබන ලාභාංශ වැනි දෑ ඇතුළත් ගිණුම ප්‍රාථමික ආදායම් ගිණුම වේ.

- **ද්විතියික ආදායම් ගිණුම**

  රටක නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන රාජ්‍ය හා පෞද්ගලික සියලුම ජංගම සංක්‍රාම ද්විතියික ආදායම් ගිණුමේ සටහන් කෙරේ.

  **ද්විතියික ආදායම් ගිණුම = විදේශ සංක්‍රාම ලැබීම් – විදේශ සංක්‍රාම ගෙවීම්**

  ඒ අනුව භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සහ ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය ගැළපීමෙන් ජංගම ගිණුමේ ශේෂය ලැබේ.

## ප්‍රාග්ධන ගිණුම

නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම්, නේවාසික සහ අනේවාසිකයන් අතර සිදුවන ගනුදෙනු ප්‍රාග්ධන ගිණුමේ හර සහ බැර වශයෙන් සටහන් කෙරේ.

## නිෂ්පාදනය නොකළ මූල්‍ය වත්කම්

- බලපත්‍ර
- බදු ගිවිසුම්
- සන්නම්
- කීර්තිනාමය විකිණීම / මිල දී ගැනීම
- පුරස්කාර
- පේටන්ට් බලපත්‍ර
- රජයෙන් ලබා දෙන ප්‍රදාන

## මූල්‍ය ගිණුම

ගෙවුම් ශේෂ ලේඛණයේ අවසාන උප ගිණුම මූල්‍ය ගිණුම වන අතර නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගනුදෙනු මූල්‍ය ගිණුමෙහි සටහන් කෙරේ. කාර්යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිණුමේ ගනුදෙනු ප්‍රධාන කොටස් 5 කට බෙදිය හැකිය. එනම්,

- සෘජු ආයෝජන
- කළඹ ආයෝජන
- මූල්‍ය ව්‍යුත්පන්න
- වෙනත් ආයෝජන
- විදේශ සංචිත වත්කම්

## ගෙවුම් ශේෂ ලේඛනයක ආකෘතිය

(රු. මිලියන)

| අයිතමය | බැර | හර |
|---|---|---|
| වෙළෙඳ ගිණුම | | |
| අපනයන | 1,000 | |
| ආනයන | | 1,300 |
| මූල්‍ය නොවන රත්රන් ලැබීම් | 150 | |
| මූල්‍ය නොවන රත්රන් ගෙවීම් | | 200 |
| සේවා ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 600 |
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | | (150) |
| | | |
| ප්‍රාථමික ආදායම් ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 1,000 |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | | (200) |
| | | |
| ද්විතියික ආදායම් ගිණුම | | |
| සේවා නියුක්ති ප්‍රේශණ ලැබීම් | 1,800 | |
| සේවා නියුක්ති ප්‍රේශණ ගෙවීම් | | 800 |
| රජයේ සංක්‍රාම ලැබීම් | 400 | |
| ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය | 1,400 | |
| ජංගම ගිණුමේ ශේෂය | 1,050 | |

| අයිතමය | බැර | හර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | |
| ප්‍රාග්ධන ලැබීම් | 600 | |
| ප්‍රාග්ධන ගෙවීම් | | 300 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 300 | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 1,350 | |

| | | |
|---|---|---|
| මූල්‍ය ගිණුම | | |
| සෘජු ආයෝජන - වත්කම් | 150 | |
| සෘජු ආයෝජන - වගකීම් | | 100 |
| විවිධ ආයෝජන - වත්කම් | 200 | |
| විවිධ ආයෝජන - වගකීම් | | 150 |
| අනෙකුත් ආයෝජන - වත්කම් | 150 | |
| අනෙකුත් ආයෝජන - වගකීම් | | 50 |
| සංචිත වත්කම් (ශුද්ධ) | 250 | |
| මූල්‍ය ගිණුමේ ශේෂය | 450 | |

**සමස්ත ශේෂය**

ගිණුම් තැබීමේ දී අනුගමනය කරනු ලබන ද්විත්ව සටහන් ප්‍රවේශය නිසා ගෙවුම් ශේෂ ලේඛනයේ බැර සටහන් හා හර සටහන් එකිනෙකට සමාන වන බැවින්, ගෙවුම් ශේෂ ලේඛනයක් අවසානයේදී අනිවාර්යෙන්ම තුලනය වේ.

ඉහත කල්පිත ගෙවුම් තුලන ලේඛනයේ ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. මිලියන 1,350ක් වන අතර මූල්‍ය ගිණුමේ ශේෂය රු. මිලියන 450ක් ය. ද්විත්ව සටහන් මූලධර්මය අනුව ඉහත ශේෂ දෙක සමාන විය යුතුය. මේ නිසා ශුද්ධ වැරදීම් හා අත්හැරීම් ශේෂ දෙක සමාන විය යුතුය. මේ නිසා ශුද්ධ වැරදීම් හා අත්හැරීම් රු. මිලියන 900ක් ලෙස ගෙන ඉහත ශේෂ දෙක සමාන කළ හැකිය.

## අන්තර්ජාතික වෙළෙඳාම තුළින් ව්‍යාපාර ප්‍රසාරණය

අන්තර්ජාතික වෙළෙඳාම තුළින් රටකට ලෝකයේ සෙසු රටවල් සමග සෘජුව කටයුතු කිරීමට අවස්ථාව සැලසේ. මෙලෙස දේශීය ව්‍යාපාරික කටයුතු විදේශීය වෙළෙඳපොළ වෙත ව්‍යාප්ත කිරීම තුලින් ප්‍රතිලාභ ලබා ගත හැකි වුවද ඒ තුලින් අවාසි සිදු වීමේ ඉඩ ප්‍රස්තා ද පවතී. අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වීමෙන් ව්‍යාපාර වෙත බොහෝ ප්‍රතිලාභ ලබා ගත හැකිය. වර්තමානයේ බොහෝ ව්‍යාපාර එක් රටකට පමණක් සීමා නොවී සමස්ත ලෝකය පුරාම ව්‍යාප්ත වීමට අන්තර්ජාතික වෙළෙඳාම උපකාරී වී ඇත. ගෝලීය වශයෙන් ව්‍යාපාර ක්ෂේත්‍රයන් ව්‍යාප්ත කිරීමට අන්තර්ජාතික වෙළෙඳාම දායක වී ඇත. නව ව්‍යාපාර අවස්ථා සඳහා විශාල ඉඩකඩක් මේ තුළින් ලැබී ඇති අතර ව්‍යාපාර වල තරගකාරීත්වය ඉහළ නැංවීමට ද අන්තර්ජාතික වෙළෙඳාමේ ඉඩ ප්‍රස්තා සලසා ඇත. නමුත් දේශීය ළදරු කර්මාන්තවලට විදේශ වෙළෙඳපොළ සමග තරග කිරීමේ හැකියාව අඩු මට්ටමක පවතින බැවින් අන්තර්ජාතික වෙළෙඳාමේ අවාසිදායක තත්වයන්ද හට ගත හැකිය.

මේ අනුව කිසියම් ව්‍යාපාරයක් විදේශ වෙළඳපොළට ප්‍රවේශ වීමට පෙර ඒ පිළිබඳව පුළුල් අවබෝධයකින් යුක්තව කටයුතු කිරීම ඉතා වැදගත් වන අතර ව්‍යාපාර සඳහා ඇති ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම වැදගත් වේ. කිසියම් රටක ජාතික ආදායම් ඉහළ නැංවීම සඳහා අන්තර්ජාතික වෙළෙඳාම විශාල පිටිවහලක් වන බැවින් සෑම රටක්ම අන්තර්ජාතික වෙළෙඳාමෙන් උපරිම වාසි ලබා ගැනීමට උත්සාහ දරයි.

## විදේශ විනිමය වෙළෙඳපොළ හා එහි නිර්ණායක

කිසියම් මුදල් ඒකකයක මිල තවත් මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම විනිමය අනුපාතය ලෙස හඳුන්වනු ලැබේ.

විනිමය අනුපාතය ප්‍රකාශ කරන ආකාර දෙකකි.

1. ඍජු කියවීම හෙවත් මිල කියවීම.
2. වක්‍ර කියවීම හෙවත් ප්‍රමාණ කියවීම.

විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක මිල දේශීය ව්‍යවහාර මුදල් ඒකක වලින් ප්‍රකාශ කිරීම ඍජු කියවීම හෙවත් මිල කියවීම යන්නෙන් අදහස් කෙරේ. ලෝකයේ බොහෝ රටවල විනිමය අනුපාතය ප්‍රකාශ කරනුයේ මෙම ක්‍රමවේදය අනුවය.

උදා- ඇමරිකානු ඩොලර් 1 = ශ්‍රී ලංකා රුපියල් 180
යුරෝ 1 = ශ්‍රී ලංකා රුපියල් 165
ජපන් යෙන් 1 = ශ්‍රී ලංකා රුපියල් 1.60


වක්‍ර කියවීම හෙවත් ප්‍රමාණ කියවීම යනුවෙන් අදහස් කරන්නේ දේශීය මුදල් ඒකකයේ මිල විදේශ ව්‍යවහාර මුදල් ඒකක වලින් දැක්වීමයි.

උදා - ශ්‍රී ලංකා රුපියල් 1 = ඇමරිකානු ඩොලර් 0.0055 (1/180)
ශ්‍රී ලංකා රුපියල් 1 = යුරෝ 0.006 (1/160)
ශ්‍රී ලංකා රුපියල් 1 = ජපන් යෙන් 0.62 (1/1.60)

විදේශ විනිමය හුවමාරු වන ආයතනික ව්‍යුහයන්ගේ සම්බන්ධතාවය විදේශ විනිමය වෙළෙඳපොළ වේ. එනම් විදේශ විනිමය ඉල්ලුම්කරුවන් හා විදේශ විනිමය සැපයුම්කරුවන් විනිමය අනුපාතිකය තීරණය කරගැනීම සම්බන්ධ ආයතනික ව්‍යුහය විනිමය වෙළෙඳපොළයි. ජාත්‍යන්තර වෙළෙඳාම තුල සිදුකරන ගනුදෙනු පහසු කිරීමේ අරමුණින් විදේශ විනිමය වෙළෙඳපොළ සකස් වී ඇති අතර මෙය ලෝකයේ විශාලතම වෙළෙඳපොළයි.

## විදේශ විනිමය අනුපාතික තීරණය වීම

ඍජු කියවීමේ ක්‍රමයට විදේශ විනිමය අනුපාතිකය තීරණය වන්නේ විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට පවතින ඉල්ලුම හා සැපයුම මතය. නිදසුනක් ලෙස ඇමරිකා එක්සත් ජනපද ඩොලරයේ රුපියල් මිල තීරණය වන්නේ විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ඩොලර් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මතය.



ඩොලර් සඳහා ඉල්ලුමක් හටගන්නේ විදේශ රටවලින් භාණ්ඩ ආනයනය කිරීමට, විදේශ රටවල සංචාරය කිරීමට, ණය ආපසු ගෙවීමට, ණය සඳහා පොලිය ගෙවීමට හා විදේශ රටවලට සංක්‍රාම ගෙවීමට ආදී ගෙවුම් ශේෂ ලේඛනයේ ගෙවීම් ගනුදෙනු පියවීමටය.

ඩොලර් සඳහා සැපයුමක් ඇතිවන්නේ භාණ්ඩ අපනයන සේවා ලැබීම්, ප්‍රාථමික ආදායම් ලැබීම්, ද්විතියික ආදායම් ලැබීම් ආදී ගෙවුම් තුලන ලේඛනයේ ලැබීම් ගනුදෙනු මගිනි.

## විදේශ විනිමය අනුපාත ක්‍රම හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම

## විනිමය අනුපාතික ක්‍රම

ප්‍රධාන වශයෙන් විනිමය අනුපාත ක්‍රම 3 ක් පිළිබඳව හඳුනාගත හැකිය.

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

### ස්ථාවර විනිමය අනුපාතය

මූල්‍ය අධිකාරියක් විසින් තීරණය කරන ලද විනිමය අනුපාතිකයක් නැවත මූල්‍ය අධිකාරිය විසින්ම වෙනස් කරන තෙක් එකම මට්ටමක පවතින්නේ නම් එය ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය යි. මෙහිදී විනිමය අනුපාතිකය කිසියම් නිශ්චිත අගයක පවත්වා ගන්නා අතර ඉල්ලුම් සැපයුම් බලවේග මත වෙනස් වීම සිදු නොවේ. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය පදනම් වූයේ රන් හුවමාරු ක්‍රමයට වන අතර මුදල් නිකුත් කිරීම පදනම් වන්නේ රන් සංචිත ක්‍රමය මතය.

### නම්‍ය විනිමය අනුපාතය

විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සඳහා පවත්නා ඉල්ලුම හා සැපයුම මත පදනම්ව විනිමය අනුපාතිකය තීරණය වන ක්‍රමවේදයක් නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය ලෙස අදහස් කෙරේ. මෙය චල විනිමය අනුපාතිකය, පාවෙන විනිමය අනුපාතිකය යන නම් වලින් ද හඳුන්වනු ලබයි. මෙය ඉල්ලුම් හා සැපයුම් බලවේගවල වෙනස්වීම් මත නිරන්තර උච්චාවචනයන්ට පාත්‍ර වේ. විදේශ විනිමය සඳහා පවත්නා ඉල්ලුම ඉහළ යන විට විදේශ විනිමය අනුපාතිකය වැඩි වන අතර විදේශ විනිමය සඳහා පවත්නා ඉල්ලුම පහළ යන විට විදේශ විනිමය අනුපාතිකය ද පහළ යයි. නම්‍ය විනිමය අනුපාතිකය චල ස්වභාවයක් ගැනීමට හේතු වනුයේ රටක් තුළට ගලා එන හා රටින් පිටතට ගලා යන විදේශ විනිමය ප්‍රවාහයන්ය. වර්තමානයේ බොහෝ රටවල් භාවිතා කරනුයේ නම්‍ය විනිමය අනුපාතිකයයි.

### පාලිත නම්‍ය විනිමය අනුපාතිකය

ස්ථාවර විනිමය අනුපාතිකය හා නම්‍ය විනිමය අනුපාතිකයේ වාසි අත්කර ගැනීම සඳහා පාලිත නම්‍ය විනිමය අනුපාතිකය සකස් වී ඇති අතර ස්ථාවර විනිමය අනුපාතිකය සහ නම්‍ය විනිමය අනුපාතිකයේ සංකලනයක් ලෙස මෙය හැඳින්විය හැකිය. ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන අවස්ථාවක එය කිසියම් පරාසයක් තුළ වෙනස් වීමට ඉඩ සලසා ඇති අතර එම පරාසය ඉක්මවා විනිමය අනුපාතිකය තීරණය වන විට මූල්‍ය අධිකාරිය විනිමය වෙළෙඳපොළට මැදිහත් වී විනිමය විකිණීම හෝ විනිමය මිලදී ගැනීම මගින් විනිමය අනුපාතිකයේ වෙනස් වීම් පාලනය කරනු ලබයි. එය පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය යි.

# විනිමය අනුපාතිකය ක්ෂය වීම පාලනය කරන ක්‍රම

නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ දේශීය ව්‍යවහාර මුදල් ඒකකයේ වටිනාකම විදේශීය මුදලින් පහල වැටීම විනිමය අනුපාතිකය ක්ෂයවීම ලෙස හැඳින්වේ.

නිදසුනක් ලෙස සෘජු කියවීමට අනුව ඇමරිකානු ඩොලරයේ මිල රු.180ක්ව තිබී එය රු.190 දක්වා ඉහළ ගියහොත් එයින් අදහස් කරන්නේ රුපියලේ විදේශ විනිමය වටිනාකම පහළ වැටීමක් හෙවත් ක්ෂයවීමක් සිදුවී ඇති බවයි. එනම් විදේශ මුදල් ඒකකයක් මිලට ගැනීමට ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ප්‍රමාණය ඉහළ ගොස් ඇති බවයි.

## විනිමය අනුපාතික ක්ෂයවීමක ආර්ථික ප්‍රතිවිපාක

- ආනයන වල දේශීය මිල ඉහළ යාම.
- පෙරට වඩා ආනයන වියදම් ඉහළ යාම.
- දේශීය ඉල්ලුම ආනයන මත රඳා පවතී නම් දේශීය උද්ධමනය / ඉහළ යාම.
- විදේශීය ණය වාරික සහ පොළිය ඉහළ යාම.
- අපනයන භාණ්ඩ සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවී අපනයන ඉපයීම් ඉහළ යාම.
- සංචාරක ඉපයීම් ඉහළ යන අතර ගෙවුම් තුලන ලේඛනයේ සේවා ගිණුමේ ශේෂය හිතකර වීම.
- සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම නිසා සංක්‍රමණ ගිණුම යහපත් වීම.
- ආනයන මිල ඉහළ යාම නිසා ආනයන අධෛර්යමත් වී ආනයන ඉල්ලුම දේශීය වෙත යොමු වීම.

## රටක විනිමය අනුපාතිකය ක්ෂය වීම වළක්වා ගන්නා ආකාරය

නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් යටතේ දේශීය ව්‍යවහාර මුදල් ඒකකයේ වටිනාකම විදේශීය මුදලින් පහළ වැටීම විනිමය අනුපාතිකය ක්ෂය වීමයි.

*උදා-* *සෘජු කියවීමේ ක්‍රමයට අනුව ඇමරිකානු ඩොලරයක මිල රුපියල් 180 සිට රුපියල් 185 දක්වා ඉහළ යාමක් සිදු වන්නේ නම් ඉන් පැහැදිලි වන්නේ රුපියලේ අගය ක්ෂය වීමක් ය.*

මෙලෙස රුපියලේ අගය ක්ෂය වීම තුළින් ආනයනවල දේශීය මිල ඉහළ යන අතර අපනයන වල මිල අඩු වීම තුලින් අපනයනවල තරගකාරීත්වය ඉහළ යාමක් සිදු වේ. මේ අනුව විනිමය අනුපාතිකය ක්ෂය වීම වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

- අපනයනවල තරගකාරිත්වය ඉහළ නැංවීම
- ආනයන සඳහා කෙරෙන වියදම පහළ දැමීමට කටයුතු කිරීම
- අභ්‍යන්තර සමතුලිතතාවය රැකගැනීමට අවශ්‍ය සම්පත් යෙදවෙන ආකාරයටම බාහිර සමතුලිතතාවය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
- මූල්‍ය ප්‍රතිපත්ති බාහිර සාධකවල බලපෑමකින් තොරව නිදහසේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

**අන්තර්ජාතික වෙළෙඳාම**

කිසියම් රටක් තවත් රටක් හෝ රටවල් කිහිපයක් සමග භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීමයි.

**නිරපේක්ෂ වාසි න්‍යාය**

කිසියම් රටක් කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් හෙවත් වැඩි කාර්යක්ෂමතාවයකින් නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ වාසි පවතී.

**සාපේක්ෂ වාසි න්‍යාය**

කිසියම් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයක් යටතේ නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතී.

**වෙළෙඳ අනුපාතය**

අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස හැඳින්වේ.

**ආරක්ෂණවාදය**

විදේශීය භාණ්ඩ දේශීය වෙළෙඳපොළ තුළට නිදහසේ ඇතුළු වීම සීමා කරන හෝ වළක්වන ඕනෑම ක්‍රියාමාර්ගයක් ආරක්ෂණවාදය නමින් හැඳින්වේ.

**ගෙවුම් ශේෂය**

වර්ෂයක කාලපරිච්ඡේදයක් තුළ රටක් විසින් අනෙකුත් රටවල් සමග කරන ලද ආර්ථික ගනුදෙනු මත වෙනත් රටවල් වලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනය ගෙවුම් ශේෂ ලේඛනය හෙවත් ගෙවුම් තුලන ලේඛනය ලෙස හැඳින්වේ.

**විනිමය අනුපාතිකය**

කිසියම් මුදල් ඒකකයක මිල තවත් මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම විනිමය අනුපාතිකය ලෙස අදහස් කෙරේ.

- ස්ථාවර විනිමය අනුපාතය
- නම්‍ය විනිමය අනුපාතය
- පාලිත නම්‍ය විනිමය අනුපාතය

# අභ්‍යාස

1. සාපේක්ෂ වාසි යනු
   I. එක් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු පිරිවැයකින් භාණ්ඩ නිපදවීම
   II. එක් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවීම
   III. එක් රටක් තවත් රටකට සාපේක්ෂව වැඩි ඵලදායීතාවකින් භාණ්ඩ නිපදවීම
   IV. එක් රටක් තවත් රටකට සාපේක්ෂව වැඩි භාණ්ඩ ප්‍රමාණයක් නිපදවීම

2. කිසිදු භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා නිරපේක්ෂ වාසියක් නොමැති රටක් සම්බන්ධයෙන් නිවැරදි වරණය තෝරන්න.
   I. කිසිදු භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීම සඳහා මෙරටට සාපේක්ෂ වාසි හිමි නොවේ.
   II. වැඩිම ආවස්ථික පිරිවැය සහිත භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතී.
   III. අඩුම නිරපේක්ෂ අවාසි සහිත භාණ්ඩය හෝ සේවාව නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතී.
   IV. අඩු සම්පත් ඒකක ප්‍රමාණයකින් නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හෝ සේවාව හෝ නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතී.

3. ගෙවුම් ශේෂ ලේඛණයේ වෙළෙඳ ගිණුම ධන අගයක් ගනු ලබන්නේ,
   I. අපනයන කළ භාණ්ඩවල වටිනාකම ආනයනය කළ භාණ්ඩවල වටිනාකමට වඩා වැඩි නම්.
   II. අපනයනය කළ භාණ්ඩවල වටිනාකම ආනයනය කළ භාණ්ඩවල වටිනාකමට වඩා අඩු නම්.
   III. ආනයනය කළ භාණ්ඩවල වටිනාකම අපනයනය කළ භාණ්ඩවල වටිනාකමට වඩා වැඩි නම්.
   IV. ආනයනය කළ භාණ්ඩවල වටිනාකම හා අපනයනය කළ භාණ්ඩවල වටිනාකමට සමාන නම්.

4. ආරක්ෂණවාදය සඳහා යොදා ගන්නා තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගයක් නොවන්නේ,
   I. ප්‍රපාතනය II. සළාක කිරීම
   III. තීරු බදු පැනවීම IV. අපනයන සීමා පැනවීම

5. ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමට අදාළ උප ගිණුමක් නොවන්නේ
   I. භාණ්ඩ ගිණුම II. මූල්‍ය ගිණුම
   III. සේවා ගිණුම් IV. ප්‍රාථමික ආදායම් ගිණුම

6. ඉල්ලුම් සැපයුම් බලවේග මත විනිමය අනුපාතය තීරණය වන්නේ
   I. නම්‍ය විනිමය අනුපාතක ක්‍රමය
   II. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය
   III. පාලික නම්‍ය විනිමය අනුපාත ක්‍රමය
   IV. මූර්ත විනිමය අනුපාත ක්‍රමය

7. මුදල් ඒකකයක් තුළින් දේශීය වෙළෙඳපොළේ මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය හඳුන්වනුයේ
   I. මුදලේ දේශීය මූර්ත අගය
   II. මුදලේ විදේශීය මූර්ත අගය
   III. මුදලේ දේශීය අගය
   IV. මුදලේ විදේශීය නිල අගය

8. සාපේක්ෂ වාසි හට ගන්නා ප්‍රධාන මූලාශ්‍රයක් නොවන්නේ
   I. ශ්‍රමයේ නිපුනතා
   II. ගුණාත්මක තත්වය
   III. අභිරුචියේ වෙනස්කම්
   IV. තාක්ෂණික වෙනස්කම්

9. ආරක්ෂණවාදයේ පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්කයක් නොවන්නේ
   I. දේශීය ළදරු කර්මාන්ත ආරක්ෂා වීම
   II. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් වීම
   III. අවගුණ භාණ්ඩ ආනයන වැළැක්වීම සඳහා
   IV. දියුණු තාක්ෂණය සංක්‍රමණයට බාධා ඇති වීම

10. මූල්‍ය ගිණුමේ උප ගිණුමක් ලෙස නොසලකනුයේ
   I. මූල්‍ය ව්‍යුත්පන්න
   II. වර්තන ගිණුම
   III. වෙනත් ආයෝජන
   IV. විදේශ සංචිත වත්කම්

11. නිරපේක්ෂ වාසි න්‍යාය හා සාපේක්ෂ වාසි න්‍යාය අතර වෙනස පැහැදිලි කරන්න.
12. වෙළෙඳ අනුපාතය යන්නෙන් කුමක් අදහස් වන්නේ ද?
13. ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවල ඇති වාසි සහ අවාසි දක්වන්න.
14. අන්තර්ජාතික වෙළෙඳාම තුළ තරගකාරීත්වයේ වාසි යනුවෙන් කුමක් අදහස් වන්නේ ද?
15. නම්‍ය විනිමය අනුපාතිකය සහ ස්ථාවර විනිමය අනුපාතිකය අතර පවත්නා වෙනස පැහැදිලි කර දක්වන්න.

## 2020 ජුලි

**1.7** එකම පිරිවැයක් යටතේ භාණ්ඩයක් හෝ සේවාවක් වෙනත් රටවල්වලට වඩා වැඩි ප්‍රමාණයකින් කිසියම් රටකට නිපදවිය හැකිනම්, හෝ එම භාණ්ඩ ප්‍රමාණයම වඩා අඩු පිරිවැයක් යටතේ නිපදවිය හැකිනම්, එය හඳුන්වනු ලබන්නේ:

(1) නිරපේක්ෂ වාසිය ලෙසයි. (2) වෙළෙඳ අනුපාතය ලෙසයි.

(3) සාපේක්ෂ වාසිය ලෙසයි. (4) ආරක්ෂණවාදය ලෙසයි.

06.
(A) (a) අන්තර්ජාතික වෙළදාමේ වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

## 2021 ජනවාරි

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛනයේ මූල්‍ය ගිණුමේ ඇතුලත් වන්නේ කුමක් ද?

(1) සෘජු විදේශ ආයෝජන. (2) භාණ්ඩ අපනයන.

(3) රාජ්‍ය ප්‍රදාන. (4) භාණ්ඩ ආනයන.

05.
(a) අන්තර්ජාතික වෙළදාමේ අවාසි (disadvantages) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ආරක්ෂණවාදයේ (protectionism) වාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ඇමරිකානු ඩොලරයට ($) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය (devaluing) වීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වන ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

## 2020 ජනවාරි

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළදාමේ අවාසියක් වන්නේ කුමක් ද?

(1) නිෂ්පාදනයේ වැඩිවීම. (2) වෙළෙඳ උච්චාවචනයන් අඩුවීම.

(3) සම්පත්වල උපරිම උපයෝජනය. (4) හානිදායක භාණ්ඩ ආනයනය කිරීම.

**1.10** යම් රටකට, තවත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකට නිෂ්පාදනය කිරීමේ හැකියාව:

(1) සාපේක්ෂ වාසිය වේ. (2) වෙළෙඳ අනුපාතය වේ.

(3) නිරපේක්ෂ වාසිය වේ. (4) ගෙවුම් ශේෂය වේ.

**1.12** වෙළෙඳ ගිණුම, ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ උප ගිණුමකි.

05.
(b) (i) ආරක්ෂණවාදය (protectionism) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(ii) ආරක්ෂණවාදයේ ඇති වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

## 2019 ජූලි

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිවල ගුණාත්මක පාලනයක් වන්නේ කුමක් ද?

(1) ශීර්ෂ පිළිබඳ උපරිම සීමා (portfolio ceilings).

(2) බැංකු පොලී අනුපාත ප්‍රතිපත්තිය (bank rate policy).

(3) විවට වෙළෙඳ කටයුතු (Open market operations).

(4) විචල්‍ය සංචිත අනුපාත ප්‍රතිපත්තිය (Variable reserve ratio policy).

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) රාජ්‍ය ණය කළමනාකරණය.

(2) ණය සහ අයිරා පහසුකම් සැලසීම.

(3) විදේශ විනිමය කළමනාකරණය.

(4) මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය.

1.12 මුදලේ විදේශීය මූර්ත අගය (real external value) යනුවෙන් අදහස් කරන්නේ මුදල් ඒකකයකින් දේශීය වෙළෙඳපොළේදී මිලදී ගතහැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණයයි.

05.
සම්පත් ඒකකයක් භාවිත කරමින් පකිස්ථානය සහ ඉන්දියාව මගින් නිෂ්පාදනය කළ ලොකු එනු සහ සුදු එනු කිලෝග්‍රෑම් ප්‍රමාණ පහත වගුවේ පෙන්වා ඇත:

| රට | ලොකු එනු (කිලෝග්‍රෑම්) | සුදු එනු (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| පකිස්ථානය | 24 | 12 |
| ඉන්දියාව | 4 | 8 |

(a) (i) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසිය (absolute advantage) ඇත්තේ කුමන රටටදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(ii) එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසිය (comparative advantage) ඇත්තේ කුමන රටටදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ජාත්‍යන්තර වෙළඳාමේ වාසි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

## 2018 ජූලි

1.8 දේශීය වෙළෙඳපොළේ මුදල් ඒකකයකින් මිලදී ගත හැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ:

(1) මුදලේ දේශීය මූර්ත අගය (Internal real value of money) ලෙසයි.

(2) මුදලේ විදේශීය නිල අගය (Official external value of money) ලෙසයි.

(3) මුදලේ විදේශීය අගය (External value of money) ලෙසයි.

(4) මුදලේ විදේශීය මූර්ත අගය (Real external value of money) ලෙසයි.

05.

(a) **A** සහ **B** යන රටවල් දෙකම තිරිඟු සහ අල නිෂ්පාදනය කරන බව සිතන්න. සම්පත් ඒකක එකක් භාවිත කරමින් රටවල් දෙකම නිෂ්පාදනය කරනු ලබන තිරිඟු සහ අල ඒකක ප්‍රමාණයන් පහත වගුවේ සාරාංශගත කර දක්වා ඇත:

| නිෂ්පාදිතය / රට | තිරිඟු (කිලෝග්‍රෑම්) | අල (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| A | 6 | 4 |
| B | 1 | 3 |

එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසිය (comparative advantage) ඇත්තේ කුමන රටකටදැයි ආධාරක ගණනය කිරීම් ද සහිතව, **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට (US Dollor) එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය (devaluation) වීමේ ප්‍රතිවිපාක හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

## 2019 ජනවාරි

**1.10** ගෙවුම් ශේෂ ලේඛනයේ වෙළෙඳ ගිණුමේ ධනාත්මක ශේෂයෙන් පෙන්නුම් කරන්නේ:

(1) අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම, ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට වඩා වැඩි බවයි.

(2) අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම, ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට වඩා අඩු බවයි.

(3) අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම, ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට සමාන බවයි.

(4) අපනයන මිල දර්ශකය, ආනයන මිල දර්ශකයට වඩා අඩු බවයි.

**1.19** විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම මත පදනම්ව තීරණය වන විනිමය අනුපාතිකය හඳුන්වනු ලබන්නේ …………………… *(ස්ථාවර / පාවෙන)* විනිමය අනුපාතිකය ලෙසයි.

05.

(b) ආරක්ෂණවාදයේ (protectionism) අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ඇමරිකානු ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල මෑතකදී අවප්‍රමාණය වීමට ප්‍රධාන හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

# 07. ආර්ථික වර්ධනය, සංවර්ධන හා ආර්ථිකයේ නව ප්‍රවණතා

**පරිච්ඡේදයේ හැඳින්වීම**

මෙම පරිච්ඡේදය තුළින් ආර්ථික වර්ධනය හා සංවර්ධනය පිළිබඳව විග්‍රහ කරන අතර ප්‍රධාන වශයෙන් එම සංකල්ප අතර පවතින වෙනස්කම් පැහැදිලි කරනු ලබයි. ආර්ථික වර්ධනයත් සමග ආර්ථික ව්‍යුහයේ හට ගන්නා වෙනස්කම් සහ එම වෙනස්කම් තුළින් ආර්ථික කටයුතුවලට සිදුවන බලපෑම් විස්තර කරනු ලබයි. මෑත කාලීන ආර්ථික ඒකකයන් තුළ වඩාත් කතාබහට ලක්වන තිරසාර සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර තිරසාර සංවර්ධනය ඇති කර ගැනීමට අවශ්‍ය කරුණු විග්‍රහ කෙරේ.

එසේම තිරසාර සංවර්ධනයත් සමග ගිණුම්කරණය හා ව්‍යාපාර වල සිදුවන වෙනස්කම් මෙම පරිච්ඡේදය තුළ පැහැදිලි කෙරෙන අතර විෂය නිර්දේශය තුළ 5% ක බර තැබීමක් තබා ඇත.

# ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය

## ආර්ථික වෘද්ධිය

ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වන්නේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩි වීමයි. එනම් භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුමේ ඉහළ යාමයි. ආර්ථික වෘද්ධියේ දී මූර්ත නිමවුම දිගු කාලීනව ප්‍රසාරණය වීමක් සිදු වේ. ආර්ථික වෘද්ධි අනුපාතය යොදා ගනිමින් ආර්ථික වෘද්ධිය මනිනු ලැබේ.

උදා : කිසියම් කල්පිත ආර්ථිකයක 2019 වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 2000 අතර 2020 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 2200 විය. ඒ අනුව 2020 වසරේ ආර්ථික වර්ධන අනුපාතය පහත පරිදි ගණනය කළ හැකිය.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

## ආර්ථික වෘද්ධිය තීරණය කෙරෙන සාධක

පොදුවේ ඕනෑම රටක ආර්ථික වර්ධනය හෙවත් මූර්ත ජාතික නිෂ්පාදිතය ඉහළ යාම තීරණය කරන ප්‍රධාන සාධක කිහිපයක් පවතී. මෙකී සාධකවල බලපෑම මත ආර්ථික වර්ධන වේගය අඩු වැඩි වේ.

**සම්පත් සම්භාරය**

- භෞතික ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය

**ඵලදායිතාව**

- තාක්ෂණය
- නවෘතා බිහිවීම
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා ආයෝජනය

ආර්ථික ස්ථායීතාවය

දේශපාලන ස්ථාවරත්වය

යහපාලනය

සානුබල

## ආර්ථික වෘද්ධියේ වැදගත්කම

### ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ සහ පිරිවැය

රටක සාර්ව ආර්ථික අරමුණු අතර එක් ප්‍රධාන අරමුණක් ලෙස ආර්ථික වර්ධනය සලකනු ලබන්නේ එමගින් ආර්ථිකයට ඉතා විශාල ප්‍රතිලාභ රාශියක් ලබාගත හැකි නිසාය. කෙසේ වෙතත් ඇතැම් විට ආර්ථික වර්ධනය නිසා පිරිවැයක් හෙවත් අවාසිදායක ප්‍රතිඵල බිහිවේ.

- ..................................................................................................................................................
- ..................................................................................................................................................
- සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගත හැකි වීම
- ආයෝජනය ශක්තිමත් වීම
- විශ්වාසනීයත්වය වර්ධනය වීම නිසා ව්‍යාපාරිකයන්ගේ ලාභ වැඩි වීම

### ආර්ථික වෘද්ධියේ අවාසි

- ..................................................................................................................................................
- ..................................................................................................................................................
- ප්‍රදේශීය විෂමතා ඇති වීම
- ආර්ථිකයේ උද්ධමනකාරී රීතත්ත්වයක් පැන නැගීම
- වර්තමාන පරිභෝජනය පහළ යාම

ආර්ථික වර්ධනයත් සමග පහත දැක්වෙන ආකාරයේ ව්‍යුහාත්මක වෙනස්කම් කිහිපයක් සිදුවේ.

- කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය ක්‍රමයෙන් පහත වැටීම
- කාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය ක්‍රමයෙන් ඉහළ යාම
- ආර්ථිකයේ වැදගත්ම අංශය බවට සේවා අංශය පත්වීම

## ආර්ථික සංවර්ධනය

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

ආර්ථික සංවර්ධනය යනු ආර්ථික වෘද්ධියේ පරිණාමන ක්‍රියාවලියකි. එනම් ආර්ථික වෘද්ධිය හා බැඳී ඇති ආර්ථික ව්‍යුහයන්ගේ වෙනස් වීම් ආර්ථික සංවර්ධනය තුළින් පිළිබිඹු වේ.

ආර්ථික වෘද්ධිය ප්‍රමාණාත්මක වන අතර ආර්ථික සංවර්ධනය යනු ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක ලක්ෂණ වලින් සමන්විත වූවකි. ඒ අනුව ආර්ථිකයේ සිදුවන ගුණාත්මක වෙනස්කම් පහත පරිදි දැක්විය හැකිය.

- නවීකරණය වීම
- නිෂ්පාදන ශිල්ප ක්‍රම හා තාක්ෂණය උසස් වීම
- කාර්මීකරණය වේගවත් වීම
- නිෂ්පාදන සම්පත් වල ඵලදායකත්වය ඉහළ යාම
- දුගී බව, විරැකියාව අඩු වීම හා ආදායම් විෂමතාව නැති වීම
- නිෂ්පාදන අංශයන්හි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වීම

## ආර්ථික සංවර්ධනය

ආර්ථික වර්ධනය යනු ආර්ථික සංවර්ධනයේ පූර්ව කොන්දේසියක් වන අතර මෙකී තත්ත්වයන් දෙක එකිනෙක හා බද්දවී පවතියි. කෙසේ වෙතත් මෙම සංකල්ප දෙක අතර න්‍යායාත්මක හා ප්‍රායෝගික වෙනස්කම් කිහිපයක් පහත දැක්වෙන පරිදි හඳුනාගත හැක.

ආර්ථික වෘද්ධිය තුළින 'ආර්ථිකයක නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වීම හෙවත් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ප්‍රසාරණය වීමක් පෙන්නුම් කරන අතර ආර්ථික සංවර්ධනය තුළින් ආර්ථික වෘද්ධියට අමතරව මිනිස් ජීවිතයේ ගුණාත්මක තත්ත්වය ඉහළ යාමක් පෙන්නුම් කරයි.

ආර්ථික වෘද්ධිය තුළින් ප්‍රමාණාත්මක වර්ධනයක් පමණක් පෙන්නුම් කරන අතර ආර්ථික සංවර්ධනය තුළින් ප්‍රමාණාත්මක පැතිකඩ මෙන්ම ගුණාත්මක පැතිකඩ පිළිබඳව ද අවධානය යොමු කරයි.

මෙකී සංකල්ප මැන දැක්වීම සඳහා එකිනෙකට වෙනස් මිනුම් දඬු භාවිතවේ.

## මානව සංවර්ධනය

මානව සංවරර්ධනය යනු මිනිසුන් විසින් තම මානව හැකියාවන් වර්ධනය කර ගැනීමත් සමගම එම හැකියාවන් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික යන ක්ෂේත්‍රයන්හි භාවිත කිරීමට ඇති හැකියාව ලබාදීමත්, අනාගත පරම්පරාවට ද එම අයිතිය තහවුරු කිරීමත් වේ.

## මානව සංවර්ධනයේ පැතිකඩයන්

- ආදායම
- අධ්‍යාපනය
- සෞඛ්‍ය තත්ත්වය
- දේශපාලන ස්වාධීන බව
- යහපත් සවිබල සම්බන්ධතා
- සවිබල ගැන්වීම
- සමානතාව

## තිරසාර සංවර්ධනය

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

එනම් වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගත යුත්තේ අනාගත පරම්පරාවන්ට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති ඉඩප්‍රස්ථා අහිමි නොකරමින් බව මින් අදහස් කරයි. එමෙන්ම තිරසාර සංවර්ධනය සඳහා ආර්ථික, සමාජීය හා පරිසරික යන අංශයන්ගේ තුලනාත්මක වර්ධනයක් සිදු විය යුතුය.

## තිරසාර සංවර්ධනයේ පැතිකඩයන්

- .......................................................................................................................................
    - කාර්යක්ෂමතාව
    - ස්ථායීතාව
- .......................................................................................................................................
    - හිතකර සනීපාරක්ෂක පරිසරය
    - ප්‍රතිශ්ඨාපනය කළ නොහැකි සම්පත් සුරැකීම
    - ප්‍රතිශ්ඨාපනය කළ හැකි සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම
- .......................................................................................................................................
    - සහභාගීත්වය
    - සාධාරණත්වය
    - සමාජ සහජීවනය
    - සවිබල ගැන්වීම
    - සංස්කෘතික අනන්‍යතාව
    - සමාජ සංචලතාව

## තිරසාර සංවර්ධනය සමග ගිණුම්කරණය හා ව්‍යාපාර තුළ වෙනස්වීමේ භූමිකාව

තිරසාර සංවර්ධනය තුළින් විග්‍රහ කරනුයේ ආර්ථිකය තුළ පවතින සීමිත සම්පත් භාවිත කාරීමේ දී අනාගත පරම්පරා වලට එම සම්පත් භාවිතා කිරීමට ඇති ඉඩ ප්‍රස්තාව සීමා නොකරමින් වර්තමාන පරම්පරාව තම සම්පත් භාවිතය සිදු කළ යුතු බවයි. මේ අනුව ආර්ථික, පාරිසරික හා සමාජීය පැතිකඩයන්හි තුලනාත්මක වර්ධනයක් තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය වන අතර එක් පැතිකඩකට හෝ වැඩි සාලකිල්ලක් දැක්වීමෙන් තිරසාර සංවර්ධනය බිඳ වැටීමට ඉඩ ප්‍රස්තාව පවතී.

මේ අනුව වර්තමාන පරම්පරාව ප්‍රතිශ්ඨාපනය කළ නොහැකි සම්පත් භාවිතයේ දී තිරසාර සංවර්ධනය පිළිබ1ඳව වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. ව්‍යාපාර ආයතන තම ව්‍යාපාර කටයුතු සඳහා සම්පත් බෙදා හරින ආකාර තීරණය කළ යුතුය. මේ අනුව ව්‍යාපාර සහ ගිණුමම්කරණ භූමිකාව තිරසාර සංවර්ධනයට සමගාමීව සිදුවන වෙනස්කම් වලට හැඩගැසීමට හැකි විය යුතු අතර විශේෂ කොට ව්‍යාපාර ආයතන ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීමේ දදීපාරරිසරික, සමාජීය, ආර්ථික පැතිකඩ පිළිබඳව තුළනාත්මක වර්ධනයක් අපේක්ෂා කළ යුතු අතර ඒ පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්වීමට වගබලා ගත යුතුය.

## ශ්‍රී ලාංකීය ආර්ථිකයේ නව ප්‍රවණතා

දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම් හට ගෙන ඇති අතර කෘෂිකාර්මික අංශයේ වැදගත්කම අඩු වී, කාර්මික හා සේවා අංශයේ වැදගත්කම වැඩි වී ඇත.

සේවා නියුක්තියේ කාලීනව වෙනස්කම් ලෙස කෘෂි අංශයේ සේවා නියුක්තිය අඩු වී ඇති අතර කාර්මික හා සේවා අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් ලබන කාණ්ඩයේ සිට ඉහළ මැදි ආදායම් ලබන කාණ්ඩය දක්වා උසස් වීමක් ලබා අතැ.

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ වැඩ කළ හැකි වයසේ ජනගහනයේ අඩු වීමක් දක්නට ඇති අතර ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඉහළ යාමක් සිදු වී ඇත. කාන්තාවන්ට සාපේක්ෂව පිරිමි ශ්‍රම සහභාගීත්ව අනුපාතය ඉහළ අගයක් ගන්නා නමුත් කාන්තාවන්ගේ ශ්‍රම සහභාගීත්වය මෑත කාලීනව ඉහළ යාමක් දක්නට ලැබේ.

විවෘත ආර්ථිකයත් සමග ශ්‍රී ලාංකීය සේවකයන් විදේශ සේවා නියුක්තිය කරා යොමුවීමේ ප්‍රවණතාව වැඩි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශයෙන් ගලා එන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වී ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් වන සංචාරක කර්මාන්තය අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන අතර පසුගිය වර්ෂ කිහිපයේම සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කරයි.

**අභ්‍යාසය**

01. කිසියම් රටක් ආර්ථික සංවර්ධනයක් අත්කරගෙන ඇතැයි පෙන්නුම් කරන්නේ,

(1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාමක් තුළින්

(2) ගෙවුම් ශේෂ යහපත් වීමක් තුළින්

(3) පුරවැසියන්ගේ ජීවන තත්ත්වය උසස් වීමක් තුළින්

(4) අයවැය අතිරික්තයක් තුළින්

02. ආර්ථික වර්ධනය මැනීම සඳහා යොදා ගැනෙන වඩා පොදු මිනුම කවරක් ද?

(1) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.

(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.

(3) නාමික ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.

(4) ප්‍රතිශතාත්මක වැය කළ හැකි ජාතික ආදායමේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි

03. කල්පිත ආර්ථිකයක නාමික දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතය 12% කින්ද උද්ධමන අනුපාත 4% කින් ද වැඩි වේ. යැයි සිතන්න. එවිට මූර්ත දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතයේ වැඩි වීම.

(1) 5%

(2) 8%

(3) 20%

(4) 12%

04. තිරසාර සංවර්ධනයේ ප්‍රධාන පැතිකඩ වන්නේ,

(1) ආර්ථික, සමාජීය, පාරිසරික

(2) ආර්ථික, දේශපාලනික, සමාජීය

(3) ආර්ථික, සමාජීය, සංස්කෘතික

(4) ආර්ථික, දේශපාලනික, තාක්ෂණික

05. මානව සංවර්ධන දර්ශකයෙහි සංරචකයන් වන්නේ,

(1) වසර 18 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළ ජනගහනය

(2) දෛනික කැලරි අවශ්‍යතාව

(3) උපතේදී ආයු අපේක්ෂාව

(4) වැඩිහිටි සාක්ෂරතාව

06. ආර්ථික වෘද්ධියෙන් සාමාන්‍යයෙන් මනිනු ලබනුයේ පහත සඳහන් විචල්‍යයක වාර්ෂික වෙනස්වීම් ඇසුරින් එම විචල්‍ය වනුයේ,

(1) පාරිභෝගික මිල දර්ශකය

(2) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය

(3) නිෂ්පාදන කර්මාන්ත අංශයේ නිමවුම

(4) පාරිභෝජන නිමවුම

07. ආර්ථික වෘද්ධිය හටගනුයේ,

(1) සමාහාර ඉල්ලුම වැඩි වූ විටය.

(2) උද්ධමන අනුපාතිකය ඉහළ ගිය විට ය.

(3) සේවා නියුක්තිය වැඩි වූ විට ය.

(4) නිෂ්පාදන ධාරිතාව වැඩඩි වූ විටය.

08. කිසියම් වර්ෂයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් 2200 ක් වූ අතර ඊට පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. 2000 ක් වූයේ නම් ආර්ථික වර්ධන අනුපාතය වනුයේ,

(1) 5%

(2) 10%

(3) 15%

(4) 20%

09. ආර්ථික වෘද්ධියේ අවාසියක් නොවන්නේ,

(1) පාරිසරික ගැටලලු ඇති වීම

(2) ජීවන තත්ත්වය ඉහළ යාම

(3) ආදායම් විෂමතා හටගැනීම

(4) ප්‍රාදේශීය විෂමතා ඇති වීම.

10. ආර්ථික වෘද්ධියත් සමග ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථිකයේ සිදු විය යුතු ගුණාත්මක වෙනස්කමක් නොවන්නේ,

(1) නිෂ්පාදන ශිල්ප ක්‍රම හා තාක්ෂණය උසස් වීම

(2) කාර්මීකරණය වේගවත් වීම

(3) ආදායම සාධාරණව බෙදී යාම

(4) නිෂ්පාදන සම්පත් වල ඵලදායකත්වය ඉහළ යාම

11. ආර්ථික වර්ධනය යනුවෙන් අදහස් විනේ කුමක් ද? එය ගණනය කරන ආකාරය දක්වන්න.

12. ආර්ථික වර්ධනයේ ඇති වාසි සහ අවාසි මොනවාද?

13. තිරසාර සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

14. ප්‍රතිශීර්ෂ ආදායම් පදනම් කොටගෙන ලෝක බැංකුව විසින් එක් එක් රටවල් වර්ගීකරණය කර ඇති ආකාරය දක්වන්න.

15. මානව සංවර්ධනය මැනීම සඳහා යොදා ගනු ලබන ප්‍රධාන සංරචක මොනවාද?

## 2020 ජුලි

05.

(b) කෝවිඩ්-19 (COVID-19) වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති වූ ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

## 2021 ජනවාරි

**1.10** 2019 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වූයේ:

(1) 6%. (2) 2.3%. (3) 3.2%. (4) 4.8%.

## 2020 ජනවාරි

**1.9** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වනුයේ:

(1) ඇමරිකානු ඩොලර් 3,924 කි. (2) ඇමරිකානු ඩොලර් 4,102 කි.

(3) ඇමරිකානු ඩොලර් 3,800 කි. (4) ඇමරිකානු ඩොලර් 4,200 කි.

06.

(C) ආර්ථික සංවර්ධනය (Economic Development) සහ තිරසාර සංවර්ධනය (Sustainable Development) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

## 2019 ජුලි

**1.6** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය වූයේ:

(1) 4.4% කි. (2) 6% කි. (3) 3.2% කි. (4) 4.8% කි.

**1.20** රටක ව්‍යුහමය වෙනස සඳහා උපකාර කෙරෙන තීරණාත්මක සාධකයක් වන්නේ …………………… *[තාක්ෂණික සංවර්ධනයයි (Technological development) / උද්ධමනයයි (Inflation)]*.

## 2018 ජුලි

**1.20** භාණ්ඩ සහ සේවා නිෂ්පාදනයේ වැඩිවීමත් සමඟ මුළු සමාජ පද්ධතියේම සිදුවන සමස්ත දියුණුව හඳුන්වනු ලබන්නේ …………………… *(ආර්ථික වර්ධනය / ආර්ථික සංවර්ධනය)* ලෙසයි.

## 2019 ජනවාරි

**1.9** 2017 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූයේ:

(1) ඇමරිකානු ඩොලර් ($) 4,200 කි.
(2) ඇමරිකානු ඩොලර් ($) 3,924 කි.
(3) ඇමරිකානු ඩොලර් ($) 3,700 කි.
(4) ඇමරිකානු ඩොලර් ($) 4,065 කි.

06.

(C) පහත දැක්වෙන පද දෙක **පැහැදිලි කරන්න**:

(a) ආර්ථික වර්ධනය.

(b) ආර්ථික සංවර්ධනය.